# දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

## මහා සභා රැස්වීම් වාර්තාව - 2022 ජූලි

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2022.07.12 වෙනි දින පෙ:ව: 09.30 ට දෙහිඕවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ වූ 2022 ජූලි මස මහා සභා රැස්වීමේ වාර්තාව.

සහභාගිත්වය:

1. ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා - ගරු සභාපති
2. ආර්.ඒ.විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා - ගරු උප සභාපති
3. ඩබ්.අබේසේන මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
4. ඩී.එස්.එම්.නිමල් මැතිතුමා. - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
5. යූ.ජී.සරත් විජේසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
6. එම්.ටී.ආර්.ලක්මාල් සමරරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
7. එච්.අමරාවති මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී
8. ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
9. කේ.නිශාන් මැතිතුමා. - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. පී.ඊ.ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
11. අතුල ජයසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
12. කේ.ඩී.එන්.ප්‍රියන්ති මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී
13. පී.වී.එන්.සඳමාලි විජේරත්න මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී
14. දිස්නා කුමාරි වීරක්කොඩි මැතිණිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී
15. කේ.විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
16. යශෝධ ලලංග පද්මසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
17. යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
18. ජේ.ඩී.තුෂාර අමරසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
19. යූ.සුධර්මා ලක්මාලි විජේසේකර මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී
20. අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
21. සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
22. වික්ටර් බණ්ඩාර මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
23. එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
24. ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
25. පී.කේ.නිමල් රාජපක්ෂ මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
26. එම්.වි.සුගත් මාධව මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
27. ආර්.පි.ශ්‍රියානි ජයකොඩි මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී
28. රනිල් චන්ද්‍ර කුමාර විජේසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
29. එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
30. කේ.ජී.ඒ.කේ.සුමනදාස මැතිණිය -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
31. බී.ඒ.නීතා බාලසූරිය මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී
32. ඩී.ජී.එච්.සී.කේ. පියරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
33. එච්.ඒ.කේ.එන්.ජයවිර මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී

නොපැමිණි:

01. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා

කාර්යාල නිලධාරීන්:

I  ආර්.ඩී.නලින් පුෂ්පකුමාර මහතා - ලේකම්
II. ඩී.එම්.එන්.එන්. දිසානායක මිය - සංවර්ධන නිලධාරී.
III එම්.ජී.ආර්.සී.ජී.විජේරත්න මිය - සංවර්ධන නිලධාරී.

සභාවට පැමිණි සියලු දෙනා ආගම සිහිකිරීම, රණ විරුවන් සිහිකිරීම හා පළාත් පාලන ගීතය ගායනා කිරීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) 2022.06.07 දින පැවැත් වූ මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම:**

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2022.06.07 වෙනි දින පවත් වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සියලුම මන්ත්‍රීවරුන් වෙත ලබා දී ඇති බවත් එම වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත්,එසේ නොමැතිනම් එම මහා සභා වාර්තාව සභා සම්මත කරන ලෙසත් දන්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා:**

2022.06.07 වෙනි දින පැවති මහා සභා රැසවීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බව ප්‍රකාශ කර සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා:**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022.06.07 වෙනි දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත විය.

**(ආ) ගරු සභාපතිතුමාගේ නිවේදන: නැත**

**(ඇ)** ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා නිවේදන සභාවට ඉදිරිපත් කිරීම :

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

- පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් මහජන නියෝජිතවරුන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා නොදුන් මන්ත්‍රීවරුන්ට ඒවා 2022.07.25 වෙනි දිනට පෙර ලබා දෙන ලෙස දන්වා යොමු කරන ලද සබරගමුව පළාත් පළාන කොමසාරිස්ගේ CLG/AD/1/3/8IY 2022.06.30 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

- කම්බි අඩිය පාලමේ පැති බැම්ම ඉදි කිරීම සඳහා අවශ්‍ය මූල්‍යමය දායකත්වය ඉල්ලා මෙම සභාව මඟින් යොමු කරන ලද ලිපියට අදාලව මුදල් ප්‍රතිපාදන ලැබෙන ආකාරය අනුව ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී සලකා බැලීමට කටයුතු කරන බව දන්වා යොමු කරන ලද ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

- මාර්ග සංවර්ධන අධිකාරියේ රුවන්වැල්ල විධායක ඉංජිනේරු කාර්යාලය රුවන්වැල්ල කහටගස්තැන්න ප්‍රදේශයට නැවත රැගෙන ආ බව දන්වා මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු විසින් යොමු කරන ලද ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

**(ඈ)** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න: - නැත.

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා:**

**01.(i) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාවේ පොදු කාර්යන් සඳහා වූ වියදම් වෙනුවෙන් ඇමුණුම 01 හි දැක්වෙන 2022.06.21 වෙනි දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව පිළිගැනීමට හා එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඇමුණුම: 02

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

<u>මුදල් හා ප්‍රතිපත්ති කමිටු කාරක සභා වාර්තාව</u>

**දිනය:-**2022.06.21 **වේලාව :- පෙ:ව:** 09.30

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් හා පහත නම් සඳහන් අනෙකුත් සමාජික ගරු මන්ත්‍රී තුමන්ලාගේ සහභාගිත්වයෙන් පැවැති මුදල් හා ප්‍රතිපත්ති කමිටු කාරක සභාවේ වාර්තාවයි.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා | ගරු සභාපති |
| 02 | විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා | ගරු උප සභාපති |
| 03 | ඩබ්.අබේසේන මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 04 | සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 05 | අමිල කන්දෙආරච්චි මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 06 | එම්.එම්.ෆර්හාන් මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 07 | ලක්මාල් සමරරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 08 | විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 09 | සුධර්මා ලක්මාලි මැතිණිය | ගරු මන්ත්‍රිනී |

**මුදල් හා ප්‍රතිපත්ති කමිටු කාරක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් වූ බිල්පත්:-**

| අනු අංකය | විස්තරය | මුදල | බිල්පත් අංකය දිනය | ආයතනය |
|---|---|---|---|---|
| 01 | අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 70326 (66) දරණ නඩුව සඳහා 2022.05.17 හා 2022.05.31 දෙදින පෙනී සිටීම වෙනුවෙන් වූ ගාස්තු ගෙවීම | රු.20,000.00 | - | නීතිඥ විජය නන්ද පත්මසිරි මහතා |

**කාරක සභාව වෙත ඉදිරිපත් වූ යෝජනා :**

I. තල්දූව සතිපොලේ විටින් විට සිදු වන භාණ්ඩ සොරා ගැනීම් ආදිය හේතුවෙන් එහි ආරක්ෂාව සඳහා ආරක්ෂිත කැමරා ඇතුළු සවි කිරීමේ උපාංග මිලදී ගැනීම සඳහා කාර්මික නිලධාරී විසින් නිර්දේශ කරන ලද උපකරණ හා භාණ්ඩ සහිත ලේඛනයක් කාරක සභාවේ අනුමැතිය සඳහා යොමු කර තිබුණි.

**තීරණය:**

රට තුළ පවතින මූල්‍ය අර්බුදය හේතුවෙන් වියදම් සීමා කිරීමට උපදෙස් දී චක්‍රලේඛන පවා නිකුත් කර ඇති අවස්ථාවක අමතර වියදම් සීමා කිරීම සිදු කළ යුතු බැවින් ආරක්ෂිත කැමරා සහ ප්ලෑෂ් ලයිට් සවි කිරීම සිදු නොකර සති පොළ අභ්‍යන්තරය ආලෝකකරණය සඳහා වීථි පහන් සවි කර ඒවා දැල්වීමටත්, බාහිර පුද්ගලයින් ඇතුළු වීම වැලැක්වීමට ගේට්ටු දැමීම සඳහා අවශ්‍ය උපකරණ පමණක් මිලදී ගැනීම සුදුසු බවට කාරක සභාව විසින් තීරණය කරන ලදී.

II.

කාර්යාලයේ මුදල් අයකැමි යටතේ පවතින සුළු මුදල් අග්‍රිමය වන රු. 1000.00 ක මුදල මේ වන විට පවතින වියදම් යටතේ ප්‍රමාණවත් නොවන බැවින් එම මුදල රු. 5000.00 දක්වා වැඩි කිරීමට හා එම සුළු මුදල් අග්‍රිමයෙන් වරකට නිකුත් කළ හැකි රු. 100.00 ක් වූ බිල් පත් වටිනාකම් මුදල රු.500 දක්වා වැඩි කිරීමටත් අවසර ඉල්ලා මුදල් අයකැමි විසින් ඉදිරිපත් කරන ලද ලිපිය කාරක සභාව වෙත යොමු කර තිබුණි.

**තීරණය:**

මහා සභා අනුමැතියක් ලබා ගැනීමේ තීරණයට යටත්ව අදාල කාර්ය සිදු කිරීම සඳහා කාරක සභා අනුමැතිය ලබා දෙන ලදී.

III. කෑගල්ල දිස්ත්‍රික් රියදුරු පාසල් හිමියන්ගේ සංගමය විසින් 2021.02.05 දින ඉදිරිපත් කරන ලද ලිපිය සැලකිල්ලට ගනිමින් තාවකාලිකව ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනය රියදුරු පුහුණු කටයුතු සඳහා ලබා දී ඇත. නමුත් ඒ සඳහා මේ වනතෙක් කිසිදු ගෙවීමක් සිදු කර නොමැති බවත් එම පුහුණු කටයුතු දිගින් දිගටම සිදු කරන බැවින් ඒ සඳහා පුහුණු වන දිනයක් සඳහා රු.1000.00 ක මුදලක් අය කර එම කාර්ය සඳහා ක්‍රීඩාංගනය ලබා දීමට අවසර ඉල්ලා විෂය නිලධාරී විසින් කාරක සභාව වෙත ලිපියක් ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

මහා සභා අනුමැතියට ලබා ගෙන පුහුණු කටයුතු පැවැත්වෙන දිනයකට රු.1000.00 මුදලක් ගෙවා අදාල පුහුණු කටයුතු සිදු කරගෙන යා හැකි බවට අදාල සංගමයට ලිඛිතව දන්වා යැවීම සුදුසු බව තීරණය කරන ලදී.

**iv**. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2022 ප්‍රකාරව විදුලිය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම සඳහා සූර්ය පැනල පද්ධතියක් සවි කිරීමට අදහස් කර ඇති බවත් ඒ සඳහා සුනිත්‍ය බල ශක්ති අධිකාරිය යටතේ ලියාපදිංචි වී ඇති සහ දැනට ව්‍යාපෘති සඳහා සේවා සපයන සක්‍රිය සමාගම් කීපයක් සම්බන්ධයෙන් තොරතුරු විෂය නිලදාරී විසින් කාරක සභාව වෙත යොමු කර තිබූ අතර ඒ අතරින් මිල ගණන් කැඳවීම සඳහා සමාගම් කීපයක් තෝරා ගැනීමට අවසර ඉල්ලා විෂය නිලධාරී විසින් ලිපියක් කාරක සභාව වෙත යොමු කර තිබුණි.

**තීරණය:**

අදාල සමාගම් වල ගාස්තු සම්බන්ධයෙන් පූර්ව විමර්ශනයක් සිදු කර මිල ගණන් කැඳවීම සිදු කිරීම සුදුසු බව කාරක සභාව තීරණය කරන ලදී.

**v.** දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ප්‍රිමික්ස් අංගනයේ අවශ්‍යතාවය සඳහා 8x4x12 mm ප්ලේට් 01 ක ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම් සිදු කර අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද දෙහිඕවිට නිපොන් හාඩ්වෙයාර් ආයතනයෙන් එය ලබා ගැනීම සඳහා 2022.05.26 දින පැවති ප්‍රසම්පාදන කාරක සභාවෙන් අනුමැතිය ලබා දී ඇත. ඒ සඳහා වන මුදල රු. 234,000.00 ක් බැවින් අදාල මිලදී ගැනීම සිදු කිරීම සඳහා කාරක සභාවේ අනුමැතිය ඉල්ලා විසය නිලධාරී විසින් ලිපියක් යොමු කර තිබුණි.

**තීරණය:**

අදාල මිලදී ගැනීම සිදු කිරීම සඳහා කාරක සභා අනුමැතිය ලබා දෙන ලදී.

**vi**. නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මගින් පාලනය වන නාගරික සංවර්ධන අධිකාරියේ කෑගල්ල දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂක (සැලසුම්) විසින් පළාත් පාලන ආයතතන වල සැලසුම් කමිටු සාමාජිකයන්ට ගෙවනු ලබන දීමනාව සංශෝධනය කර ඇති බවත් එය රු.1500.00 සිට 2500.00 දක්වා ගෙවීමට හැකියාව ඇති බවත් දන්වා ඇති බැවින් ඒ අනුව දෙහිඕවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ගොඩනැඟිලි, ඉඩම් කට්ටි සැලසුම් අනුමත කිරීමේ කාර්ය සිදු කරනු සැලසුම් කමිටුව සඳහා සහභාගී වන නිලධාරීන්ට කමිටු දීමනාව වැඩි කිරීම සඳහා අනුමැතිය ඉල්ලා විෂය නිලධාරී විසින් අදාල ලිපිය කාරක සභාව වෙත යොමු කර තිබුණි.

**තීරණය:**

මහා සභා අනුමැතිය ලබා ගැනීමේ තීරණයට යටත්ව සැලසුම් කමිටුව සඳහා සහභාගී වන නිලධාරීන්ට කමිටු දීමනාව ලෙස රු.1500.00 ක මුදලක් ගෙවීම සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

**vii**. දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සේවය කර 2007 වර්ෂයේ විශ්‍රාම ගිය පුස්තකාල සහයක බී.කේ.සුමනදාස මහතා සේවය කළ පනාවල මහජන පුස්තකාලයේ ඌන ග්‍රන්ථ 30ක් සඳහා රු.3467.50 ක වටිනාකම් වර්ෂ ගණනාවක සිට මෙතෙක් අය කර ගැනීමට නොහැකි වී ඇත. ඒ අනුව 2020, 2021 වර්ෂ වල භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ මගින් මෙම පොත් ලැයිස්තුව පරිග්‍රහන ලේඛනයෙන් කපා හැරිමට නිර්දේශ කර ඇති බවත් මෙම වර්ෂයේදී මෙම පොත් සඳහා අයවිය යුතු ගාස්තු සාමාජිකයින් , ඇපකරුවන් මගින් අය කර ගැනීමට ලිපි මගින් දැනුම් දුන්නද අය කර ගැනීමට නොහැකි වූ අතර බී.කේ.සුමනදාස මහතාටද මෙම පොත් සඳහා ගෙවිම් සිදු කරන ලෙස දැනුම් දුන්නද ඔහු විශ්‍රාම ගත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂන නිර්දේශ මත පොත් සඳහා ගෙවීම් සිදු කර ඇති බැවින් ඉදිරියටත් ගෙවීම් සිදු නොකරන බව දන්වා ඇති බැවින් පොත් ලැයිස්තුව 2007 වර්ෂයෙන් පසුව හඳුනාගත ග්‍රන්ථ බැවින් පහත දක්වා ඇති එම ග්‍රන්ථ පරිග්‍රහන ලේඛනයෙන් කපා ඉවත් කිරීමට අවසර ඉල්ලා විෂය නිලධාරී විසින් කාරක සභාව වෙත ලිපියක් ඉදිරිපත් කර තිබුණි.

| අනු අංකය | පරිග්‍රහන අංකය | පොතේ නම | මිල (රු) |
|---|---|---|---|
| 01 | 4227 | පෙම් පුවතක් | 125.00 |
| 02 | 4853 | නිසංසලා සහ විශාකා | 320.00 |
| 03 | 3063 | සිංහල රචනා සංග්‍රහය | 50.00 |
| 04 | 4966 | සඳ හිරු තරු | 270.00 |
| 05 | 3244 | පැරීසියේ කතාවක් | 119.00 |

| | | | |
|---|---|---|---|
| 06 | 3737 | ජුලියස් සීසර් | 58.50 |
| 07 | 3237 | සඳ ඇති රැයක් | 169.00 |
| 08 | 4290 | විස්මිත විශ්වය මැදින් | 150.00 |
| 09 | 3341 | වලගම්බා රජ්ජුරුවෝ | 32.50 |
| 10 | 4279 | වනයට ගිය දැවැන්තයා | 45.00 |
| 11 | 4288 | පුංචි ගොපල්ලා | 40.00 |
| 12 | 3655 | මංගල පෝරුව | 150.00 |
| 13 | 3621 | පිණ පෑදුන දා | 60.00 |
| 14 | 4183 | ඉගිල්ලුන පාත්තයා | 50.00 |
| 15 | 3417 | සිංහල ව්‍යාකරණය | 90.00 |
| 16 | 3547 | බැටරි කාර්මික විද්‍යාව | 100.00 |
| 17 | 4379 | මුතු වරුෂා | 180.00 |
| 18 | 4196 | නයි නටවන්නා | 40.00 |
| 19 | 3568 | සරල සමාජ විද්‍යාව | 90.00 |
| 20 | 3188 | සිත් පහන් වී | 118.00 |
| 21 | 4208 | සුනඛ ශාපය හෙවත් ෂර්ලොක්හෝම්ස් | 190.00 |
| 22 | 3322 | මඟුල් ගෙදර බත් නැතෝ | 30.00 |
| 23 | 328 | සුදු වැද්දා | 140.00 |
| 24 | 3689 | සක්වල දඩයම | 90.00 |
| 25 | 3960 | කෝරල් දූපත | 80.00 |
| 26 | 3422 | එදා හෙළ දිව | 198.00 |
| 27 | 4229 | අපර්ණා | 175.00 |
| 28 | 4023 | වන්නි පුරාණය | 130.00 |
| 29 | 3964 | ගලිවරය | 58.50 |
| 30 | 4479 | ටොම් බවුන් | 119.00 |
| | | **එකතුව** | **3467.50** |

**තීරණය:**

මහා සභා අනුමැතිය ලබාගෙන අදාල ග්‍රන්ථ පරිග්‍රහන ලේඛනයෙන් කපා ඉවත් කිරීමට සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

**viii** . දෙහිඔිට ප්‍රාදේශීය සභාව සතු මාගම්මන කනත්ත භූමියේ තිබෙන උස උඩි 50ක් හා වට අඩි ප්‍රමාණය 06.0 ක් වන කොස් ගස් දෙකක් අජීවී තත්වයට පත්ව ඇති අතර එම ගස් දෙක යාබද ඉඩමේ පිහිටි පී.කේ.තිලකසිරි මහතාගේ ලී මෝලට අනතුරුදායක තත්වයේ පවතින බැවින් එම ගස් සඳහා ගත යුතු ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් උපදෙස් ඉල්ලා විසය නිලධාරි විසින් කාරක සභාව වෙත ලිපියක් යොමු කර තිබුණි

**තීරණය:**

මහා සභා අනුමැතියක් ලබා ගෙන එම කොස් ගස් දෙක ප්‍රසිද්ධ වෙන්දේසියේ වෙන්දේසි කිරීම සුදුසු බව තීරණය කරන ලදී.

**Ix. 01 (v) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ශ්‍රී සුසිලෝදය පිරිවෙන් විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමින් වහන්සේ හා තරුණ එකමුතුව විසින් සංවිධානය කරනු ලබන පිංකම් මාලාව සඳහා පොසොන් තොරණ වෙනුවෙන් රු.50,000.00 ක දායකත්ව

මුදලක් ප්‍රාදේශීය සභාවෙන් ලබා දෙන ලෙස ඉල්ලා විහාරාධිපති ස්වාමීන්වහන්සේ සහ තරුණ එකමුතුව විසින් යොමු කරන ලද ලිපිය කාරක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

වසර 04 කට පසුව ප්‍රදේශයේ ජනතාවගේ ආගමික ප්‍රබෝධය වෙනුවෙන් සංවිධානය කරනු ලබන පොදු ආගමික උත්සවයක් නිසා සහ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 (xviii) වගන්තිය මඟින් දහම් පාසල් හා සාසනාරක්ෂක බල මණ්ඩල පවත්වාගෙන යාම සහ සංස්කෘතික කටයුත්තක් සඳහා වියදම් දැරීම සඳහා බලය ලබා දී ඇති බැවින් මහා සභා අනුමැතියක් ලබා ගෙන ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගෙන අදාල ගෙවීම් සිදු කිරීම සුදුසු බවට කාරක සභාව විසින් තීරණය කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(ii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාවේ පොදු කාර්යන් සඳහා වූ වියදම් වෙනුවෙන් ඇමුණුම 02 හි දැක්වෙන 2022 ජූනි මාසයේ මාසික වියදම් සඳහා ගෙවීම් අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඇමුණුම 02

**දෙහිඕවිට ප්‍රාදේශීය සභාව**

**2022 ජූනි මස 30 වන දින තෙක් ගෙවීම් වවුචර්පත්**

| දිනය | වවුචර්පත් අංකය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|
| ජූනි:01 | 947 | කෑගල්ල ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>ඊ/ආදාහනාගාරයට ගෑස් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 73,576.00 |
| ජූනි:01 | 948 | මු.හා.ක-ජනක රත්නායක<br>ගමන් වියදම් ගෙවීම. | 700.00 |
| ජූනි:01 | 949 | මු.හා.ක-ඩබ්.ඩී.එස්.සී.රණසිංහ<br>ගමන් වියදම් ගෙවීම. | 700.00 |
| ජූනි:01 | 950 | මු.හා.ක-කේ.ජී.කේ.තිලකරත්න<br>2022 හා 2023 වර්ෂයන්ට අදාලව නව වරිපනම් ලේඛන ලිවීම වෙනුවෙන් දීමනා ගෙවීම. | 5,118.00 |
| ජූනි:01 | 951 | මු.හා.ක-එම්.එල්.ටී.එන්.මුණසිංහ<br>2022 හා 2023 වර්ෂයන්ට අදාලව නව වරිපනම් ලේඛන ලිවීම වෙනුවෙන් දීමනා ගෙවීම. | 5,034.00 |
| ජූනි:01 | 952 | මු.හා.ක-බී.ඩී.ටී.ටී.ප්‍රේමරත්න<br>2022 වර්ෂයට අදාල තක්සේරු නිවේදන බෙදාහැරීම වෙනුවෙන් දීමනා ගෙවීම. | 9,824.00 |
| ජූනි:01 | 953 | මු.හා.ක-එන්.ජී.ආර්.ටී.ගුණරත්න<br>2022 වර්ෂයට අදාල තක්සේරු නිවේදන බෙදාහැරීම වෙනුවෙන් දීමනා ගෙවීම. | 6,408.00 |

| | | | |
|---|---|---|---|
| ජූනි:01 | 954 | මු.හා.ක-එස්.පී.තිලකරත්න<br>2022 වර්ෂයට අදාල තක්සේරු නිවේදන බෙදාහැරීම වෙනුවෙන් දීමනා ගෙවීම. | 11,768.00 |
| ජූනි:01 | 955 | මු.හා.ක-ර්.කේ.එච්.කේ.පියසේන<br>2022 වර්ෂයට අදාල තක්සේරු නිවේදන බෙදාහැරීම වෙනුවෙන් දීමනා ගෙවීම. | 8,496.00 |
| ජූනි:01 | 956 | මු.හා.ක-එච්.පී.පී.සමන් කුමාර<br>2022 මැයි මස අතිකාල ගෙවීම. | 12,095.00 |
| ජූනි:01 | 957 | මු.හා.ක-එච්.ජී.දේශප්‍රිය<br>2022 මැයි මස අතිකාල ගෙවීම. | 11,533.00 |
| ජූනි:02 | 958 | මු.හා.ක-ආර්.ඩී.නලීන් පුෂ්පකුමාර<br>නිවාඩු දින සේවයෙහි දීමනා ගෙවීම. | 13,501.25 |
| ජූනි:06 | 959 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 ජූනි මස දෙ/ප්‍රා/සභාවේ සභික දීමනා ගෙවීම. | 787,000.00 |
| ජූනි:06 | 960 | අයි.ටී.විජේතුංග<br>දෙ/ප්‍රා/සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු කාර්මික නිලධාරී මයාට 2022 මැයි මස දීමනා ලබා දීම. | 38,199.00 |
| ජූනි:06 | 961 | එම්.එස්.එම්.චන්ද්‍රපාල<br>ගමන් වියදම් ලබා දීම. | 1,748.80 |
| ජූනි:06 | 962 | විමල් ඇග්රෝ ට්‍රැක්ටර්ස් ප්‍රයිවට් ලිමිටඞ්<br>RE2258 දරණ ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 100,910.00 |
| ජූනි:06 | 963 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 7905151905 දරණ තල්දූව සතිපොළේ 2022/03/19-2022/05/23 දක්වා බිල්පත ගෙවීම. | 30,116.45 |
| ජූනි:06 | 964 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 6321102601 දරණ පනාවල පෙර පාසැල් ගොඩනැගිල්ලේ 2022/04/01-2022/05/07 දක්වා බිල්පත ගෙවීම. | 276.60 |
| ජූනි:06 | 965 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි. අ.7991368912 දරණ මාගම්මන ආයුර්වේදයේ 2022/04/17 සිට 2022/05/21 දක්වා බිල්පත ගෙවීම. | 953.70 |
| ජූනි:06 | 966 | මු.හා.ක-එච්.පී.පී.සමන් කුමාර<br>ගමන් වියදම් ගෙවීම. | 4,200.00 |
| ජූනි:06 | 967 | මු.හා.ක-ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද<br>ගමන් වියදම් ගෙවීම. | 6,500.00 |
| ජූනි:06 | 968 | මු.හා.ක-ඒ.බී.හේමචන්ද්‍ර<br>දිගලවත්ත කසල මධ්‍යස්ථානයේ බේල් යන්ත්‍රය අලුත්වැඩියාවේදී යන්ත්‍ර කොටස් මිලදී ගැනීම වෙනුවෙන් අතින් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 36,496.00 |
| ජූනි:06 | 969 | මු.හා.ක-යූ.එල්.ජී.ජයතිලක<br>QU2004 ත්‍රීවිලරයේ බ්රේක් හිරවීම අලුත්වැඩියා කිරීම සඳහා අතින් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 1,150.00 |

| | | | |
|---|---|---|---|
| ජූනි:06 | 970 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>මුද්දර අග්‍රිමය අලුත්කිරීම. | 1,350.00 |
| ජූනි:06 | 971 | මු.හා.ක-ඩී.එම්.එන්.එන්.දිසානායක<br>2022/06/07 දින පැවැත්වීමට නියමිත මහා සභාවේ සංග්‍රහ කටයුතු සඳහා අත්තිකාරම් මුදලක් ලබා ගැනීම. | 7,000.00 |
| ජූනි:06 | 972 | මු.හා.ක-එම්.ජී.ජේ.ජනක රත්නායක<br>බොබ්කැට් යන්ත්‍රයේ වයිපරය අලුතින් දැමීම සඳහා අතින් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 1,800.00 |
| ජූනි:06 | 973 | කේ.ඩී.එල්.ධර්මසේන<br>දිගලවත්ත කසල මධ්‍යස්ථානයේ බේල් යන්ත්‍රය අලුත්වැඩියාව සඳහා කුලිය ගෙවීම. | 12,000.00 |
| ජූනි:07 | 974 | ප්‍රේමරත්න ස්ටෝර්ස් ඇන්ඩ් හාඩ්වෙයාර්<br>දිගලවත්ත කසල මධ්‍යස්ථානයේ බේල් යන්ත්‍රය සඳහා ලබාගත් කම්බි වෙනුවෙන් මුදල් ගෙවීම. | 72,790.00 |
| ජූනි:07 | 975 | සමාධි වැඩිහිටි සමිතිය-දෙහිඕවිට<br>අවිස්සාවේල්ල හැටන් අන්තර් මාර්ගයේ 8Km කණුව ස්ථානයෙන් ප්‍රවේශවීමට ඇති පිරිවෙන් මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට අවශ්‍ය අමු ද්‍රව්‍ය ලබා දීම කර්මාන්තයේ අවසන් ගෙවීම. | 130,162.50 |
| ජූනි:08 | 976 | මු.හා.ක-ඒ.බී.හේමචන්ද්‍ර<br>දිගලවත්ත කසල මධ්‍යස්ථානයේ 2022/06/08 දින පැවැත්වීමට නියමිත ශ්‍රමදාන වැඩසටහන සඳහා සංග්‍රහ වියදම් වෙනුවෙන් අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 5,000.00 |
| ජූනි:08 | 977 | මු.හා.ක-ආර්.ඒ.යූ.එන්.රණසිංහ<br>ගමන් වියදම් ගෙවීම. | 4,000.00 |
| ජූනි:08 | 978 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>ගෙවතු වගා වැඩසටහන සඳහා අවශ්‍ය වගා උපකරණ හා බීජ ලබා ගැනීම සඳහා අත්තිකාරම් ලබා ගැනීම. | 50,000.00 |
| ජූනි:08 | 979 | අල්ගොඩ සමඟි වැඩිහිටි සමිතිය<br>අල්ගොඩ රත්නගම පියවර I සංවර්ධනය කිරීම කර්මාන්තයේ 10% රැඳවුම් මුදල් ගෙවීම. | 98,278.15 |
| ජූනි:08 | 980 | එස්.කේ.ඇලුමිනියම්<br>ගරු සභාපතිතුමාගේ නිල කාමරයේ දොර වීදුරුව අලුතින් දැමීම වෙනුවෙන් බිල්පත් ගෙවීම. | 5,500.00 |
| ජූනි:09 | 981 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 මැයි මස දෙ/ප්‍රා/සභාවේ කුලී පදනම මත වැටුප් ගෙවීම. | 896,147.10 |
| ජූනි:09 | 982 | එන්.කරුණාරත්න<br>දෙ/ප්‍රා/සභා කාර්යාල පරිශ්‍රය හා පොදු වෙළඳ සංකීර්ණය පිරිසිදු කිරීම සඳහා 2022 මැයි මස මුදල් ගෙවීම. | 65,961.29 |
| ජූනි:10 | 983 | මු.හා.ක-ආර්.ඩී.නලින් පුෂ්පකුමාර<br>දෙ/ප්‍රා/සභාවේ ලේකම් ධුරයේ වැඩ බැලීමට අදාල දීමනාව ගෙවීම.(2022.05.11-2022.06.10 දක්වා) | 10,583.75 |

| | | | |
|---|---|---|---|
| ජූනි:10 | 984 | කෑගල්ල ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>ඊ/ආදාහනාගාරයට ගෑස් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 88,970.00 |
| ජූනි:15 | 985 | මෙම වැයපත අවලංගු කරන ලදී. | - |
| ජූනි:15 | 986 | කේ.එම්.එස්.ඔටෝ කෙයාර්<br>PF7369 දරණ කැබ් රථය සේවා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම.(2022 මැයි) | 34,458.00 |
| ජූනි:15 | 987 | සෙනෙක්ස් ෆයර් ප්‍රොටෙක්ෂන් (පුද්) සමාගම<br>දෙ/ප්‍රා/සභාවේ ගිනි නිවීමේ උපකරණ නැවත සේවා කිරීම හා Fire Ball ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 35,800.00 |
| ජූනි:15 | 988 | සී/ස ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම<br>දෙ/ප්‍රා/සභාවට අයත් කඩ කාමර බදු දීම වෙනුවෙන් පුවත්පත් වල පලකල දැන්වීම් වෙනුවෙන් මුදල් ගෙවීම. | 42,549.30 |
| ජූනි:16 | 989 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ඊරියගොල්ල ආදාහනාගාරයේ 036-3868934 දරණ දුරකතනයේ 2022/04/16-2022/05/15 දක්වා බිල්පත ගෙවීම. | 489.19 |
| ජූනි:16 | 990 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු:අ:-036-2262315 දරණ කාර්යාලීය දුරකථනයේ 2022/04/16-2022/05/15 දක්වා බිල්පත ගෙවීම. | 2,022.09 |
| ජූනි:16 | 991 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123538 දරණ WIFI රවුටරයේ 2022 මැයි මස බිල්පත ගෙවීම. | 815.51 |
| ජූනි:16 | 992 | සතුට ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ්<br>පූර්ව මිශ්‍රණ අංගනයේ පූර්ව මිශ්‍රණ සැකසීම සඳහා අවශ්‍ය චිප්ස් ගල් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 35,000.00 |
| ජූනි:16 | 993 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මැයි මස RD-9461 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 45,168.00 |
| ජූනි:16 | 994 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මැයි මස JCB යන්ත්‍රය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 116,790.00 |
| ජූනි:16 | 995 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මැයි මස QU2004 ත්‍රීවිලරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 9,269.00 |
| ජූනි:16 | 996 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මැයි මස PF7369 දරණ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 152,250.00 |
| ජූනි:16 | 997 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මැයි මස 250-4053 දරණ කැබ්රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 42,276.00 |
| ජූනි:16 | 998 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මැයි මස RD-8018 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 55,790.00 |

| | | | |
|---|---|---|---|
| ජූනි:16 | 999 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මාර්තු මස තණකොළ කපන මැෂිම් සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම.(සභාව/ආදාහනාගාරය) | 29,500.00 |
| ජූනි:17 | 1000 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>ZA0126 දරණ JCB යන්ත්‍රයට හෝස් බටයක් ලබා ගැනීම සඳහා අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 5,000.00 |
| ජූනි:20 | 1001 | එන්.කරුණාරත්න<br>දෙ/ප්‍රා/සභා කාර්යාල පරිශ්‍රය හා පොදු වෙළඳ සංකීර්ණය පිරිසිදු කිරීම සඳහා 2022 මැයි මස ඉතිරි මුදල් ගෙවීම. | 19,238.71 |
| ජූනි:20 | 1002 | මු.හා.ක-ආර්.එම්.එච්.රත්නායක<br>මාගම්මන ආයුර්වේදයේ හා මහජන පුස්තකාලයේ පවත්වන ශ්‍රමදානය සඳහා අත්තිකාරම් ලබා ගැනීම. | 3,500.00 |
| ජූනි:20 | 1003 | මු.හා.ක-ආර්.ඩී.සී.කරුණාරත්න - 2022 මැයි මස අතිකාල ගෙවීම. | 4,078.00 |
| ජූනි:20 | 1004 | මු.හා.ක-එච්.ආර්.කේ.ජයවර්ධන - 2022 මැයි මස අතිකාල ගෙවීම. | 8,166.00 |
| ජූනි:20 | 1005 | මු.හා.ක-යූ.එල්.ජී.ජයතිලක - 2022 මැයි මස අතිකාල ගෙවීම. | 2,454.00 |
| ජූනි:20 | 1006 | මු.හා.ක-එච්.එම්.එස්.නන්දකුමාර - 2022 මැයි මස අතිකාල ගෙවීම. | 6,785.00 |
| ජූනි:20 | 1007 | මු.හා.ක-එම්.ආර්.පී.කුමාරසිරි - 2022 මැයි මස අතිකාල ගෙවීම. | 8,666.00 |
| ජූනි:20 | 1008 | මු.හා.ක-අයි.ඩී.ඩබ්.එස්.කුමාර - 2022 මැයි මස අතිකාල ගෙවීම. | 5,015.00 |
| ජූනි:20 | 1009 | මු.හා.ක-ඩබ්.ඒ.ඩී.කොඩිකාර - 2022 මැයි මස අතිකාල ගෙවීම. | 10,806.00 |
| ජූනි:20 | 1010 | මු.හා.ක-බී.පී.එන්.විජේතුංග - 2022 මැයි මස අතිකාල ගෙවීම. | 9,600.00 |
| ජූනි:20 | 1011 | මු.හා.ක-ඩී.ජී.එන්.පී.ජයසිංහ - 2022 අප්රේල් මස අතිකාල ගෙවීම. | 4,209.00 |
| ජූනි:20 | 1012 | මු.හා.ක-ඩී.ජී.එන්.පී.ජයසිංහ - 2022 මැයි මස අතිකාල ගෙවීම. | 4,959.00 |
| ජූනි:20 | 1013 | මු.හා.ක-ඩී.එල්.ආර්.එස්.කුමාර - 2022 මැයි මස අතිකාල ගෙවීම. | 7,204.00 |
| ජූනි:20 | 1014 | මු.හා.ක-එස්.පී.තිලකරත්න - 2022 මැයි මස අතිකාල ගෙවීම. | 7,124.00 |
| ජූනි:20 | 1015 | මු.හා.ක-එන්.ජී.ආර්.ටී.ගුණරත්න - 2022 මැයි මස අතිකාල ගෙවීම. | 4,208.00 |
| ජූනි:20 | 1016 | මු.හා.ක-පී.ජී.සෙනවිරත්න - 2022 මැයි මස අතිකාල ගෙවීම. | 11,250.00 |
| ජූනි:20 | 1017 | මු.හා.ක-ආර්.ජී.එස්.ඩී.රොෂාන්ත - 2022 මැයි මස අතිකාල ගෙවීම. | 10,416.00 |
| ජූනි:22 | 1018 | කේ.ජී.සී.වෙරෝනිකා ගමඇතිගේ<br>2022 අප්‍රේල් හා මැයි මාස සඳහා පෙර පාසැල් දීමනා ලබා දීම. | 26,000.00 |
| ජූනි:22 | 1019 | ගුරුගල්ල එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය<br>දුම්බරකන්ද මාර්ගය සංවර්ධනය කිරීම අදියර 01 කර්මාන්තයේ 10% රඳවුම් මුදල් ගෙවීම. | 96,162.36 |
| ජූනි:23 | 1020 | මු.හා.ක-එම්.එල්.ඒ.කුමාර - 2022 මැයි මස අතිකාල ගෙවීම. | 2,020.00 |
| ජූනි:23 | 1021 | මු.හා.ක-ආර්.ඒ.යූ.එන්.රණසිංහ<br>නිවාඩු දින සේවයෙහි වැටුප් ගෙවීම. | 9,572.00 |
| ජූනි:23 | 1022 | මු.හා.ක-ආර්.ජී.එස්.එස්.වික්‍රමාරච්චි - ගමන් වියදම් ගෙවීම. | 5,200.00 |

| | | | |
|---|---|---|---|
| ජූනි:23 | 1023 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>2022 වර්ෂයට නිල ඇඳුම් දීමනාව හිමි නිලධාරීන් හට මුදල් ගෙවීම. | 24,000.00 |
| ජූනි:23 | 1024 | මු.හා.ක-ආර්.එම්.එච්.රත්නායක - ගමන් වියදම් ගෙවීම. | 1,600.00 |
| ජූනි:23 | 1025 | මු.හා.ක-ආර්.ඩබ්.එම්.ඊ.කේ.චන්ද්‍රවීර - ගමන් වියදම් ගෙවීම. | 1,600.00 |
| ජූනි:23 | 1026 | මු.හා.ක-බී.ඩී.ටී.ටී.ප්‍රේමරත්න - ගමන් වියදම් ගෙවීම. | 3,500.00 |
| ජූනි:23 | 1027 | මු.හා.ක-එච්.ඒ.රංගන තිලකරත්න - ගමන් වියදම් ගෙවීම. | 1,260.00 |
| ජූනි:23 | 1028 | මු.හා.ක-කේ.ඩී.එන්.ප්‍රියන්ති<br>2022 මැයි මස ඉන්ධන හා දුරකතන දීමනාව ලබාදීම. | 8,000.00 |
| ජූනි:23 | 1029 | මු.හා.ක-බී.ඒ.නීතා බාලසූරිය<br>2022 මැයි මස ඉන්ධන හා දුරකතන දීමනාව ලබාදීම. | 8,000.00 |
| ජූනි:23 | 1030 | මු.හා.ක-එච්.ඒ.සී.ඩබ්.හේනකආරච්චි -සංග්‍රහ වියදම් ගෙවීම. | 940.00 |
| ජූනි:23 | 1031 | TN හෝල්ඩින්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>දෙ/ප්‍රා/සභාවේ ඵලදායිතා ඒකකය සඳහා නාම පුවරුවක් සැකසීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,450.00 |
| ජූනි:23 | 1032 | ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් ප්‍රයිවට් ලිමිටඩ්<br>ටොෂිබා ඡායා පිටපත් යන්ත්‍රය වාර්ෂික සේවා කිරීමේ ගාස්තු ගෙවීම. | 17,512.91 |
| ජූනි:23 | 1033 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි. අ.6321102601 දරණ පනාවල පෙර පාසැල් නව ගොඩනැගිල්ල 2022/05/07 සිට 2022/06/06 දක්වා බිල්පත ගෙවීම. | 368.10 |
| ජූනි:23 | 1034 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:6316208308 දරන දිගලවත්ත කසල මධ්‍යස්ථානයේ 2022/05/15-2022/06/13 දක්වා බිල්පත ගෙවීම. | 2,545.80 |
| ජූනි:23 | 1035 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 7970101003 දරණ දෙ/නව ප්‍රා/සභා කාර්යාලයේ 2022 මැයි මස බිල්පත ගෙවීම. | 45,232.00 |
| ජූනි:23 | 1036 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 7921106404 දරණ දෙ/ම/පුස්තකාලයේ(E-library) 2022/05/14-2022/06/15 දක්වා බිල්පත ගෙවීම. | 1,905.30 |
| ජූනි:23 | 1037 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:7909280106 දරණ ඊරියගොල්ල ආදාහනාගාරයේ 2022/05/01-2022/06/04 දක්වා බිල්පත ගෙවීම. | 3,351.00 |
| ජූනි:23 | 1038 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 7991487016 දරණ දෙ/පැරණි සභාවේ 2022/05/04-2022/06/03 දක්වා බිල්පත ගෙවීම. | 1,813.80 |
| ජූනි:23 | 1039 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි.අ.2692684915 දරණ පනාවල මහජන පුස්තකාලයේ 2022/05/07 සිට 2022/06/06 දක්වා බිල්පත ගෙවීම. | 240.00 |

| | | | |
|---|---|---|---|
| ජූනි:23 | 1040 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි.අ.7905151905 දරණ තල්දූව සතිපොළේ 2022/05/23 සිට 2022/06/21 දක්වා බිල්පත ගෙවීම. | 13,241.65 |
| ජූනි:23 | 1041 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි.අ.6312082709 දරණ ඉඹුල්පිටිය මහජන පුස්තකාලයේ 2022/05/17 සිට 2022/06/19 දක්වා බිල්පත ගෙවීම. | 258.30 |
| ජූනි:23 | 1042 | නීතිඥ විජයනන්ද පත්මසිරි<br>නඩු අංක 70326(66) දරණ 2022/04/26 දිනැති නඩුව සඳහා පෙනී සිටීමේ ගාස්තු ගෙවීම. | 5,000.00 |
| ජූනි:23 | 1043 | නීතිඥ විජයනන්ද පත්මසිරි<br>නඩු අංක 70326(66) දරණ 2022/03/22 දිනැති නඩුව සඳහා පෙනී සිටීමේ ගාස්තු හා දිවුරුම් ප්‍රකාශ සැකසීම වෙනුවෙන් ගෙවීම. | 20,000.00 |
| ජූනි:23 | 1044 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 ජූනි මස දෙ/ප්‍රා/සභාවේ ස්ථිර සේවක වැටුප් ගෙවීම. | 3,266,588.07 |
| ජූනි:23 | 1045 | ජය රාජා විජය කුමාර්<br>ජලය ලබා ගැනීම සඳහා මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් තැන්පත් කල මුදල් ආපසු ගෙවීම. | 9,000.00 |
| ජූනි:27 | 1046 | කෑගල්ල ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>ඊ/ආදාහනාගාරයට ගෑස් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 71,176.00 |
| ජූනි:29 | 1047 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු:අ:-036-2222575 දරණ කාර්යාලීය දුරකථනයේ 2022 මැයි මස බිල්පත ගෙවීම. | 8,622.80 |
| ජූනි:29 | 1048 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු. අ.036-2222534 දරණ ගරු සභාපතිතුමාගේ කාර්යාලීය දුරකතනයේ 2022 මැයි මස බිල්පත ගෙවීම. | 7,991.37 |
| ජූනි:29 | 1049 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123537 දරණ WIFI රවුටරයේ 2022 මැයි මස බිල්පත ගෙවීම. | 845.71 |
| ජූනි:29 | 1050 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123538 දරණ WIFI රවුටරයේ 2022 මැයි මස බිල්පත ගෙවීම. | 845.71 |
| ජූනි:29 | 1051 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123539 දරණ WIFI රවුටරයේ 2022 මැයි මස බිල්පත ගෙවීම. | 845.71 |
| ජූනි:29 | 1052 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123540 දරණ WIFI රවුටරයේ 2022 මැයි මස බිල්පත ගෙවීම. | 845.71 |
| ජූනි:29 | 1053 | නිලානි පොත්හල<br>වෙසක් සැරසිලි සඳහා ලබාගත් ද්‍රව්‍ය වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,430.00 |
| ජූනි:29 | 1054 | දිලාන් ජයසිංහ ප්‍රවාහන සේවය<br>සෞඛ්‍ය කම්කරුවන් සඳහා ලබා ගැනීමට ගත් ග්ලවුස් වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,020.00 |
| ජූනි:29 | 1055 | දිලාන් ජයසිංහ ප්‍රවාහන සේවය<br>සෞඛ්‍ය කම්කරුවන් සඳහා ලබා ගැනීමට ගත් ග්ලවුස් වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,355.00 |

| | | | |
|---|---|---|---|
| ජූනි:29 | 1056 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/068/152/18 දරණ මාගම්මන ආයුර්වේදයේ 2022/04/24-2022/05/26 දක්වා බිල්පත ගෙවිම. | 379.44 |
| ජූනි:29 | 1057 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/003/001/18 දරණ දෙහිඕවිට පැරණි ප්‍රා/සභා කාර්යාලයේ 2022/05/04-2022/06/04 දක්වා බිල්පත ගෙවිම. | 3,187.53 |
| ජූනි:29 | 1058 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/073/13 දරණ දෙහිඕවිට පොදු ජල කණුවේ 2022/05/04-2022/06/04 දක්වා බිල්පත ගෙවිම. | 428.78 |
| ජූනි:29 | 1059 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/054/16 දරණ දෙහිඕවිට පොදු ජල කණුවේ 2022/05/03-2022/06/03 දක්වා බිල්පත ගෙවිම. | 3,001.07 |
| ජූනි:29 | 1060 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/003/035/18 දරණ දෙ/ පොදු ජල කණුවේ 2022/05/09-2022/06/08 දක්වා බිල්පත ගෙවිම. | 287.03 |
| ජූනි:29 | 1061 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/067/174/14 දරණ ඊ/ආදාහනාගාරයේ 2022/04/22-2022/05/23 දක්වා බිල්පත ගෙවිම. | 1,424.52 |
| ජූනි:29 | 1062 | පෝස්ට් මාස්ටර් ජනරාල්<br>තැපැල් මුද්‍රා යන්ත්‍රට ගාස්තු ඇතුලත් කිරිම. | 10,000.00 |
| ජූනි:29 | 1063 | කොලොන්න සර්විස් සෙන්ටර්<br>RD8018 ට්‍රැක්ටරය සේවා කිරිම වෙනුවෙන් මුදල් ගෙවීම. | 27,770.00 |
| ජූනි:29 | 1064 | සාමාන්‍යාධිකාරී-ලංකා විදුලි බල මණ්ඩලය<br>තල්දූව නව වෙළඳ සංකීරණයේ කඩ කාමර සඳහා විදුලිය ලබා ගැනීමට ට්‍රාන්ස්ෆෝමරයක් සවි කිරීම වෙනුවෙන් ඉතිරි මුදල් ගෙවීම. | 357,344.83 |
| ජූනි:29 | 1065 | මු.හා.ක-ජේ.ජී.ජයවර්ධන<br>ගරු සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් ධූරයේ වැඩ බැලීමේ දීමනාව ගෙවීම.(22/03/19-22/06/18 දක්වා) | 45,000.00 |
| ජූනි:29 | 1066 | මු.හා.ක-ඒ.ඩබ්.සරත් පත්මසිරි<br>තණකොල කපන මැෂිම සඳහා තල ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 500.00 |
| ජූනි:29 | 1067 | මු.හා.ක-ආර්.ඩී.ඩබ්.ජේ.විජේවර්ධන - ගමන් වියදම් ගෙවීම. | 700.00 |
| ජූනි:29 | 1068 | මු.හා.ක-කේ.ජී.පී.එල්.සෝමවීර - ගමන් වියදම් ගෙවීම. | 940.00 |
| ජූනි:29 | 1069 | මු.හා.ක-ඩබ්.ඒ.එන්.මදුමාලි<br>සංග්‍රහ වියදම් ගෙවීම. | 2,680.00 |
| ජූනි:29 | 1070 | මු.හා.ක-එම්.ඒ.ආර්.අස්රා<br>පරිගණක පරීක්ෂණය සමත්වීමේ දීමනාව ලබා දීම. | 7,000.00 |
| ජූනි:29 | 1071 | මු.හා.ක-කේ.ජී.පී.එල්.සෝමවීර<br>පරිගණක පරීක්ෂණය සමත්වීමේ දීමනාව ලබා දීම. | 7,000.00 |

| | | | |
|---|---|---|---|
| ජූනි:29 | 1072 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>දිගලවත්ත කසල මධ්‍යස්ථානයේ 2022/06/08 දින පැවැත්වීමට නියමිත ශ්‍රමදාන වැඩසටහන සඳහා සංග්‍රහ වියදම් වෙනුවෙන් ලබාගත් අත්තිකාරම් මුදල් පියවීම.(No Cash) | 4,480.00 |
| ජූනි:29 | 1073 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ගල්රෝල කුලියට ලබා දීම වෙනුවෙන් තැන්පත් කල මුදල් ආදායමට ගැනීම. | 60,000.00 |
| ජූනි:30 | 1074 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ශ්‍රවණාගාරය කුලියට ලබා දීම වෙනුවෙන් තැන්පත් කල මුදල් ආදායමට ගැනීම.(No Cash) | 6,000.00 |
| ජූනි:30 | 1075 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>ZA0126 දරණ JCB යන්ත්‍රයට හෝස් බටයක් ලබා ගැනීම සඳහා ලබාගත් අත්තිකාරම් මුදල් පියවීම.(No Cash) | 3,150.00 |
| | | | **7,573,314.89** |
| | 12 | සේවක ණය - බී.පී.එන්.විජේතුංග (ආපදා ණය අත්තිකාරම් ගෙවීම) | 150,000.00 |
| | | **එකතුව** | **7,723,314.89** |

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(iii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මඟින් පාලනය වන නාගරික සංවර්ධන අධිකාරියේ කෑගල්ල දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂක (සැලසුම්) විසින් පළාත් පාලන ආයතනන වල සැලසුම් කමිටු සාමාජිකයන්ට ගෙවනු ලබන දීමනාව සංශෝධනය කර ඇති බවත් එය රු.1500.00 සිට 2500.00 දක්වා ගෙවීමට හැකියාව ඇති බවත් දන්වා ඇත.ඒ අනුව දෙහිඕවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ගොඩනැඟිලි, ඉඩම් කට්ටි සැලසුම් අනුමත කිරීමේ කාර්ය සිදු කරනු සැලසුම් කමිටුව සඳහා සහභාගී වන නිලධාරීන්ට කමිටු දීමනාව ලෙස රු.1500.00 ක මුදලක් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී නීතා බාලසූරිය මැතිණිය විසින් ස්ථිර කරන ලදී.
යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (iv) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සතු මාගම්මන කනත්ත භූමියේ තිබෙන කොස් ගස් දෙකක් අජීවී තත්වයට පත්ව ඇති අතර එම ගස් දෙක යාබද ඉඩමේ පිහිටි පී.කේ.තිලකසිරි මහතාගේ ලී මෝලට අනතුරුදායක තත්වයේ පවතී. උස උඩි 50ක් හා වට අඩි ප්‍රමාණය 06.0 ක් වන එම කොස් ගස් දෙක ප්‍රසිද්ධ වෙන්දේසියේ වෙන්දේසි කිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (v) ගරු සභාපති ඒ.ජී.දම්මිදු ශ්‍යාමින්ද මැතිතුමා:**

ශ්‍රී සුසිලෝදය පිරිවෙන් විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ හා තරුණ එකමුතුව විසින් සංවිධානය කරනු ලබන පිංකම් මාලාව සඳහා පොසොන් තොරණ වෙනුවෙන් රු.50,000.00 ක දායකත්ව මුදලක් ඉල්ලා ඇත. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 (xviii) වගන්තිය මඟින් දහම් පාසල් හා ශාසනාරක්ෂක බල මණ්ඩල පවත්වාගෙන යාම සහ සංස්කෘතික කටයුත්තක් සඳහා වියදම් දැරීම සඳහා  බලය ලබා දී ඇති බැවින් එකී වගන්තිය යටතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන අදාල මුදල ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල ජයසිරි  මැතිතුමා  විසින් ස්ථිර කරන ලදී.
යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (vi) ගරු සභාපති ඒ.ජී.දම්මිදු ශ්‍යාමින්ද මැතිතුමා:**

" සාගිනි දුරලමු - වතු පිටි සරු කරමු" කෘෂි භෝග වගා සහ ගෙවතු වගා වැඩසටහන යටතේ පුරන් කුඹුරු අස්වැද්දීමේ ව්‍යාපෘතිය සඳහා  දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සතු RD 6541 මැසිෆගුසන් 240 වර්ගයේ ට්‍රැක්ටරය සඳහා නඟුලක් සහ මඩ වීල් දෙකක් මිලදී ගැනීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.අමරාවතී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

මෙම යෝජනාවේ සඳහන් වන්නේ සභාව සතු ට්‍රැක්ටර් රථයට පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා අවශ්‍ය උපාංග ගැනීමට බවත් එසේ වුවත් පවතින තත්වය යටතේ ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක වුවත් මේ ආකාරයේ පුරන් කුඹුරු අස්වැද්දීමේ කාර්යක් සඳහා යොමු වුවහොත් එය යම් මට්ටමක ව්‍යාකූල තත්වයක් ඇති වීමට හේතු වනු ඇති බව පවසා සිටියේය.මේ වන විට සභාව සතුව කුඹුරු නොමැති බැවින් මෙය සිදු කිරීමට වන්නේ පෞද්ගලික කුඹුරු යොදාගෙන බැවින් මේ සඳහා සකස් කර ඇති ක්‍රමවේදය කුමක්ද යන්න විමසා සිටියේය. පසු කාලීනව මේ උපකරණ කුලියට ලබා දෙනවාද නොඑසේනම් ඒවා කුමක් සඳහා යොදා ගන්නේද යන කරුණු සම්බන්ධයෙන් අවධානනය යොමු නොකර මිලදී ගැනීම් සිදු කිරීම ප්‍රායෝගිකද යන්න විමසා සිටියේය.

(ගරු මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා සහ ගරු මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 09.55)

**ගරු සභාපති ඒ.ජී.දම්මිදු ශ්‍යාමින්ද මැතිතුමා:**
මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේදී මේ සම්බන්ධයෙන් සාකච්ඡා වූ බවත් පසුව මන්ත්‍රීවරු සහභාගීකරවාගෙන සුදුසු වැඩපිළිවෙලක් කිරීමේ බලාපොරොත්තුවෙන් මේ කාර්ය සිදු කිරීමට අපේක්ෂා කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

දැනට මිලදී ගැනීම සිදු කර ඉන් පසු ක්‍රමවේදය සම්බන්ධයෙන් තීරණයක් ගනිමු යැයි පවසා සිටින ලදී.
යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (vii) ගරු සභාපති ඒ.ජී.දම්මිදු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සේවය කර 2007 වර්ෂයේ විශ්‍රාම ගිය පුස්තකාල සහයක බී.කේ.සුමනදාස මහතා සේවය කළ පනාවල මහජන  පුස්තකාලයේ ඌන ග්‍රන්ථ 30ක් සඳහා රු.3467.50 ක වටිනාකම්

වර්ෂ ගණනාවක සිට මෙතෙක් අය කර ගැනීමට නොහැකි වී ඇත. ඒ අනුව 2020, 2021 වර්ෂ වල භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ මඟින් මෙම පොත් ලැයිස්තුව පරිග්‍රහන ලේඛනයෙන් කපා හැරීමට නිර්දේශ කර ඇත. මෙම වර්ෂයේදී මෙම පොත් සඳහා අයවිය යුතු ගාස්තු සාමාජිකයින් , ඇපකරුවන් මඟින් අය කර ගැනීමට ලිපි මඟින් දැනුම් දුන්නද අය කර ගැනීමට නොහැකි වූ අතර බී.කේ.සුමනදාස මහතාටද මෙම පොත් සඳහා ගෙවීම් සිදු කරන ලෙස දන්වන ලදී. එසේ වුවත් ඔහු විශ්‍රාම ගත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂන නිර්දේශ මත පොත් සඳහා ගෙවීම් සිදු කර ඇති බැවින් ඉදිරියටත් ගෙවීම් සිදු නොකරන බව දන්වා ඇත. මෙම පොත් ලැයිස්තුව 2007 වර්ෂයෙන් පසුව හඳුනාගත ග්‍රන්ථ බැවින් පහත දක්වා ඇති එම ග්‍රන්ථ පරිග්‍රහන ලේඛනයෙන් කපා ඉවත් කිරීම සුදුසු බව යෝජනා කරමි.

| අනු අංකය | පරිග්‍රහන අංකය | පොතේ නම | මිල (රු) |
|---|---|---|---|
| 01 | 4227 | පෙම් පුවතක් | 125.00 |
| 02 | 4853 | නිසංසලා සහ විශාකා | 320.00 |
| 03 | 3063 | සිංහල රචනා සංග්‍රහය | 50.00 |
| 04 | 4966 | සඳ හිරු තරු | 270.00 |
| 05 | 3244 | පැරීසියේ කතාවක් | 119.00 |
| 06 | 3737 | ජුලියස් සීසර් | 58.50 |
| 07 | 3237 | සඳ ඇති රැයක් | 169.00 |
| 08 | 4290 | විස්මිත විශ්වය මැදින් | 150.00 |
| 09 | 3341 | වලගම්බා රජ්ජුරුවෝ | 32.50 |
| 10 | 4279 | වනයට ගිය දැවැන්තයා | 45.00 |
| 11 | 4288 | පුංචි ගොපල්ලා | 40.00 |
| 12 | 3655 | මංගල පෝරුව | 150.00 |
| 13 | 3621 | පිණ පැදුන දා | 60.00 |
| 14 | 4183 | ඉගිල්ලුන පාත්තයා | 50.00 |
| 15 | 3417 | සිංහල ව්‍යාකරණය | 90.00 |
| 16 | 3547 | බැටරි කාර්මික විද්‍යාව | 100.00 |
| 17 | 4379 | මුතු වරුෂා | 180.00 |
| 18 | 4196 | නයි නටවන්නා | 40.00 |
| 19 | 3568 | සරල සමාජ විද්‍යාව | 90.00 |
| 20 | 3188 | සිත් පහන් වී | 118.00 |
| 21 | 4208 | සුනඛ ශාපය හෙවත් ෂර්ලොක්හෝම්ස් | 190.00 |
| 22 | 3322 | මඟුල් ගෙදර බත් නැතෝ | 30.00 |
| 23 | 328 | සුදු වැද්දා | 140.00 |
| 24 | 3689 | සක්වල දඩයම | 90.00 |
| 25 | 3960 | කෝරල් දූපත | 80.00 |
| 26 | 3422 | එදා හෙළ දිව | 198.00 |
| 27 | 4229 | අපර්ණා | 175.00 |
| 28 | 4023 | වන්නි පුරාණය | 130.00 |
| 29 | 3964 | ගලිවරය | 58.50 |
| 30 | 4479 | ටොම් බවුන් | 119.00 |
| | | **එකතුව** | **3467.50** |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (viii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශිය සභාවේ මුදල් අයකැමි යටතේ පවත්නා සුළු මුදල් අග්‍රිමය සඳහා වෙන් කර ඇති මුදල රු.1000.00 කි. එසේ වුවද වර්තමානයේ පවතින භාණ්ඩ හා සේවා මිල ගණන් යටතේ හදිසි මිලදී ගැනීම් සිදු කරන අවස්ථා වලදී මේ මුදල ප්‍රමාණවත් නොවීම මත දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවේ. එබැවින් එම මුදල රු.5000.00 දක්වා වැඩි කිරීමට හා මෙතෙක් රු.100.00 ක් වූ බිල්පත් වටිනාකම රු.500.00 ක් ලෙස සංශෝධනය කිරීමත් සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (ix) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සබරගමු පළාත් කැගලු දිස්ත්‍රික් රියදුරු පාසල් හිමියන්ගේ සංගමය විසින් මීට පෙර සිදු කරන ලද ඉල්ලීමක් සැලකිල්ලට ගනිමින් දෙහිඕවිට ප්‍රාදේශිය සභාවට අයත් ක්‍රීඩා පිටිය රියදුරු පුහුණු කටයුතු සඳහා ලබා දීම සිදු කරන ලදී. නමුත් ඒ සඳහා කිසිදු අය කිරීමක් මේ වන තෙක් සිදු කර නැත. එසේ වුවද දිගින් දිගටම එම පුහුණු කිරීම් කටයුතු සිදු කරන බැවින් එම කාර්ය සඳහා ක්‍රීඩා පිටිය භාවිතා කරන දින වලදී දිනකට රු.1000.00 ක මුදලක් අය කර ගනිමින් ක්‍රීඩා පිටිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

රියදුරු පුහුණු පාසල් යනු ස්වේච්ඡා සංවිධාන නොවන බවත් ඒවා ලාභ ලබන ආයතන බැවින් ඔවුන්ගෙන් මීට වඩා මුදලක් අය කර ගැනීම සිදු කළ යුතු බවත් පෙන්වා දෙන ලදී. ඒ අනුව මේ වන විට රියදුරු පාසල් 07 ක් මෙම ක්‍රීඩා පිටිය භාවිතා කරන බවත් රු.1000.00 ක මුදල ප්‍රමාණවත් නොවන බවත් පැවසූ එතුමා එක් රියදුරු පාසලකින් රු.500 ක් වන ලෙස රියදුරු පාසල් 07න් රු.3500.00 ක් දිනකට අය කිරීම අසාධාරණ නොවන බව පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රිනී සඳමාලි විජේරත්න මැතිණිය සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 09.59)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

රියදුරු පාසල් 07 ක තිබෙනවා නම් ඒ එක් පාසලකින් සිසුන් 100ක 150ක පමණ පිරිසක් මාසකට රියදුරු පුහුණුව ලබා පිටව යන බව පෙන්වා දෙන ලදී. එම නිසා රු.500 ක මුදලක් එක් රියදුරු පාසලකින් දිනකට අය කළාට එය අසාධාරණ මුදලක් නොවන බව පැවසීය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙම ගොඩනැඟිලි සංකීර්ණයේ පහත මහල ලිපි ගොනු පරීක්ෂණ කටයුතු සඳහා පුහුණු පැවැත්වෙන දින වලදී ලබා දෙන ලෙස මෝටර් රථ වාහන පරීක්ෂක විසින් සිදු කළ ඉල්ලීමට අනුව ඒ ලිපිගොනු පරීක්ෂා කිරීම් වෙනුවෙන් උදෑසන කාලයේ ටික වේලාවක් එම ස්ථානය ලබා දෙන බවත් ඒ සඳහා මුදල් අය කිරීමට අපේක්ෂාවක් නොමැති බව පැවසීය. මේ කාර්ය කිරීමට පෙර වෙනත් ස්ථානයක සිදු කළ බවත් පසුව පහත මහලේ ඇති වෙළඳසැල් සඳහා පාරිභෝගිකයන්ගේ පැමිණීමේ අඩුවක් ඇති බවට වෙළඳුන් විසින් නිරන්තරයෙන් ප්‍රකාශ කළ බවත් ඒ සඳහා සිදු කළ උපක්‍රමයක් ලෙස මේ සිසුන් ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා ගොඩනැඟිල්ලේ පහත මහලේ විවෘත කොටස ලබා දීමට කටයුතු කළ බවත් පවසා සිටින ලදී. එම නිසා මේ වන විට එම වෙළඳසැල් වලට සැලකිය යුතු වෙළඳාමක් සිදු වන බවත් පැවසීය. නමුත් ක්‍රීඩා පිටිය පුහුණු කටයුතු සඳහා නොමිලේ ලබා දීම මත විගණන ගැටළුවක් ඇති වී තිබෙන බවත් පෙන්වා දෙන ලදී. එම නිසා මේ කාර්ය සඳහා යම් මුදලක් අය කිරීමට තීරණය කළ බවත් මෙහි

සංශෝධනයක් සිදු කරනවා නම් සියළු දෙනාගේම සාකච්ඡා මාර්ගයෙන් එය සිදු කරන ලෙසත් පවසා සිටි එතුමා මේ රියදුරු පාසල් වලින් පුහුණුව ලබා ගන්නේත් මේ බල ප්‍රදේශයේම තරුණියන් බැවින් ක්‍රීඩා පිටියට ගාස්තු ගෙවීමට ඇති බව පවසා මේ රියදුරු පාසල් වලින් දැනට අය කරනු ලබන ගාස්තු වැඩි කිරීමක් සිදු කළහොත් එයින් අපහසුතාවයට පත් වන්නේත් මේ ප්‍රදේශයේම තරුණ පිරිස් බැවින් මේ සියළු කරුණු සලකා බලා රු. 1000.00 මුදලක් අය කිරීමට තීරණය කළ බව පවසා සිටියේය. කෙසේ වෙතත් තව මාස කීපයකින් 2023 වර්ෂය සඳහා අය වැය කෙටුම්පත ඉදිරිපත් කරන බැවින් ඒ අවස්ථාවේදී ක්‍රීඩා පිටිය ලබා දීම වෙනුවෙන් නිශ්චිත ගාස්තුවක් 2023 වර්ෂයේ සිට අය කිරීමේ ක්‍රමවේදයක් සඳහා යොමු විය හැකි බවත් පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා, ගරු මන්ත්‍රී එම්.එම්.එම් ෆර්හාන් සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 10.01)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් චන්දන මැතිතුමා:**

මේ අවට තරුණ පිරිස් ක්‍රීඩා කටයුතු සඳහා මෙම ක්‍රීඩා පිටිය භාවිතා කරන බවත් මෙලෙස මුදලක් අය කරගෙන මෙය නීත්‍යානුකූලව මේ කාර්ය සඳහා ලබා දුනහොත් පසුව මේ ක්‍රීඩා පිටිය අවට තරුණ පිරිස් සඳහා භාවිතා කළ නොහැකි තත්වයක් උද්ගත වනු ඇතිද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එම කරුණ සිහිපත් කර දීම වැදගත් බවත් එසේ නම් මේ සඳහා අපි යම් කොන්දේසි මාලාවක් ඇතුලත් කර ඒ සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කිරීමට කටයුතු කරමු යැයි පවසා සිටියේය. ඒ අනුව රියදුරු පුහුණු පාසල් සඳහා ක්‍රීඩා පිටිය අවශ්‍ය වන්නේ කුමන දිනයන් වලදීද ඒ කුමන වේලාවකදීද යන්න ඔවුන් විසින් සතියකට හෝ පෙර සභාව දැනුවත් කර තබන ලෙසත් එසේම එම කාර්ය සඳහා ලබා දෙනු ලබන්නේ ක්‍රීඩා පිටියේ කුමන කොටසද යන්න සම්බන්ධයෙන්ද අවධානය යොමු කළ යුතු බවත් පවසා සිටියේය. මෙම් සම්බන්ධයෙන් සාකච්ඡා කර පැහැදිලි එකඟතාවයකට පැමිණිය යුතු බැවින් කාරක සභාවක් බවට පත් කර සාකච්ඡා කිරීම සුදුසු බවත් පෙන්වා දෙන ලදී.

( ගරු මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.07)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා:**

මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

එම යෝජනාව ස්ථිර කරන ලදී

කාරක සභා අවස්ථාවෙන් අනතුරුව මහා සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්..අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

2022 වර්ෂයේ ඉදිරි මාස සඳහා පුහුණු පැවැත්වෙන දිනයක් සඳහා රු.1000 ක මුදලක් අය කිරීම සුදුසු බවට මහා සභාව විසින් තීරණය කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01(x) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 15 ක අක්කර බදු සතොාක්ෂණය කර සොයා ගන්නා ලද තොරතුරු අනුව සොයා ගන්නා ලද අදාල ඉඩම් ප්‍රමාණය බෙදී ඇති සහ අක්කර බදු පැනවිය හැකි බිම් ප්‍රමාණය නොමැති දේපල වල හිඟ අක්කර බදු කපා හැරීම සඳහා 2020 ජනවාරි 14 වෙනි දින පැවති මහා සභා රැස්වීමේදී අනුමැතිය ලබා දෙන ලදී.එසේ වුවද අදාල කපා හැරීම් සිදු කිරීම සඳහා නැවත ලේඛන පරීක්ෂා කිරීමේදී එම අගයන්ගේ වෙනස් කම් ඇති බවට නිරීක්ෂණය විය. ඒ අනුව නිවැරදිව පරීක්ෂා කර බලා සකස් කරන ලද ඇමුණුම 09 හි සඳහන් ලේඛනයේ ඇති දේපල හිමියන්ගේ හිඟ අක්කර බදු ප්‍රමාණය කපා හැරීම සඳහා සහ ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් චන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01(xi) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත් වන මහජනතාවගේ පුද්ගල විනය හා පෞරුෂ වර්ධනය කිරීම, අධ්‍යාපනික සංවර්ධනය, කියවීමේ රුචිකත්වය වැඩි දියුණු කිරීම, විනෝදාත්මක හා නිර්මාණාත්මක අවශ්‍යතා සපුරාලීම සඳහා විවිධ වූ සම්පත් හා සේවා සැපයීම තුළින් මහජන පුස්තකාල සේවාව විධිමත් කිරීම තුළ දෙහිඕවිට ප්‍රාදේශීය සභාව මඟින් ආරම්භ කරන ලද “ විදුනැණ පියස“ විද්‍යුත් පුස්තකාලය මඟින් ආරම්භ කිරීමට නියමිත පාඨමාලා යටතේ අධ්‍යාපනය ලැබීමට ශිෂ්‍යයින් සූදානම් වුවත් පවතින ආර්ථික තත්වය හමුවේ මුදල් ගෙවා තොරතුරු තාක්ෂණය හැදෑරීමට හැකියාවක් නොමැති බැවින් ඔවුන් විසින් අදාල පාඨමාලාව නොමිලේ හැදෑරීම සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලීම් සිදු කරයි. පාඨමාලාව මෙහෙය වන සම්පත් දායක මහතා එම පාඨමාලා මූලික අදියරේදී නොමිලේ සිදු කිරීමට එකඟ බැවින් දැනට ආරම්භ කිරීමට නියමිතව ඇති පාඨමාලා නොමිලයේ සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය විසින් ස්ථිර කරන ලදී.
යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01(xii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2022 මැයි මස රට තුළ පැනවූ ඇඳිරිනීති තත්වය තුළ හා වෙසක් සතිය හේතුවෙන් 2022 මැයි 10,11,12,13,14,15,16,17 හා 18 යන දිනවල දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් මස් කඩ, මාළු කඩ, පොදු වැසිකිළි වසා තැබීමට සිදු විය. එබැවින් එම කාලයට අදාලව මස් කඩ, මාළු කඩ, පොදු වැසිකිළි වලට අදාලව මාසික කුලී ගෙවීම අපහසු බව බවත්, ඒ සඳහා සහන කාලයක් ලබා දෙන ලෙසත් කඩ හිමියන් විසින් ඉල්ලා ඇත. ඒ අනුව දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් මස් කඩ, මාළු කඩ , පොදු වැසිකිළි වලට අයත් මාසික කුලිය එම කාලයට අදාලව කපා හැරීම සුදුසු බව යෝජනා කරමි.

| ව්‍යාපාරික ස්ථානය | කපා හැරීමට ඇති මුදල (රු.) |
|---|---:|
| නාපාවල ගව මස් කඩය | 10,881.18 |
| දෙහිඕවිට ගව මස් කඩ | 93,623.22 |
| තල්දුව සතිපොල ගවමස් කඩය | 13,672.04 |
| ගුරුගල්ල ඌරු මස් කඩය | 6,022.58 |
| තල්දුව සතිපොල එළු කුකුල් මස් කඩය | 3,623.65 |
| දෙහිඕවිට අංක 01 මාළු කඩය | 1,580.64 |

| | |
|---|---|
| දෙහිඕවිට අංක 02 මාළු කඩය | 1,360.21 |
| දෙහිඕවිට පොදු වැසිකිළිය | 989.24 |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා :**

මේ ආකාරයට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියකින් තොරව මේ ආකාරයට කපා හැරීමක් සිදු කළහොත් එය අධිභාරයක් විය හැකි නොවේදැයි විමසා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ යෝජනාව ගෙන ආවේ ගරු ආණ්ඩුකරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරීමට බවත් මෙය සභා සම්මත වූ පසු අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරීම සාමාන්‍ය ක්‍රමවේදය බවත් එම අනුමැතිය නොමැතිව මේ කාර්ය සිදු කළ නොහැකි බවත් පෙන්වා දෙන ලදී.

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

දෙහිඕවිට ගව මස් කඩයේ රුපියල් 93,623.22 කපා හැරීම සඳහා තිබෙන බවත් නමුත් මේ වන විටත් මස් කඩ වල වෙළඳාම් කටයුතු සාර්ථකව සිදු වන බවත් පැවසීය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

යෝජනාවේ සඳහන් කර ඇති දිනයන් වලදී ඇදිරිනීති තත්වය මත සහ වෙසක් උත්සවය වෙනුවෙන් එම වෙළඳසැල් වසා තැබූ බැවින් ඒ කාලයට අදාල මුදල් මේ ආකාරයට කපා හරින ලෙස ඉල්ලා ඇති බවත් ආදායම් පරීක්ෂක ගේ වාර්තාව ලබාගෙන මේ කාර්ය සිදු කරන බවත් පැවසීය. මැයි 09 වෙනිදායින් පසුව ප්‍රවාහන කටයුතු සිදු කර ගැනීමට නොහැකි තත්වය මත මේ වන විටත් එම වෙළඳසැල වසා ඇති බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා :**

මස් හා මාළු කඩ මඟින් සභාවට විශාල ආදායමක් හිමි වන බවත් මේ දින වල පවතින ඉන්ධන ගැටළු හේතුවෙන් නාපාවල ගවමස් කඩයත් සතියට දින 02ක් පමණක් විවෘත කරන බව පවසා සිටියේය. එම නිසා සභාවට ලැබෙන ආදායම පිළිබඳව සලකා බලා රටේ පවතින තත්වය හේතුවෙන් ව්‍යාපාරිකයන් පත්ව ඇති අපහසුතාද සැලකිල්ලට ගෙන මේ සඳහා යම් සහනයක් ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා :**

රටේ බහුතරයක් ජනතාව විශාල ආර්ථික ප්‍රශ්න රැසකට මුහුණ දී ඇති මේ අවස්ථාවේදී ව්‍යාපාරිකයන් වශයෙන් මෙම මස් කඩ වෙළඳුන්ද ඒ ආකාරයෙන්ම ගැටළු වලට මුහුණ දී ඇති නිසා ඔවුන් වෙනුවෙන් යම් සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

### 01(xiii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:

තල්දූව නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා විදුලිය ලබා ගැනීමට සවි කළ යුතු ට්‍රාන්ස්ෆෝමරය සඳහා ගෙවීමට සිදු වූ රු. 743,462.17 ක මුදලට අමතරව ගාස්තු සංශෝධනය වීම මත එම මුදලට

අතිරේකව රු.357,344.83 ක මුදල ගෙවන ලෙස විදුලි බල මණ්ඩලය විසින් දන්වන ලදී. එබැවින් ඉහත කාර්ය සඳහා එම අතිරේක මුදලද ගෙවීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

එක් වරක් මුදල් ගෙවා තිබියදී නැවත වරක් මේ ආකාරයට මුදල් ගෙවීමට සිදු වී ඇත්තේ කුමන හේතුවක් නිසාදැයි විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ සඳහා ඔවුන් විසින් වියදම් ඇස්තමේන්තුවක් එවූ බවත් දින 14න් 14 ට ඔවුන්ගේ දින සීමාවන් වෙනස් වන බවත් එවන ලද මුදල් ඇස්මේන්තුවට අනුව චෙක්පතක් යොමු කළ පසු ඔවුන්ගේ මිල ගණන් වෙනස් වී ඇති බැවින් අදාල මිල ගණන් වලට එම කාර්ය සිදු කළ නොහැකි බවට විදුලි බල මණ්ඩලය විසින් දන්වා එවා ඇති බව පැවසීය.

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

වෙනස් කරන ලද මුදලට එම කාර්ය කළ නොහැකි බවත් චෙක්පත යොමු කර ඇති බැවින් මුලදී එකඟ වූ මුදලට ඒ කාර්ය සිදු කර දෙන ලෙසත් ඔවුන්ට දන්වමු යැයි පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෑතකදී විදුලි ගාස්තු ඉහළ නැංවීමක් සිදු කළ බවත් ඉන් පසු පෙර මිල ගණන් වලට ඒවා සිදු කිරීමට නොහැකි බවට පවසා සිටින බවත් චෙක් පත අප විසින් ඔවුන් වෙත යොමු කරන ලද්දේ තැපැල් මඟින් බැවින් චෙක්පත ලැබෙන විට මිල ගණන් වැඩි කර තිබීම හේතුවෙන් මේ ආකාරයට දන්වා එවා ඇතැයි විශ්වාස කරන බවත පැවසූ එතුමා අවශ්‍ය නම් අදාල ලේඛන මේ අවස්ථාවේ මහා සභාවට ඉදිරිපත් කළ හැකි බවත් පැවසීය.

(සභාව සෝෂාකාරී)

පළාත් පාලන ආයතනයක් ලෙස අප විසින් ඉදිරිපත් කර ඇති චෙක්පත ඔවුන් විසින් පිළි නොගැනීම අසාධාරණ බවට තමන්ද පිළිගන්නා බවත් මේ සම්බන්ධයෙන් දෙවතාවක් නැවත ඔවුන් වෙත ලිපි යොමු කර ඇති බවත් පවසා සිටියේය. යම් ලෙසකින් විදුලි බල මණ්ඩලයේ ගාස්තු නැවත වරක් ඉහල යාමක් සිදු වුවහොත් මේ කාර්ය සඳහා මීටත් වඩා වැඩි මුදලක් ගෙවීමට සිදු වන නිසා මේ ආකාරයට යෝජනාවක් ගෙන ආ බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

වෙළඳ සංකීර්ණය තුළ තෙකලා විදුලිය භාවිතා කරමින් කිසිදු කර්මාන්තයක් සිදු නොකරන තත්වයක් මත මේ කඩ කාමර දෙකක් සඳහා වෙනම ට්‍රාන්ස්ෆෝමරයක් සවි කිරීමට සිදු වන්නේ කුමන හේතුවක් නිසාද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

කඩ කාමර සියල්ල ටෙන්ඩර් කල පසු ඒවාට විදුලිය ලබා දෙන ලෙස විදුලි බල මණ්ඩලයෙන් ඉල්ලීම් සිදු කළ බවත් ඒ අවස්ථාවේදී කඩ කාමර 10 න් 08ක් සඳහා පමණක් විදුලිය ලබා දුන් බවත් පැවසීය. ඉතිරි කඩ කාමර දෙක සඳහා විදුලිය ලබා දීමට ධාරිතාව ප්‍රමාණවත් නොවන බැවින් ට්‍රාන්ස්ෆෝමරයක් සවි

කළ යුතු බවට විදුලි බල මණ්ඩලය විසින් ප්‍රකාශ කරන බව පවසා සිටියේය. මේ කරුණ සම්බන්ධයෙන් මීට පෙර මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවද දැනුවත් කළ බවත් සිහිපත් කර සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

තමන් දන්නා ආකාරයට ට්‍රාන්ස්ෆෝමරය සවි කර විදුලිය ලබා දෙන්නේ මේ කඩ කාමර දෙක සඳහා පමණක් නම් ඒ සඳහා අප විසින් මුදල් ගෙවිය යුතු බවත් නමුත් පොදුවේ අවට මහජනතාවගේත් ප්‍රයෝජනයට සවි කරන එකක් සඳහා අප මුදල් ගෙවිය යුතු නැති බවත් පැවසීය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එය සවි කරන්නේ මේ කඩ කාමර දෙක සඳහා පමණක් බව පවසා සිටියේය. එය වෙළඳ සංකීර්ණය සඳහා විදුලිය ලබා ගැනීමට පමණක් සවි කරන බවත් වෙනත් ඒවා සඳහා එමඟින් විදුලිය ලබා නොදෙන බවත් පවසා සිටින ලදී. ඒ ආකාරයෙන්ම දෙහිඕවිට නව වෙළඳ සංකීර්ණය සහිත මේ පරිශ්‍රයටද වෙනම ට්‍රාන්ස්ෆෝමරයක් සවි කර ඇති බව පෙන්වා දෙන ලදී. ටෙන්ඩර් කර ඇති කඩ කාමර වල කඩ හිමියන් දෙදෙනෙක් නිරන්තරයෙන්ම ඔවුන්ගේ කඩ කාමර සඳහා විදුලිය ලබා ගත නොහැකි බවට දන්වා සිටින බවත් කඩ කාමර ටෙන්ඩර් කළ පසු විදුලිය ලබා ගත නොහැකි නම් ඒ සඳහා විදුලිය ලබා දීම අපගේ වගකීමක් බැවින් මුදල් කමිටුවට යොමු කර මහා සභා අනුමැතියක්ද මේ සඳහා ලබා ගත් බව පැවසීය. නමුත් වැඩි කරන ලද මිල ගෙවීම සඳහා නැවත අනුමැතියක් අවශ්‍ය බැවින් මේ ආකාරයෙන් මහා සභාවට එම කාරණය නැවත යොමු කළ බව පසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

මෙම වෙළඳ සංකීර්ණය වෙනුවෙන් ට්‍රාන්ස්ෆෝමරයක් සවි කිරීම ගැටළුවක් නොවන බවත් තල්දූව වෙළඳ සංකීර්ණයට විදුලිය ලබා දීමේදී කඩ කාමර දෙකක් ඉතිරි නොකර සියළුම කඩ කාමර සඳහා විදුලිය ලබා දීම ඔවුන්ගේ වගකීමක් බවත් පැවසීය.කිලෝ වොට් 90 ට වඩා වැඩි ධාරිතාවයක් විදුලිය පරිභෝජනය කරන්නේ නම් එම ගොඩනැඟිලි සඳහා ට්‍රාන්ස්ෆෝමරයක් සවි කිරීම සිදු කළද මේ ගොඩනැඟිල්ලේ එතරම් විශාල විදුලි ධාරිත්වක් භාවිතා නොවන බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

සාමාන්‍යයෙන් එවැනි ගොඩනැඟිල්ලක් සඳහා අමතර ට්‍රාන්ස්ෆෝමරයක් සවි කළ යුතු නම් ඒ වියදම විදුලි බල මණ්ඩලයෙන් දැරිය යුතු බවත් තමන් කාලයක පටන් මේ ආයතනය සමඟ සමීපව කටයුතු කරන බැවින් මේ සම්බන්ධයෙන් අවබෝධයක් ඇතිව මේ පැහැදිලි කිරීම සිදු කරන බවත් පවසා සිටියේය. මේ අවස්ථාවේ කාගෙන් හෝ මේ මුදල අය කර ගැනීමේ චේතනාවෙන් මේ ආකාරයට විදුලි බල මණ්ඩලය ක්‍රියා කරන බවට තමන්ට හැඟී යන බවත් මේ ගෙවීම අප විසින් ප්‍රතික්ෂේප කළහොත් ඔවුන් එය සවි කළ යුතු බවත් පැවසීය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ ට්‍රාන්ෆෝමරයෙන් වෙනත් කිසිදු පාර්ශවයක් සඳහා විදුලිය ලබා දීමක් මෙමඟින් සිදු නොවන බවත් පැවසූ එතුමා මේ වන විට අදාල මුදල නොගෙවා මේ කඩ කාමර දෙක සඳහා විදුලිය ලබා දිය නොහැකි බවට විදුලි බල මණ්ඩලය තරයේ ප්‍රකාශ කරන බව පැවසීය. මේ සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කමිටුවේදීත් දැනුවත් කළ බවත් වෙනම විදුලි බල මණ්ඩලය ගොස් අදාල කාරණය සම්බන්ධයෙන් කතා කළ බවත් පැවසූ එතුමා ඒ සෑම අවස්ථාවකදීම වෙළඳ සංකීර්ණයක් බැවින් ට්‍රාන්ස්ෆෝමරයක් සවි නොකර විදුලිය ලබා දිය නොහැකි බවට ඔවුන් විසින් ප්‍රකාශ කරන බව පැසීය. මෙය විදුලි බල මණ්ඩලය විසින්ම සිදු කරන ලද වැරැද්දක් බවත් ගොඩනැඟිල්ල සාදන අවස්ථාවේදී ඔවුන් ඒ සම්බන්ධයෙන් අපව දැනුවත් නොකළ බවත් පෙන්වා දෙන ලදී. මේ සම්බන්ධයෙන් තමන් විසින් ලිඛිතව විදුලි බල මණ්ඩලය

දැනුවත් කළ බවත් අද වන විට කඩ හිමියන් දෙදෙනෙකු විදුලිය ලබා ගැනීමට නොහැකිව අසරණව සිටින බවත් පවසා සිටියේය. මේ ගැටළුවට සභාව වගකිව යුතු බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

මේ කඩ සඳහා ලබා ගෙන ඇත්තේ තෙකලා විදුලියද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එසේ නොවන බවත් තනි අදියරේ විදුලිය ලබා දී ඇති බවත් පැවසීය. ඉතිරි කඩ දෙක සඳහාත් ඒ ආකාරයට විදුලිය ලබා දෙන ලෙස අයදුම්පත් ලබා දුන්නත් ඔවුන් ඒ සඳහා ට්‍රාන්ස්ෆෝමයක් සවි කළ යුතු බවට ප්‍රකාශ කරන බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා:**

යම් ලෙසකින් ඉතිරි වී ඇති කඩ දෙකේ හිමිකරුවන් ඒ ආකාරයට තෙකලා විදුලිය ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින් මෙලෙස ප්‍රකාශ කරනවා විය හැකිදැයි විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එසේ නොමැති බවත් තෙකලා විදුලිය ලබා දීමට සභාව බැඳී නැති බවත් සියළුම කඩ සඳහා ලබා දෙන්නේ තනි අදියරේ විදුලිය බවත් පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා:**

එසේ නම් තනි අදියරේ විදුලිය ලබා දීම සඳහා ට්‍රාන්සේෆාමර් සවි කිරීම සිදු කළ නොහැකි බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

තම ව්‍යාපාරික ස්ථානය සඳහා තෙකලා විදුලිය ලබා ගැනීමේදී තමන් විසින් ඒ සඳහා තැන්පතුවක්ද තැබූ බවත් එම ධාරිතාව මදි වීම මත නැවත ඇම්පියර් 60ක ධාරිතාවයක් ලබා ගැනීමට සිදු වූ අවස්ථාවේදී ඒ සඳහා තවත් තැන්පතුවක් තැබූ බවත් පැවසූ එතුමා එහිදී කිලෝවොට් 87ක් සඳහන් වූ බවත් පැවසීය. සාමාන්‍යයෙන් කිලෝ වොට් 85 ට වඩා විදුලිය වැය නොවන ස්ථානයකට කිලෝ වොට් 90ක ට්‍රාන්ෆෝමරයක් සවි කිරීමට හැකියාව නැති බවත් කිලෝවොට් 55 ට වැඩි නොවන තැනක් සඳහා කිලෝ වොට් 60 ක ට්‍රාන්ස්ෆෝමරයක් සවි කිරීමටද නෛතිකමය හැකියාවත් නොමැති බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ටෙන්ඩර් ගෙවා ලබා ගත් කඩ කාමර සඳහා විදුලිය ලබා ගැනීම ඔවුන්ගේ අයිතිවාසිකමක් බව පවසමින් මෙම කඩ හිමියන් දෙදෙනා නිරන්තරයන් තමන් හමුවීමට පැමිණෙන බවත් ඒ හේතුවෙන් තමන්ද විශාල අසීරුතාවයකට ලක්ව ඇති බවත් පවසා සිටියේය. එම වෙළඳ සංකීර්ණයේ ඇති පුස්තකාලයට හා අනෙකුත් කඩ කාමර සඳහා විදුලිය ලබා දිය හැකි නම් කඩ කාමර දෙකක් සඳහා පමණක් මෙලෙස සිදු කරන්නේ ඇයිද යන්න සම්බන්ධයෙන් තමන් විමසූ බවත් රත්නපුරයෙන් විදුලි ඉංජිනේරුවෙකු ගෙන්වා මේ ස්ථානය පරීක්ෂා කළ බවත් පවසා සිටියේය. මේ ගැටළුව නිසා 2019 මාර්තු මාසයේ සිට අදාල කඩ හිමියන් දෙදෙනාට තම ව්‍යාපාරික කටයුතු සිදු කර ගැනීමට නොහැකිව සිටින බැවින් මේ සම්බන්ධයෙන් සාධාරණ විසඳුමක් ලබා දීම අපගේ වගකීම බව පවසා සිටියේය. මහා සභාව මේ යෝජනාවට විරුද්ධ නම් තමන්ට අදාල පාර්ශව ඒ සම්බන්ධයෙන් දැනුවත් කළ හැකි බවත් නමුත් සභාපතිවරයා වශයෙන් මේ කරුණ පිළිබඳව සභාව දනුවත් කිරීම තම වගකීම බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

තමන් මේ අවස්ථාවේදී විදුලි බල මණ්ඩලයේ ඉංජිනේරු මහත්මයෙකු සමඟ මේ ගැටළුව සම්බන්ධයෙන් සාකච්ඡා කළ බවත් විදුලිය ලබා දීමට නොහැකි වීමේ වරද සභාවේ නොවන බවට ඔහු විසින් ප්‍රකාශ කළ බවත් මේ සඳහා සභාව විසින් නැවත මුදල් ගෙවීම අනවශ්‍ය බවත් මේ කරුණු සඳහන් කර අභියාචනයක් ලබා දෙන ලෙස ප්‍රකාශ කළ බවත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ සම්බන්ධයෙන් අභියාචනයක් ලබා දී විදුලි බල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීට පවා තමන් විසින් කතා කර අදාල විස්තර විද්‍යුත් තැපැල් මඟින් ඔහු වෙතද යොමු කර ඇති බවත් පැවසීය. එසේ වුවත් මේ පැහැදිලි කිරීම මත යම් සහනයක් ලබා ගැනීමට හැකියාවක් ඇත්නම් නැවත වරක් අභියාචනයක් යොමු කිරීමට කටයුතු කළ හැකි බවත් පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

මේ කාරණය විසඳා ගත හැකි බවත් එහි වගකීම තමන් භාර ගන්නා බවත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ඒ කාරණාව ඉතා අගය කොට සලකන බවත් මෙය විසඳා දීමට හැකි වුවහොත් සභාවට විශාල මුදලක් එමඟින් ඉතිරි කර දීමට හැකියාව ඇති බවත් පැවසීය. මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා මැදිහත් වීම පිළිබඳව ස්තුතිවන්ත වන බවත් අභියාචනයේ සහ අනිකුත් සියළුම ලේඛන වල පිටපත් එතුමාට ලබා දීමට කටයුතු කරන බවත් පැවසීය. මේ කාරණාව සාර්ථක නොවුනහොත් මීළඟට කුමන පියවරක් අනුගමනය කළ යුතුද යන ගැටළුක් පවතින බවත් විදුලි බල මණ්ඩලයේ අයකිරීම් නැවත වැඩි කළහොත් තවත් අමතර මුදලක් මේ සඳහා එකතු වන බැවින් මේ ඉදිරිපත් කරන ලද යෝජනාව සභාවේ අනුමත කර තබා ගන්නවාද නොඑසේ නම් ඉවත් කර ගන්නවාද යන්න විමසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

මේ කඩ දෙක සඳහා විදුලිය ලබා ගැනීමට ලිපිනය සඳහන් කර ඇත්තේ අදාල කඩ හිමියන්ගේ පෞද්ගලික නමටද වෙළඳ සංකීර්ණයේ නමටද යන්න විමසා සිටියේය. ගොඩනැඟිල්ලේ ලිපිනයට ගන්නේ නම් යම් ගැටළුවක් තිබෙන බවත් පෞද්ගලික ලිපිනයකට ඔවුන් එය ලබා ගන්නේ නම් එහි වගකීම විදුලිබල මණ්ඩලය වෙත යොමු වන බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙය රාජ්‍ය ආයතනයක් බැවින් වෙළඳ සංකීර්ණයේ නමට නොගෙන වෙනත් නමකින් මෙය ලබා ගැනීම සිදු කළ නොහැකි බවත් එවිට ග්‍රාම නිලධාරී අත්සන ලබා නොදෙන බවත් පෙන්වා දෙන ලදී. මේ සඳහා ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමාගේ මැදිහත් වීම මත යම් සහනයක් ලබා ගැනීමට හැකියාව ඇතිද යන්න පළමුවෙන් සොයා බැලීමට කටයුතු කරන බවත් යම් ලෙසකින් එම උත්සාහය අසාර්ථක වුවහොත් තවත් මාසයක කාලයක් මේ සඳහා අනුමැතිය ගැනීමට බලා සිටිය යුතු බැවින් ඒ අතර තවත් මිල වැඩි කිරීම් සිදු වුවහොත් සභාව විසින් දැරිය යුතු පිරිවැය ඉහළ යන බැවින් මේ යෝජනාව සභා සම්මත කිරීම සුදුසු බවට තමන් අදහස් කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

මෙය සිදු කිරීමට හැකියාවක් ඇති බවට තිබෙන විශ්වාසය මත තමන් එම වගකීම භාර ගැනීමට සූදානම් බවත් නාපාවල ක්‍රීඩාංගනයේ බුදු පිළිමයක් සෑදීම සඳහා විදුලි කණුවක් ඉවත් කර ගැනීමට යාමේදී රු.80,000 ක ඇස්තමේන්තුවක් විදුලි බල මණ්ඩලය මඟින් ඉදිරිත් කර එය නොගෙවන්නේ නම් එම විදුලි

කණුව ගලවා ඉවත් නොකරන බවට ප්‍රකාශ කළ බවත් ඒ අවස්ථාවේදී තමන් මැදිහත් වී කිසිදු මුදලක් නොගෙවා එම කාර්ය සිදු කළ බවත් පවසා සිටියේය. එම නිසා මේ කාර්ය සඳහාත් අවශ්‍ය ලියවිලි තමන් වෙත ලබා දෙන ලෙසත් ඒ සඳහා උත්සාහයක් ගන්නා බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

තමන්ට ඇම්පියර් 60 ක ධාරිතාවයක් අවශ්‍ය බවට ප්‍රකාශ කළ අවස්ථාවේදී ඒ සඳහා රුපියල් හාරලක්ෂ විසිදහසක මුදලක් ගෙවන ලෙස විදුලි බල මණ්ඩලය දැනුවූ බවත් තමන් ඒ මුදල නොගෙවා තර්ක කළ බැවින් නැවත අදාල මිල සංශෝධනය කර රුපියල් එක් ලක්ෂ හැත්තෑදහසක් ගෙවන ලෙස දැන්වූ බවත් එම මුදලත් තමා සතුව නොමැති බව පැවසූ වට්ට කොපමණ මුදලක් ගෙවිය හැකිද යන්න තමාගෙන් විමසා සිටි බවත් පැවසූ එතුමා ඒ අවස්ථාවේ තමන් විදුලි බල මණ්ඩලයේ නිලධාරීන්ට තමන්ට ගෙවිය හැකි මුදල නොව මේ සඳහා අය කරන ගණන් ප්‍රකාශ කරන ලෙස පැවසූ බවත් සිහිපත් කර සිටියේය. අවසානයේ රුපියල් විසිදහස් හාරසියක මුදලක් පමණක් තමන් එම කාර්ය සඳහා ගෙවූ බව පැවසූ එතුමා මෙවැනි කාර්යන් වලදී ඔවුන් අනුගමනය කරන සූක්ෂම උපක්‍රම ඇති බවත් එම මුදල් අදාල ආයතනයට යනවාද නොඑසේනම් එම මුදල් වලට කුමක් වනවාද නොදන්නා බැවින් යමු මුදලක් පිළිබඳව ප්‍රකාශ කළ පමණින් එය ගෙවීමට ඉක්මණ් නොවී ඒ සම්බන්ධයෙන් අවධානයෙන් හා තීක්ෂණ බුද්ධියකින් අදාල ආයතනය සමඟ කටයුතු කළ යුතු බව පෙන්වා දෙන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**කල් දී නැති යෝජනා:**

**02.(i) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ලංකා බැංකුවේ දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ නමින් ඇති 2235101 අංක දරණ පොදු ගිණුමේ ශේෂය දැනට අවශ්‍ය වියදම් පියවීම සඳහා ප්‍රමාණවත් නොවන තත්වයක් උද්ගත වී ඇත. එබැවින් එම බැංකුවේ දෙහිඕවිට ප්‍රාදේශීය සභාව නමින් ඇති ස්ථාවර තැන්පතුවෙන් රුපියල් ලක්ෂ විස්සක මුදලක් ආපසු ලබාගෙන 2235101 දරණ පොදු ගිණුමට බැර කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**02.(ii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සතු මාගම්මන කනත්ත භූමියේ ඇති අජීවී කොස් ගස් දෙක ප්‍රසිද්ධ වෙන්දේසියේ වෙන්දේසි කිරීම සඳහා කාර්මික නිලධාරී විසින් ලබා දී ඇති පහත සඳහන් මිල ගණන් තක්සේරුවේ අවම ලංසු මුදල ලෙස පිළිගැනීම සුදුසු බව යෝජනා කරමි.

- අඩි 06 ක් වූ වට ප්‍රමාණයක් සහිත කොස් ගස - රු.50,000.00
- අඩි 04 ක් වූ වට ප්‍රමාණයක් සහිත කොස් ගස - රු.30,000.00

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සඳමාලි විජේරත්න මැතිණිය:**

එම කොස් ගස් දෙක වැට මායිමේ පවතින ඒවාද යන්න විමසා සිටියාය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එසේ නොවන බවති මායිම් සම්බන්දයෙන් ගැටළුවක් උද්ගත නොවන බවත් පවසා සිටියේය.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය

**02.(iii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අපවත් වී වදාළ අවිස්සාවෙල්ල ශ්‍රී සුධර්මාරාම විහාරස්ථානයේ විහාරාධිපති කොළඹ දිසාවේ ප්‍රධාන අධිකරණ සංඝනායක අති පූජ්‍ය වේරගැර ආරියවංශ නායක ස්වාන්මීවහන්සේගේ අභාවය පිළිබඳව දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ශෝකය ප්‍රකාශ කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අපවත් වී වදාළ අති පූජ්‍ය වේරගැර ආරියවංශ නායක ස්වාමීන්වහන්සේගේ තුන් කෝරළයටම නායකත්වයක් දුන් මහා යතීවරයානන් වහන්සේ නමක් බවත් උන්වහන්සේ කලක් රෝගාතුරව සිට මේ ආකාරයට අපවත් වීම සිදු වූ බවත් පැවසීය. රෝගාතුර වීමට පෙර අවස්තා ගණනාවකදී ප්‍රාදේශීය සභාව විසින් සංවිධානය කළ විවිධ උත්සව අවස්ථාවන්ට වැඩම කර ඒ සඳහා ආශිර්වාද ලබා දීමට උන්වහන්සේ ක්‍රියා කළ බව ගෞරව පූර්වකව සිහිපත් කරන බව පැවසූ එතුමා උන්වහන්සේගේ අපවත්වීම ප්‍රදේශයේ බෞද්ධ ජනතාවට විශාල පාඩුවක් බවත් පවසා සිටියේය. අවිස්සාවෙල්ලේ නායක ස්වාමීන්වහන්සේ නමින් කා අතරත් ජනප්‍රිය අති පූජ්‍ය වේරගැර ආරියවංශ නායක ස්වාන්මීවහන්සේ කොළඹ දිසාවේ ප්‍රධාන අධිකරණ සංඝනායක ස්වාමීන්වහන්සේ ලෙසත් කටයුතු කළ බව පැවසූ එතුමා දෙහිඕවිට ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ගරුතර ස්වාමීන්වහන්සේගේ අභාවය සම්බන්ධයෙන් ශෝකය එම විහාරස්ථානයේ දායක සභාව වෙත දන්වා යැවීම සඳහා මේ යෝජනාව ඉදිරිපත් කළ බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා:**

හෙට දිනයේ ආදාහ පූජෝත්සවය පැවැත්වෙන බැවින් ඒ අවස්ථාව සඳහා මේ ශෝක ප්‍රකාශය යැවීම සුදුසු බව පවසා සිටියේය.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

කල් දී නැති යෝජනා යටතේ මන්ත්‍රීතුමන්ලා 12 දෙනෙකුගේ අත්සනින් යෝජනාවක් දැන් ලබා දී තිබෙන බවත් එම යෝජනාව සමස්ථ මන්ත්‍රී මණ්ඩලයම ඉදිරිපත් වී ගෙන ආ යුතු යෝජනාවක් බවට තමන්ද විශ්වාස කරන බැවින් එය තමන් විසින් දැන් සභාවට ඉදිරිපත් කරන බව පවසා සිටියේය.

**02. (iv) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ වන විට රටේ උද්ගත වී ඇති තත්වය මත ආණ්ඩුවක් පිහිටු වීම සඳහා විවිධ මත ඇති වී ඇති හෙයින් ඉදිරි කාලයේදී ජන රජයේ සුබසිද්ධිය උදෙසා සර්ව පාක්ෂික ආණ්ඩුවක් බිහි කිරීම වෙනුවෙන් මෙම සභාවේ සහය පළ කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙය ඉතාමත් හොඳ යෝජනාවක් බවත් අද වන විට පක්ෂ විපක්ෂ සියළු දෙනාම යෝජනා කරන්නේ සර්වපාක්ෂික ආණ්ඩුවක් පිහිටුවා මේ රට නැවත යථා තත්වයට ගෙන ඒම සඳහා කටයුතු කළ යුතු බව පැවසීය. අද වන විට ගෑස්, ඉන්ධන මෙන්ම අත්‍යාවශ්‍ය බොහෝ ද්‍රව්‍ය වල පවතින හිඟය හේතුවෙන් මහජනතාව මහතත් පීඩාවකට පත්ව ඇති බවත් මේ ගැටළු වලට විසඳුම් ලබා දිම සඳහා පක්ෂ විපක්ෂ සියළුම දෙනාගේ සහයෝගයෙන් සර්ව පාක්ෂික රජයක් පිහිටුවා ඒවා සඳහා කඩිනම් විසඳුම් ලබා දීම වඩාත් සුදුසු බවට සියළු දෙනාම දැඩිව විශ්වාස කරන බව පැවසීය. ඡන්දයක් පවතින විටදී පමණක් දේශපාලන පක්ෂ වලට බෙදී ගියත් මේ අවස්ථාවේ කුමන කාර්යක් සිදු කිරීමට හෝ  අපට රටක් තිබිය යුතු බැවින් ඒ රටේ ගෞරවය ආරක්ෂා කරගනිමින් එය ගොඩ නැංවීමේ කාර්ය සඳහා සම්බන්ධ වීමේ වැදගත්කම පෙන්වා දෙන ලදී. එම නිසා මේ යෝජනාව සියළුම මහජන නියෝජිතයන් විසින් ඒකමතිකව සම්මත කරනු ඇතැයි තමන් විශ්වාස කරන බව පවසා සිටියේය. ෙ

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න  මැතිතුමා:**

මේ යෝජනාව සඳහා අත්සන් ලබා දීමේදී ඇතැම් මන්ත්‍රීවරුන් එය සිදු නොකළ බවත් දැන් ගරු සභාපතිතුමා විසින් සියළුම මන්ත්‍රීවරුන් ඒකතිකව මේ සඳහා අනුමැතිය දෙනු ඇති බවට ප්‍රකාශ කරන බවත් පැවසීය. එම නිසා මේ යෝජනාවට මෙම සභාවේ සිටින සියළුම මන්ත්‍රීවරුන් එකඟදැයි පැහැදිලිව ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

යෝජනාව ගෙන ආ අවස්ථාවේ එය ස්ථිර කළ බවත් කිසිදු මන්ත්‍රීවරයෙකු මේ සඳහා විරුද්ධ නම්  එම අවස්ථාවේදී එය ප්‍රකාශ කළ යුතු බව මන්ත්‍රීවරුන් දන්නා බවත් පැවසීය. එලෙස විරුද්ධ නොවීමෙන් ප්‍රකාශ වන්නේ මේ යෝජනාව සඳහා සියළුම මන්ත්‍රීවරු එකඟ බව නිසා කිසිදු බෙදීමකින් තොරව මේ යෝජනාව සභා සම්මත වූ බව ප්‍රකාශ කර සිටියේය.

**(ඊ) කාරක සභා වාර්තා සලකා බැලීම හා වෙනත් දිනයක් නියම කිරීම:**

2022.06.21 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව, 2022.06.21 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව,2022.06. දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව ,2022.06.21 දින පැවති කාර්මික හි සේවා කාරක සභා වාර්තාව සහ 2022.06.26 දින පැවති ප්‍රසම්පාදන කාරක සභා වාර්තාන සලකා බලන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා:**

කාර්මික හා සේවා කාරක සභා වාර්තාවේ තමන් විසින් යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත් එය සියළුම මන්ත්‍රීවරුන්ට අදාල වන යෝජනාවක් බවත් පැවසීය. මහජන නියෝජිතයන් සියළු දෙනාටම තම වසම් වල ඇති ගැටළු විසඳීම සඳහා හියුම් පයිප්ප අවශ්‍ය කරන බවත් නමුත් මේ වන විට ඒවාගේ හිඟයක් පවතින බැවින් හියුම් පයිප්ප ලබා ගැනීම සඳහා යම් මුදලක් වෙන් කිරීමට හැකි නම් එය වඩාත් කාලෝචිත බවත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ වන විට සභා අරමුදලේ පවතින මුදල් තත්වය මත හියුම් පයිප්ප ලබා ගැනීමට ප්‍රමාණවත් මුදලක් නොමැති බවත් මී ළඟ මහා සභා රැස්වීම වන විට ප්‍රමාණවත් මුදලක් සොයා ගැනීම හැකි වුවහොත් එම යෝජනාව ගෙන ඒමට කටයුතු කරමුයැයි පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

තමන් පරිසර හා පොදු පහසුකම් කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයෙකු බවත් එම කමිටුවට අදාලව තමන්ට පැන නැගුන යම් ගැටළුවක් නිරාකරණය කර ගැනීම සඳහා මේ අවස්ථාව ලබා ගත් බවත් පැවසීය. මෙය කිසිසේත්ම කිසිදු පුද්ගලයෙකුට හෝ කාරක සභාවේ සභාපතිතුමා හෝ විෂය නිලධාරීන් අපහසුතාවයට පත් කිරීමේ අරමුණින් සිදු කරන්නක් නොවන බවත් හුදෙක් තමන්ට ඇති වූ ගැටළුව නිරාකරණය කර ගැනීමේ අවශ්‍යතාව මත විමසන කරුණක් බවත් පවසා සිටියේය. කිසියම් තමන් වෙතට එන කිසියම් ගැටළුවක් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවකට යොමු කිරීමෙන් බලාපොරොත්තු වන්නේ ඒ කරුණ සම්බන්ධයෙන් ගැඹුරු අධ්‍යනයක් සිදු කර සාධාරණ අබපක්ෂපාතී විසඳුමක් ඒ සඳහා ලබා දීම බවට තමන් විශ්වාස කරන බවත් ප්‍රාදේශිය සභා පනතේ විධිවිධාන වලට අනුවත් එය එසේ සිදු විය යුතු බවට දක්වා ඇති බවත් පැවසීය. මේ වසර 04ක කාලය තුළ කාරක සභා රැස්වීම් එකක් හෝ දෙකක් හැරුනුකොට අනික් සියළුම රැස්වීම් සඳහා තමන් සහභාගී වී ඇති බවත් නමුත් ප්‍රවාහන ගැටළුව මත ස්ථාන පරීක්ෂණ සඳහා යාමට අවස්ථා නොලැබීම සිදු වූ බවත් පෙන්වා දුන්නේය. මෙවර කාරක සභා වාර්තාවේ සඳහන් කරුණ අධ්‍යනය සඳහා සහභාගී වීමට තමන්ටද අවස්ථාව ලැබුණු බවත් ඇතැම් කරුණු අධ්‍යනය සඳහා සහ අවශ්‍ය ක්‍රියා මාර්ග  ගැනීම සඳහා සභාවේ ප්‍රධානීන්ට සහ නිලධාරීන්ට බලය ලබා දීමක් පනත් මඟින්ම සිදු කර ඇති බවත් ඊටත් එහා ගිය විශේෂිත වූ පරීක්ෂණයක් සිදු කළ යුතු කාරණා කාරක සභාව වෙත යොමු කරන බවත් පැවසීය. ඒ අනුව කාරක සභාව වෙත ලබා දුන් ගැටළුවක් සම්බන්ධයෙන් කාරක සභා රැස්වීම ආරම්භයේදී පැහැදිලි කිරීමක් සිදු කරන බවත් ඒ ආකාරයට පරිසර හා පොදු පහසුකම් කාරක සභාව වෙත යොමු වූ බොහෝ කරුණු වලදී මේ සඳහා සභාවට කිසිවක් සිදු කළ නොහැකි බවට හා යම් ක්‍රියා මාර්ගයක් ගත්තත් අදාල පාර්ශව විසින් එකී කාර්ය සිදු කරගෙන යන බවට නිලධාරීන් මඟින් ප්‍රකාශ වීමක් තමන් දැක ඇති බව පැවසීය. සභාව මඟින් තහනම් කළත් වෙනත් ආයතන වල අනුමැතිය ලබාගෙන එකී කාර්ය සිදු කරන බවට බොහෝ අවස්ථා වල ප්‍රකාශ වන බවත් පවසා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ඒ ආකාරයට පවසමින් සිදු නොකර මඟහැරුනු කාරණාවක් තමන්ට පවසන ලෙස දන්වා සිටියේය.මෙම කමිටු වාර්තාවේ සඳහන් ආකාරයේ දැව කැබලි කිරීමේ කර්මාන්ත ශාලාවේ ගැටළුක් අටුළුගම ප්‍රදේශයේත් ඇති වූ බවත් ඒ අවස්ථාවේදී ඔවුන් නීත්‍යානුකූල අවසරය ලබා ගන්නා තෙක් සභාව විසින් බලපත්‍රය ලබා නොදුන් බවත් රුපියල් එක් ලක්ෂ අසූ දහසක මුදලක් සභාවට ගෙවා එය නීත්‍යානුකූල ආකාරයට සිදු කරගෙන යාම සඳහා අවශ්‍ය කරුණු සපුරා ගත් බව පෙන්වා දෙන ලදී. ඒ ආකාරයට මේ කාරණයද පරීක්ෂා කර සිදු කරන ලද්දේ ඔවුන් නීත්‍යානුකූල ආකාරයට මේ කාර්ය සිදු කිරීම සඳහා යොමු කිරීම බවත් කවුරුන් හෝ ව්‍යාපාරයක් සිදු කරන්නේ නම් එය නැවැත්වීමට වඩාඔවුන් නීත්‍යානුකූලව ඒ කාර්ය සිදු කරන තත්වයට ගෙන ඒම සිදු කිරීම වඩාත් සුදුසු බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

මේ බල ප්‍රදේශයේ කවුරු හෝ පුද්ගලයෙකු තම ශක්තියෙන් ව්‍යාපාරයක් සිදු කර දියුණුවක් ලබා ගැනීමට උත්සාහ කරන්නේ නම් ඒ සඳහා තමන් පෞද්ගලිකව කැමති බවත් එවැනි දෑ සඳහා විරුද්ධ වීමේ අවශ්‍යතාවයක් තමන්ට නොමැති බවත් පැවසීය. එම නිසා තමන් විසින් සිදු කරනු ලබන මේ පැහැදිලි කිරීම සහ අදාල පුද්ගලයා අතර තමන්ගේ ඇති පෞද්ගලික අමනාපයක් නිසා සිදු වන්නක් ලෙස වරදවා වටහා නොගන්නා ලෙස ඉල්ලා සිටියේය. මධ්‍යම පරිසර අධිකාරියෙන් යොමු කරන ලද ලිපිය එදින කමිටුවට සහභාගී වූ තමන් විසින් සම්පූර්ණයෙන් කියවූ බවත් ඇතැම් අවස්ථා වල මීට පෙර එලෙස යොමු කර තිබූ ලිපි සම්පූර්ණ අවධානයෙන් නොකියවීම තුළ තමන් විසින් සිදු කරන ලද අතපසු කිරීම් සම්බන්ධයෙන් කණගාටු වන බවත් පවසා සිටින ලදී. ඒ අනුව අදාල ලිපියේ එක් වගන්තියක මෙම ව්‍යාපාරය පවත්වාගෙන යාමේ වසරක වගකීම සභාව සතු වන බවත් සභාවේ අනුමැතිය නොමැතිව එම ව්‍යාපාරය පවත්වාගෙන යා නොහැකි බවටත් එහි සඳහන් කර තිබූ බව පවසා සිටියේය. එසේ වුවත් කාරක සභා රැස්වීම් සඳහා පැමිණි විට ඒ සම්බන්ධයෙන් අසන්නට ලැබෙන්නේ එය සභාවෙන් සිදු කළ නොහැකි කාරණයක් බවත් එය නැවැත්වීම සඳහා සභාවට කිසිදු ක්‍රියා මාර්ගයක් ගත නොහැකි බවට බවත් පැවසූ එතුමා කෙසේ හෝ ස්ථාන පරීක්ෂාව සඳහා යාමේදී එම ස්ථානයේ අදාල කාර්ය ආරම්භ කර සිදු කරගෙන යන බව දක්නට ලැබුණු බවත් අදාල කාරණයට අවශ්‍ය උපකරණ ආදියත් ඒ වන විට ගෙනවිත් අවසන්ව තිබූ බවත් පැවසීය. ප්‍රධාන මාර්ගය අසල ගොඩනැඟිල්ලක් ඉදි කිරීම සඳහා අවසර පත්‍රයක් ලබා ගත යුතු බවත් ඒ කාර්ය සම්පූර්ණ කිරීමට ටික දිනක් ගත වන බව අප කවුරුත් දන්නා කරුණක් බව පැවසූ එතුමා මේ කර්මාන්තයට අදාලව එකී කරුණු සම්පූර්ණ කරගෙන නැති බව එයින් අවබෝධ වන බව පවසා සිටියේය. එම ස්ථානයට ගිය පසු අදාල නිලධාරීයා විසින් අවසර ලබා ගැනීම සඳහා අවශ්‍ය ලියකියවිලි රැගෙන අදම කාර්යාලයට පැමිණෙණ ලෙස දන්වා සිටි බවත් ඒ ආකාරයට එක් දිනකින් අවසරයක් නිකුත් කිරීමේ හැකියාවක් තිබේද යන්න ගැටළුවක් බවත් පවසා සිටින ලදී. එවැනි කාර්යක් සිදු වන්නේ නම් ඒ කාර්යන් නිලධාරීන්ට හා අදාල අනෙකුත් බලධාරීන්ට සිදු කළ හැකි බවත් කාරක සභාවක් පත් කර මේ ආකාරයට මහජන නියෝජිතයන් ඒ සඳහා සම්බබන්ද කර ගැනීමේ අවශ්‍යතාවයක් නොමැති බවත් පවසා සිටින ලදී. මෙවැනි සිදු වීම් සිදු වන විට අනාගතයේ සිදු විය හැකි යම් ගැටළුකාරී අවස්ථාවකදී එයින් බේරීම සඳහා මේ කරුණ කාරක සභාවට යොමු කළ බව පැවසීමට පමණක් මේවා කමිටු සඳහා යොමු කරන බවත් එම ප්‍රකාශය සිදු කර නිලධාරීන්ට මෙහි යම් වරදක් සිදු වුවහොත් එය මන්ත්‍රීවරුන් වෙත පවරා නිදහස් විය හැකි බැවින් එලෙස සිදු කරනවාද යන පැණය උද්ගත වන බවත් පැවසීය. එම නිසා අධ්‍යනයක් සිදු නොකර විසඳුම් ලබා දිය හැකි නම් ඒ ආකාරයට කාරක සභාව සම්බන්ධ කර නොගෙන මේ කාර්ය දිගටම සිදු කර ගෙන යන ලෙසත් එසේ නොමැති නම් මේ පරීක්ෂණ සඳහා මහජන නියෝජිතයන්ට වගකීම ලබා නොදෙන ලෙසත් ඉල්ලා සිටියේය. මෑතකදී තමන් දැරණියගල ප්‍රදේශයට යාමට මේ ස්ථානය පසු කර ගිය බවත් කමිටු වාර්තාවේ සඳහන් යෝජනා කිසිවක් අනුගමනය කිරීමකින් තොරව එකී කාර්ය තවදුරටත් හොඳින් සිදු වන බව පැවසූ එතුමා එදින ස්ථාන පරීක්ෂණයට ගිය අවස්ථාවේදී නිසි අවසර ලබා ගන්නා තෙක් එකී කාර්ය වහාම නවත්වන ලෙස නියෝග කිරීමට කාරක සභාවට බලය තිබූ බවත් නමුත් එවැනි ප්‍රතිචාරයක් ඒ අවස්ථාවේදී පළ නොවූ බවත් සිහිපත් කර සිටියේය. එවැනි සිදුවීම් සිදු වන විට මේ කාර්ය වෙනත් ක්‍රමවේදයකින් පවත්වාගෙන යාමේ අරමුණක් පවතින බවට වැරදි චිත්‍රයක් ඕනෑම පුද්ගලයෙකු තුළ ගොඩනැඟිය හැකි බැවින් නිවැරදි ක්‍රමවේද ඒ සඳහා අනුගමනය කලා නම් වඩාත් සුදුසු වන්නට තිබූ බව පවසා සිටියේය. මේ සභා වාරය තවත් දිගු කාලයක් නොපවතිනු ඇති බවත් එම නිසා තමන් විසින් සිදු කරන ලද මේ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම සභා වාර්තාවට ඇතුලත් කරන ලෙස පැවසූ එතුමා මින් ඉදිරියට තමන් කාරක සභා රැස්වීම් සඳහා සහභාගී වන බවත් නමුත් සක්‍රීයව ඒ ක්‍රියාවලිය සඳහා දායක නොවන බවත් එසේ සිදු කළාට එයින් ප්‍රයෝජනයක් නොවන නිසා ඒ ආකාරයට ඉදිරියේදී කටයුතු කරන බවට මේ ගරු සභාවට ප්‍රකාශ කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

දින පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම සඳහා තමන්ද සහභාගී වූ බවත් ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා සිදු කරන ලද ප්‍රකාශයට තව කරුණක් එකතු විය යුතු බවත් පවසා සිටියේය. ඒ අනුව එදින කමිටුවට සහභාගී වූ අවස්ථාවේ එදිනට සාකච්ඡා කිරීමට ඇති කරුණු සම්බන්ධයෙන් විමසා

සිටි අවස්ථාවේදී විෂය නිලධාරියා විසින් ගැටළුවක් නොමැති බවත් ඌරුපැලැව්ව ප්‍රදේශයේ යම් කරුණක් සම්බන්ධයෙන් කතා කිරීමට තිබෙන බවත් කමිටුවේ සභාපතිවරයා පැමිණි පසු එය සිදු කළ හැකි බවත් පැවසූ බව සිහිපත් කර සිටියේය. නමුත් රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා පෙර සඳහන් කළ ස්ථානයට අදාලව මධ්‍යම පිරිසර අධිකාරියෙන් ලබා දුන් වාර්තාවේ පිටුවෙන් පිටුව පෙරලා අධ්‍යනය කරන විට එහි 09 වෙනි කරුණ තුළ මෙය බලපත්‍රයක් නොවන බවත් බල පත්‍රයක් ලබා ගැනීම සඳහා සභාවේ අවසරය අනිවාර්යෙන්ම තිබිය යුතු බවටත් සඳන් වී තිබූ බව පැවසීය. කෙසේ වෙතත් කමිටු සාමාජිකයන් විසින් එම ස්ථානය පරීක්ෂා කිරීමට ගිය බවත් යාමට පෙර නිලධාරියා විසින් එහි කිසිදු කාර්යක් සිදු වී නැති බවට ප්‍රකාශ කළත් එම ස්ථානයට ළඟා වන විට කණු ගසා ජේ.සී.බී.යන්ත්‍ර ගෙන්වා ගෙන එම ස්ථානයේ වැඩ කටයුතු සිදු කොරෙමින් තිබූ බව පැවසීය. මීට සමාන සිදු වීමක් අටුළුගම ප්‍රදේශයේ සිදු වන විට ඊට පෙර එම කාර්ය සඳහා වෙළඳ බල පත්‍රයක් සභාව මඟින් නිකුත් කර තිබූ බවත් එය අලුත්කිරීමට පැමිණි පසු මේ ගැටළුව ඇති වූ බවත් සිහිපත් කර සිටි එතුමා එවැනි ආකාරයේම ගැටළුක් මේ ස්ථානයේදීත් සිදු වන්නට ගිය බව පවසා සිටියේය.නමුත් කාරක සභාව විසින් එම ස්ථානයට ගිය නිසා එය නවත් වන ලෙස දන්වා සිටි බවත් ඒ අවට ජල පෝෂක ප්‍රදේශයක බැවින් ජල මාර්ග දෙකක් තිබූ බවත් පැවසීය. මේ ආකාරයේ ව්‍යාපාර නිසා වැටක තිබෙන ගසක් වත් ඉතුරු නොවන බව පවසමින් මේ සභාවේදීම බොහෝ මන්ත්‍රීවරුන් එම කර්මාන්ත මේ ප්‍රදේශය තුළ සිදු කිරීම සම්බන්ධයෙන් විරෝධය දක්වමින් කතා කළ බවත් සිහිපත් කළ එතුමා එමඟින් රැකියා ප්‍රශ්නයට යම් විසඳුමක් ලැබුණත් පරිසරයට හානිදායක සිදු වීම් සඳහා අනුමැතිය ලබා දෙන්නේ නම් පරිසර හා පොදු පහසුකම් කාරක සභාවක් පත් කර තිබෙන්නේ කුමන හේතුවක් නිසාද යන්න විමසා සිටියේය. මධ්‍යම පරිසර අධිකාරිය එහි වාර්තාවෙන් මේ කාර්යයේ අවසන් වගකීම සභාව වෙත පවරා ඇති බවත් යම් ලෙසකින් කුමක් හෝ ගැටළුවකක් උද්ගත වුවහොත් සභාව අනුමැතිය ලබා දී ඇති බව ඔවුන්ට පැවසීය හැකි බව පෙන්වා දෙන ලදී. ඒ අනුව කාරක සභාවේ නිලධාරියා පැවසුවේ මෙහි ගැටළුවක් නොමැති බව යැයි පැවසූ එතුමා අද වන විට රටේ බහුතර ජනතාවක් ප්‍රකාශ කරන්නේ පළාත් පාලන ආයතන වල මන්ත්‍රීවරු කොමිස් ගනු ලබන බවට වුවත් ඒ මන්ත්‍රීවරු පත් කර සිටින්නේ මහජනාතිවට මේ කාර්යාල මඟින් ඉටු කර ගත යුතු සේවා නිලධාරීන්ගේ මාර්ගයේන් කාර්යක්ෂමව සිදු කර ගැනීම සඳහා බවට තමන් විශ්වාස කරන බව පවසා සිටියේය. එසේම බල ප්‍රදේශයේ ජනතාවගේ මුදල් නිසි ආකාරයට නිලධාරීන් විසින් වියදම් කරනවාද යන්න අධ්‍යනය කිරීම සඳහාත් මහජන නියෝජිතයන්ට වගකීමක් ඇති බවට තමන් විශ්වාස කරන බව පැවසූ එතුමා නිලධාරීන්ට මේ ආකාරයෙන් ක්‍රියා කිරීමට නම් කාරක සභාපත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව පෙන්වා දෙන ලදී. පළාත් පාලන ආයතන විසුරුවූ පසු එම පරිපාලන කටයුතු සිදු කරනු ලබන්නේ නිළධාරින් විසින් බවත් දැනටත් මන්ත්‍රීවරු සිටියත් එම පරිපාලන කටයුතු සිදු කරනු ලබන්නේ නිලධාරීන් විසින් බවට මෙවැනි සිදුවීම් හේතුවෙන් හැඟී යන බව පවසා සිටියේය. කිසිදු අවස්ථාවක කිසිවෙකු සමඟ පෞද්ගලික අමනාපයක් නොමැති බවත් නමුත් මේ තනතුර හොබවනු ලබන පුද්ගලයාගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් ප්‍රකාශ කිරීමට සිදු වන බව පැවසූ එතුමා මෙය දෝෂාරෝපනයක් හෝ චෝදනාවක් නොවන බවත් එදින අත්විදි සිදුවීස් මාලාව පැහැදිලි කිරීමක් පමණක් බවත් පවසා සිටියේය.මෙම ස්ථානය පරීක්ෂා කිරීමෙන් අනතුරුව පරිසර හා පොදු පහසුකම් කාරක සභාවේ සභාපති ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමාද එම ස්ථානයේ සිදු කරනු ලබන ක්‍රියාවලියේ වරදක් ලතිබෙන බවට පිළිගත් බවත් නමුත් ස්ථාන පරීක්ෂාවට යාමට පෙර නිලධාරියා විසින් ප්‍රකාශ කළේ එම ස්ථානයේ ගැටළුවක් නොමැති බවට බව පවසා සිටියේය. මීට පෙර අටුළුගම සිදු වූ සිදු වීමටද අදාල පුද්ගලයා සම්බන්ධ බවට එම ස්ථානයට ගිය පසු අවබෝධ කර ගත් බවත් කාරක සභාවේ සභාපතිවරයාද එය දැක පුදුම වූ බවත් පවසා සිටියේය. යම් ලෙසකින් නිලධාරියාගේ ප්‍රකාශය විශ්වාස කොට අත්සන ලබා දී ස්ථාන පරීක්ෂණය සිදු නොකර සිටියා නම් මධ්‍යම පරිසර අධිකාරියේ වාර්තාවෙන්ද මේ සම්බන්ධ තීරණයක් ගැනීමේ බලය සභාව වෙත පවරා තිබීම මත විශාල ගැටළුවක් උද්ගත වන්නට ඉඩ තිබූ බව පෙන්වා දෙන ලදී. පවතින තත්වය මත බොහෝ දුරට ඉදිරියේදී පළාත්පාලන ආයතන විසුරුවිය හැකි බවත් ඉන් පසු මෙම ආයතන වල කාර්යන් සිදු වන්නේ මේ ආකාරයෙන් බවත් පැවසූ එතුමා බොහෝ විට මන්ත්‍රීවරයා යනු ප්‍රදේශයේ අවමඟුලකට හෝ වෙනත් උත්සව අවස්තාවකට පමණක් සහාගී වන අයෙකු හෝ ව්‍යසනයක් සිදු වූ විට තමන්ගේ පුද්ගලික ධන පරිත්‍යාගයෙන් බඩු බෙදා දෙන අයෙකු පමණක් නොවන බව රටේ ජනතාව දැනගත යුතු බව පෙන්වා දෙන ලදී. ඇතැම් අවස්ථා වල නිවාස සැලසුමක් අනුමත කර ගැනීම සඳහා දිගුකාලයක් නිලධාරීන් විසින්

ලබා ගනිමින් එම කාර්ය යම් ආකාරයක ප්‍රමාද කිරීමකට ලක් කරන බවත් මේ අන් කිසිවක් නිසා නොව අල්ලස් ලබා ගැනීමේ අරමුදලින් බවත් පෙන්වා දෙන ලදී. මේ ආයතනයේ නිලධාරීන් එසේ කරන බවට තමන් ප්‍රකාශ නොකළත් රාජ්‍ය සේවයේ බහුතරයක් දෙනා ඒ තත්වයට පත්ව ඇති බව පෙන්වා දෙන ලදී. මේ කරුණ සම්බන්ධයෙන් අනුමැතිය ලබා දෙන්නේ නම් ඒ පිළිබඳව තමන් පෞද්ගලිකව විරුද්ධ වන බවත් එම ස්ථානය අසලින් ගලා යන ඇළ මාර්ගයක් තිබෙන බවත් ඒවා පිළිබඳව සම්පූර්ණයෙන් අධ්‍යනය කර වෙළඳ බලපත්‍රය ලබා දිය යුතු බවත් මීට පෙර අටුළුගම සිදුවීමේදීත් සිදු වූයේ කිසිදු අධ්‍යනයකින් තොරව වෙළඳ බලපත්‍රය ලබා දීමක් බව පවසා සිටියේය. අද වන විටත් අදාල ස්ථානයේ ඉදිකිරීම් සිදු වන බවත් සභාවක් ලෙස සිදු කරන ලද නියෝගයට අවනත වීමට අදාල පාර්ශවයට නොහැකි නම් ගරු සභාපතිතුමාගේ විධායක බලතල භාවිතා කර මේ සම්බන්ධයෙන් අවශ්‍ය කඩිනම් ක්‍රියා මාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එම ස්ථානයට ගිය පසු පරිසර කමිටුවේ සභාපතිවරයා මට දුරකථනයෙන් කතා කොට මේ කර්මාන්තය සිදු වන්නේ තමන් දැනුවත්වද යන්න විමසා සිටි බවත් එලෙස තමන් දැනුවත්ව එකී කාර්ය සිදු නොවන බවට තමන් ඒ අවස්ථාවේදී දැනුම් දුන් බවත් පවා සිටි එතුමා එම අවස්ථාවේදීම එහි ඉදි කිරීම් නවත් වන ලෙස තමන් අදාල කමිටු සාමාජිකයන්ට උපදෙස් ලබා දුන් බවත් අදාල ස්ථානය සුපුරාලිය යුතු සුදුසුකම් සපුරාගෙන නීත්‍යානුකූල අවසරය ලබා ගන්නා තෙක් සියළු ඉදි කිරීම් නවත්වන ලෙස තමන් විසින් අදාල පාර්ශවය වෙත ලිඛිතවද දන්වා යවා ඇති බව පැවසීය. අටුළුගම ස්ථානයටද සභාවේ අවසරයකින් තොරව බලපත්‍ර ලබා ගෙන තිබූ බවත් රුපියල් එක් ලක්ෂ අසූදහසක දඩයක් ඒ සඳහා සභාව විසින් අය කර ගත් බව පැවසීය. ඕනෑම පුද්ගලයෙකුට ව්‍යාපාරයක් සිදු කිරීමේ හැකියාව ඇති බවත් නමුත් ඒවා සිදු විය යුත්තේ නීත්‍යානුකූලව නිසා අවසර ලබා ගෙන බව පැවසීය. මේ සිදු වීමේ දී අදාල නිලධාරියා ඒ ආකාරයෙන් ප්‍රකාශ කර ඇත්නම් ඒ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙස ලේකම්තුමා වෙත උපදෙස් ලබා දෙන බවත් වර්තමානය වන විට සියළුම පාර්ශව චෝදනා කරනු ලබන්නේ මන්ත්‍රීවරුන්ට මිසක රජයේ නිලධාරීන්ට නොවන බව පැවසූ එතුමා නමුත් මේ සියල්ලම නිසි තැනකට නොගතහොත් එක කණ්ඩායමක් ලෙස මේ පාර්ශව දෙකම සාමූහිකව කටයුතු නොකළහොත් කුමන පාලකයෙකු පත් වුවත් මේ රට ගොඩ ගැනීමට නොහැකි වනු ඇති බවට ප්‍රකාශ කර සිටියේය. එම නිසා මෙවැනි කටයුතු සම්බන්දයෙන් දැඩිවක්‍රියාත්මක විය යුතු බවත් කාරක සභාවකට යම් කරුණක් යොමු කිරීමෙන් බලාපොරොත්තු වන්නේ මේ ආකාරයේ ගැඹුරු අධ්‍යනයක් බැවින් මේ කරුණ සම්බන්ධයෙන් අද දින සභාවේදී කතා කිරීම පිළිබඳව තමන් සතුටු වන බවත් පවසා සිටියේය. කාරක සභාව හැල්ලු වන ආකාරයේ තීන්දු තීරණ කිසිදු අවස්ථාවක ගෙන නොමැති බවත් කාරක සභාවක් ලබා දුන් තීරණ තම අභිමතයට සංශෝධනය කිරීමට තමන් කිසිදු අවස්ථාවක උත්සාහ ගෙන නොමැති බවත් පෙන්වා දෙන ලදී. එම නිසා ඒ අවස්ථාවට සහභාගී වී මේ කරුණ සම්බන්ධයෙන සභාව දැනුවත් කළ සියළුම මන්ත්‍රීවරුන්ට පෞද්ගලිකව තමන් ස්තුතිවන්ත වන බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

නැවත වරක් මේ ස්ථානය සඳහාත් අටුළුගම සිදු වීමට සමාන සිදු වීමක් වන්නේ නම් එය සුදුසු නොවන බව පැවසීය. අටුළුගම මෙන්ම මෙහිදීත් අදාල ගොඩනැඟිල්ල සකස් කර සියළු කරුණු සිදු කර ඇති බැවින් අවසර ලබා දීමට සිදු වන බව පැවසීමට ඉඩ ඇති බවත් එසේ නොවන්නට නම් දැඩිව මෙය නැවැත්වීමට තීරණය කර අදාල තීරණය මේ සභාවේදීම ගැනීම වඩාත් සුදුසු බවට තමන් අදහස් කරන බව පවසා සිටියේය.පසුව මේ කරුණ සම්බන්ධයෙන් තැන් තැන් වල විවේචනය කරනවාට වඩා අද දිනම ඒ සම්බන්ධව ඍජු තීරණයක් ගැනීම වඩාත් සුදුසු බැවින් ඒ සඳහා අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් චන්දන මැතිතුමා:**

අද වන විටත් මේ කාර්ය එම ස්ථානයේ සිදු වෙමින් පවතින බවත් ප්‍රදේශයට ජලය සපයන්නේ ඊට පහළින් ඇති ජල මූලාශ්‍රයකින් බවත් පෙන්වා දෙන ලදී. එම නිසා මේ කාර්යට අවසර ලබා දෙන්නේ නම් ජල සම්පාදන මණ්ඩලයෙනුත් අනිවාර්යයෙන්ම වාර්තාවක් ලබා ගත යුතු බවත් ප්‍රදේශයට ජලය සපයන ජල මාර්ගයක් එම ස්ථානයෙන් පැමිණෙණ බවත් පවසා සිටියේය. සභාවෙන් ඒ කාර්ය නැවැත් ීමට දැනුම් දුන් බවක් නොදන්නා බවත් මේ වන විටත් එම කාර්ය සිදු වෙමින් පවතින බවත් පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ සම්බන්ධයෙන් පොලීසියේ පැමිණිල්ලක් සිදු කරන ලෙසත් දිගින් දිගටම ඒ කාර්ය සිදු වන්නේ නම් එය නැවැත්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

මේ සඳහන් කරණු ලබන ස්ථානයේ හිමිකරු විසින් මාගම්මන ප්‍රදේශයේ ඇළකට ගලි බවුසරයක් ගෙනවිත් හලන ලද සිදු වීමක් සම්බන්ධයෙන් පසු ගිය කාලයේ කතා වූ බවත් ඒ සිදු වීම සියැසින් දුටු පුද්ගලයින්ද සිටින බව පවසා සිටියේය.එම නිසා එවැනි ක්‍රියා සම්බන්ධ ඉතිහාසයක් ඇති පුද්ගලයෙකුට ව්‍යාපාරයක් සඳහා හෝ අවසර ලබා දෙන්නේ නම් ඒ සම්බන්ධයෙන් තවදුරටත් වගකීමෙන් සොයා බැලීම අත්‍යාවශ්‍ය බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

පසුගිය පරිසර හා පොදු පහසුකම් කාරක සභාවෙන් ස්ථාන පරීක්ෂණයක් සිදු කිරීමට නියමිතව තිබු බවත් නමුත් මධ්‍යම පරිසර අධිකාරියෙන් යොමු කරන ලද ලිපිය හැරුනුකොට කාරක සභාවේ අධ්‍යයනයකින් තොරව මෙවැනි තීන්දු තීරණ වලට නොඑන බවත් එලෙස ස්ථානයේ පරීක්ෂණය සඳහා ගිය පසු කිසිදු දේශපාලනික හිතවත්කමක් පක්ස පාය භේදයක් සම්බන්ද කර නොගෙන අදාල තීරණ වලට එළඹීම තමන් එදා සිටිම සිදු කළ බව පැවසීය. මීට පෙර අවස්ථාවක ගුරුගල්ල ප්‍රදේශයේ ඌරු කොටුවක් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට යාමේදීද ඒ ආකාරයෙන්ම ක්‍රියා කළ බව සිහි පත් කළ එතුමා මේ සිදුවීමට අදාල ස්ථානය පරීක්ෂා කිරීමට ගිය පසු තමන් විසින් අදාල පුද්ගලයා හදුනාගත් බවත් පවසා සිටියේය. වෙළඳ බලපත්‍රයක් සඳහා අවසර ලබා දීමට එම ස්ථානය පරීක්ෂා කිරීමට ගිය බවත් නමුත් අනුමැතිය ලබා දීමට සුදුසු තත්වයක් එම ස්ථානයේ නොතිබූ බව පැවසීය. මහා පරිමාණයෙන් ඩෝසර් දමා ස්ථානය කපා තිබූ බවත් ඇළ අයිනෙන් කොන්ක්‍රීට් කණු දමා තිබූ බවත් පැවසූ එතුමා වෙළඳ බල පත්‍රයක් ලබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග කිසිවක් ඔහු විසින් අනුගමනය කර නොතිබූ බවත් කැඳවා ප්‍රශ්න කිරීමේදී ඒවා සිදු කර නැති බවට ප්‍රකාශ කළ බවත් පවසා සිටියේය.කුඩා වෙළඳ ව්‍යාපාරයක් සිදු කරන පුද්ගලයන් ගෙන් පවා සභාව බදු අය කරන්නේ නම් මහා පරිමාණ ව්‍යාපාර සිදු කරන මේ පුද්ගලයා ඒ සම්බන්ධයෙන් දැනුවත් නොවී සිටිය නොහැකි බවත් වෙළඳ බල පත්‍රය ලබා දීමට නම් ගොඩනැගිලි අනුමැතිය ලබාතිබිය යුතු බවත් පෙන්වා දෙන ලදී. එය ලබා ගැනීමට නම් සපුරාගත යුතු නිර්නායක කීපයක් ඇති බවත් ඒ කිසිවක් මේ සථානයේ සම්පූර්ණ වී නොතිබූ බවත් පැහැදිලි කර සිටියේය. එමඟින්ම එම ව්‍යාපෘතියේ අසාර්ථක භාවය ඔප්පු වන බැවින් එවැනි ස්ථාන සඳහා වෙළඳ බලපත්‍ර ලබා දීම සඳහා අනුමැතිය ලබා දීම කාරක සභෘවට කිසිසේත් සිදු කළ නොහැකි බැවින් ස්ථාන

පරීක්ෂණය සිදු කර නැවත ආ බව පැවසීය. ම ස්ථානය පරීක්ෂා කිරීමේදීම අදාල ස්ථානය එවැනි ව්‍යාපාරයක් සිදු කිරීම සඳහා කිසිසේත් යෝග්‍ය නොවන බව හොඳින්ම පැහැදිලි වන බව පවසා සිටින ලදී. එම නිසා එය සම්පූර්ණයෙන්ම නවත්වන ලෙස උපදෙස් ලබා දුන් බවත් අද වන තෙක් කිසිදු අවස්තාවක මුදල් හෝ වෙනත් ප්‍රතිලාභ ලබා ගෙන කාරක සභාව ලබා දෙනු ලබන තීරණ වෙනස් කිරීමක් සිදු කර නැති බවත් ඉදිරියේදීත් එය ඒ ආකාරයෙන්ම සිදු වන බවත් පැවසූ එතුමා කාරක සභාවට අයත් කාර්ය භාරය සිදු කර අවසන් බැවින් නිලධාරීන් විසින් ඒ සඳහා ගොඩනැඟිලි අනුමැතිය ලබා දෙන්නේ නම් එය කිසිසේත් සිදු කළ නොහැකි කරුණක් බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා:**

අද වන විට දේශපාලඥයන් දිනෙන් දින සමාජයේ අප්‍රසාදයට ලක් වන්නේ මෙවැනි සිදු වීම් හේතුවෙන් බව පැවසීය. බොහෝ අවස්ථාවල මෙවැනි ව්‍යාපාර සිදු කරන පුද්ගලයන් ඒවා ආරම්භකර කල් ගත වූ පසු අනුමැතිය සඳහා ප්‍රාදේශීය සභාව වෙත අයදුම් පත්‍ර යොමු කිරීම දක්නට ලැබෙන බවත් එවිට ව්‍යාපාරය යම් ප්‍රමාණයකට ඔවුන් විසින් ක්‍රියාත්මක කර පවත්වාගෙන යන බවත් අවුළුගම සිදු වීම වැනි කාරණා වලදී ව්‍යාපාරය ආරම්භ කර එයට යම් පිරිවැයක් දරා ඇති බැවින් සහනයක් ලබා දිය යුතුය යන මතයේ සිට ඉදිරියට ක්‍රියා කරන බව එම ව්‍යාපාරිකයන් මේ වන විට හඳුනාගෙන ඇති බව පවසා සිටියේය. එම නිසා ඒවා අත්හිටුවීමකින් තොරව අවසරය ලබා දීමේ ක්‍රමවේදයක් පවතින බව ඔවුන් අවබෝධ කරගෙන ඇති බැවින් මේ අවබෝධය ජනතාව තුලින් ඉවත් වීම සඳහා මේ සිදුවීම මඟින් පූර්වාදර්ශයක් ලබා දීමට කටයුතු කරමුයැයි යෝජනා කරන බව පවසා සිටියේය. ඒ අනුව ගරු සභාපතිතුමාට තිබෙන බලතල උපයෝගී කරගෙන මේ කාර්ය තහනම් කිරීමට ක්‍රියා කර ප්‍රාදේශිය සභාව සතු මේ බලය ජනතාව ඉදිරියේදී හෑල්ලු වීමට ඉඩ ලබා නොදෙමු යැයි පවසා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙයට අදාල වාර්තා ජල සම්පාදන මණ්ඩලයෙන් සහ මධ්‍යම පරිසර අධිකාරියෙන් මෙන්ම අනෙකුත් ආයතන මඟින්ද ලබා ගන මහා සභාවට යෝජනාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමු යැයි පවසා සිටින ලදී. ලෙස සිදු නොකළ හොත් ඔවුන්ට නීතිමය පිළිසරණ ලබා ගැනීමට යා හැකි බවත් එසේ සිදු වුවහොත් සභාව විසින් කුමන හේතු මත මේ කර්මාන්තය සිදු කිරීම තහනම් කළාද යන්න විමසා බැලුවහොත් අදාල ආයතනයන්ගේ වාර්තා ඒ සඳහා පෙන්වීමට හැකියාව තිබිය යුතු බවත් පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

මධ්‍යම පරිසර අධිකාරියෙන් යොමු කරන ලද වාර්තාවේත් 09 වෙනි වාක්‍ය මඟින් සිදු කරන ලද ප්‍රකාශයෙන් සභාව අපහසුතාවයට පත්කිරීමක් සිදු කර ඇති බවත් ඒ නිසා ඔවුන්ගෙන් එකී වාර්තාව ලබා ගැනීමට පදනම් කර ගත් නිර්නායක මොනවාද යන්න විමසා බැලීම සුදුසු බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

කාරක සභාව , මධ්‍යම පරිසර අධිකාරිය එක් ස්ථානයකට කැඳවා මේ සම්බන්ධයෙන් විමසීම වැදගත් බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබා දී ඇත්තේ අවසර පත්‍රයක් නොවන බවත් කමිටු රැස් කර අවසානයේ මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියා මාර්ග කුමක්ද යන්න පිළිබඳවත් විමසා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ඉදිරි ක්‍රියා මාර්ග සඳහා එකී වාර්තා ලබා ගැනීම සිදු කරන බවත් එතෙක් මේ කාර්ය සිදු කිරීම තහනම් කර පොලිසියේ පැමිණිල්ලක් දැමීමට කටයුතු කරන බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

අටුළුගම සිදුවීමේදීත් මේ ආකාරයට සිදු වූ බවත් ස්ථාන පරීක්ෂණය සඳහා ගිය පසු එක්තරා මන්ත්‍රීවරයෙකු මේ සම්බන්ධයෙන් ගැටළුවක් ඇති නොවන බවත් එය විසඳා ගැනීමට හැකි වනු ඇති බවට අදාල ව්‍යාපාරික මහතාට ප්‍රකාශ කරන අවස්ථාවේදී තමන්ගේ රියදුරු විසින් එය දැක ඇති බව පැවසීය. එම ස්ථානයේ අනවසරයෙන් සිදු කර තිබූ ඉදි කිරීම් සඳහා සභාව අය කරන ලද දඩ මුදල වන රුපියල් එක් ලක්ෂ අසූදහස පමාණවත් නොවන බවත් සිදු කර ඇති ඉදිකිරීම දෙස බලන විට ලක්ෂ 4 ක් හෝ 5ක් ඒ වෙනුවෙන් අය කර ගැනීමට තිබූ බවත් පෙන්වා දෙන ලදී. එසේ වුවත් නිලධාරීන් විසින් තීරණය කර ඇති මුදල් ප්‍රමාණය දෙස බැලූ විට එය සාධාරණ නොවන බව පැවසීය. මේ ආකාරයට සභාවේ නියෝග වලට පිටුපා ඉදි කිරීම් සිදු කර අවසාන අවස්ථාවේදීත් ඉන් පැන යාමට හැකියාවක් ඇත්නම් එය සුදුසු නොවන බවත් එම නිසා ගත යුතු තීරණ කිසිදු පක්ෂග්‍රාහී බවකින් තොරව සිදු කිරීම කළ යුතු බව පේනවා දෙන ලදී.එසේ නොවුවහොත් කමිටුව නියෝජනය කරන එක් මන්ත්‍රීවරයෙකුගේ ප්‍රකාශයක් හේතුවෙන් සමස්ථ සාමාජික මන්ත්‍රීවරුම අපහසුතාවයට පත් වීම කිසිසේත් සුදුසු නොවන බව පෙන්වා දෙන ලදී. අටුළුගම සිදු වීමේ ස්ථාන පරීක්ෂාව සඳහා කාරක සභාවේ මන්ත්‍රීවරුන්ට අමතරව වෙනත් මන්ත්‍රීවරුන්ද සහභාගීවූ බවත් බොහෝ විට ස්ථාන පරීක්ෂණයක් සඳහා යන විට වෙනත් කාරක සභා වලට අයත් මන්ත්‍රීවරුන්ද අවශ්‍ය අවස්ථා වල සහභාගී කරවාගෙන ඇති බව පැවසීය. මාගම්මන ප්‍රද්ශයට ගලි බවුසරයක් ඉවත් කිරීමට මේ පුද්ගලයා කටයුතු කළේ නම් ව්‍යාපාරික ස්ථානයක් ජල පෝෂක ප්‍රදේශයක ඉදි කළ පසු තවත් එවැනි සූක්ෂම ක්‍රමවේද මඟින් ඉඩම යටින් ඇළ මාර්ගයට බටයක් දමා පහසුවෙන් ගලි බවුසර් හැලීම සඳහා සකස් කර ගැනීමේ හැකියාවක් මේ පුද්ගලයාට ඉදිරියේදවී හිමි වනු ඇති බවත් පෙන්වා දෙන ලදී. එම නිසා අදාල වාර්තාවන් වලට මේ පුද්ගලයා පෙර අවස්ථාවකදී මෙවැනි වරදක් සිදු කර ඇති බව දන්වා යැවුව හොත් ඒ සම්බන්ධයෙන් පරීකෂා කරන නිලධාරීන් වැඩි අවධානයකින් ඒ කාර්ය සිදු කරනු ඇති බව පෙන්වා දෙන ලදී. පෙර සඳහන් වූ ආකාරයටසභාවේ සිදු කරන යම් යම් ක්‍රියා මාර්ග පිළිබඳව ජනතාව අතර යහපත් ප්‍රසාදයක් නැති බවත් ඒවා සභාව මගින් තහනම් කළත් වෙනත් ක්‍රම වලට ඒවා ඉටු කර ගන්නා බවට ඔවුන් ප්‍රකාශ කරන බැවින් සභාවක් ලෙස මේ කරුණු සම්බන්ධනේ මීට වඩා අවධානය යොමු කර කටයුතු කරන්නේ නම් වඩාත් සුදුසු බවට තමන් අදහස් කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා ප්‍රකාශ කළ අටුළුගම ස්ථානය පරීක්ෂා කිරීම සඳහා තමන්ද ගිය බවත් එහිදීත් අදාල ස්ථානයේ පවතින අඩුපාඩු පෙන්වා දී තමන් වෙනත් කාර්යක් සඳහා පිටත්ව ගිය පසු අදාල වයාපාරිකයන් කඩුවක් ත්‍රී රෝද රථයක දමාගෙන තමන් සොයමින් ගොස් ඇති බවට ආරංචි වූ බව පැවසීය. එසේම ස්ථාන පරීක්ෂණයක් සඳහා සභාව නියෝජනය කරමින් ගිය අවස්ථාවක අදාල සිදු වීම සම්බන්දයෙන් සභාව ගනු ලබන අපක්ෂපාතී තිරණයට පටහැනිව ව්‍යාපාරිකයන්ගේ පැත්ත ගෙන ඇතැම් මන්ත්‍රීවරුන් ක්‍රියා කරන්නේ නම් ඒ පිළිබඳව කණගාටු වන බවත් එයින් සභාව තව තවත් අපකීර්තියට පත් වීම මෙන්ම කමිටුවක් ලෙස පොදු තීරණයක් ගැනීමට නොහැකි තත්වයක් උදා වන බව පවසා සිටින ලදී.

(උ) 2022 ජූනි මාසයට අදාල එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව (ඇමුණුම 06) හා වියදම් විස්තරය (ඇමුණුම 07) 2022 දෙවන කාර්තුවේ ආදායම් සහ වියදම් සාරාංශ සලකා බැලීම (ඇමුණුම 08)

**(ඍ) වෙනත් කරුණු:**

**ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් ඉදිරිපත් කිරීම:**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා:**

තමන් මේ සභාවට තේරී පත් වී වසර 04 ක කාලයක් ගත වී ඇති බවත් ඒ කාලය තුළ යෝජනා විශාල සංඛ්‍යාවක් තම කොට්ඨාසය වෙනුවෙන් සභාවට ඉදිරිපත් කළ බවත් නමුත් අද වන තෙක් කිසිදු යෝජනාවක් ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොලැබුණු බව පවසා සිටියේය.වසර හතර අවසානයේ ලබා දී ඇති සභා වාර්තා පමණක් තමන් සතු වන බවත් මහජනතාවට ඔවුන්ගේ අවශ්‍යතා වෙනුවෙන් තමන් සභාවේදී කතා කළ බව පෙන්වීම සඳහා ඇති එකම සාක්ෂිය මෙය පමණක් බවත් පැවසීය. තමන් පෙන්වා දුන් කරුණු සත්‍යදැයි පරීක්ෂා කිරීමටවත් අද වන තෙක් එකදු නිලධාරියෙකු හෝ තම වසමට පැමිණ නැති බවත් සීතා විද්‍යාල පාරේ ඊයේත් අනවසර ඉදි කිරීමක් සිදු කරන බවත් ඒවා නොදැක්කා සේ පැමිණිමට සිදු වී ඇති බවත් පැවසීය. අනවසර ඉදි කිරීම් දින දෙක තුනක් වැනි කෙටි කාලයක් ඇතුලත සිදු කර අවසන් වන බැවින් ඊට පසුව ඒවා පරීක්ෂා කිරීමට ගියත් කඩා දමන ලෙස පැවසීමට හැකියාවක් නොමැති බව පෙන්වා දෙන ලදී. තල්දූව සති පොළේ පෙනී පෙනී තහඩු ගලවාගෙන යන බවත් එහි වැටේ කම්බිකූරු කැබලි කඩාගෙන යන බවත් පැවසූ එතුමා අඩු තරමින් ඒ ස්ථානයට මුරකරුවෙකු යෙදවීමට හෝ කටයුතු කර නැති බව පැවසීය. සභාවෙන් ඉවත් වූ දිනක හෝ නිදහසේ නිවසට වී ගත කිරීමටවත් ඉඩ නොලැබෙන ලෙස කොට්ඨාසයේ ජනතාවගෙන් බැණුම් ඇසීමට දිනක සිදු වනු ඇති බව පැවසූ එතුමා තමන් විසින් වසර ගණනාවක් පුරා යොමු කරන ලද එකදු යෝජනාවක් සම්බන්ධයෙන් හෝ අවධානය යොමු නොකිරීම පිළිබඳව කණගාටුවකින් සිටින බවත් වරිපනම් ගෙවනු ලබන ජනතාව විසින් වීථි පහනක් දමා දෙන ලෙස සිදු කරන ලද ඉල්ලීමක් පවා ගණන් නොගන්නා තත්වයකට පත්ව ඇති බව පැවසූ එතුමා සභාපතිතුමාට චෝදනා නොකරන බවත් නමුත් සියළුම මන්ත්‍රීවරුන්ද මේ සිදුවන සිදුවීම් හේතුවෙන් සිටින්නේ දැඩි කළකිරීමකින් බව පැවසීය. මහජනතාවගේ එම කළ කිරීමේ උච්චතම අවස්ථාව නිසා පසු ගිය සතියේ ගරු ජනාධිපතිතුමාටද ඊට පෙර ගරු අගමැතිතුමාටද ධූරයෙන් ඉවත් වීමට සිදු වූ බව පෙන්වා දුන් එතුමා ගම් ප්‍රදේශවල දුප්පත් ජනතාව සමෘද්ධිය මඟින් , වැඩිහිටි දීමනාවෙන් යම් සාධාරණයක් වනු ඇති බවටත් පත් වූ රජයෙන් ගමට සේවයක් වනු ඇති බවටත් බලාපොරොත්තු වූ බවත් ඒ කිසිවක් සිදු නොවූ තැන අවසානයේ ආණ්ඩුවටත් මේ ඉරණම අත් වූ බව පවසා සිටියේය. ගම නොහදා කිසිම විටෙක රට හැදිය නොහැකි බව ඔප්පු වී ඇති බවත් ගම් මට්ටමින් සිදු වන සංවර්ධනය දියුණුව දෙස ජනතාව බලා සිටි බවත් ඒ කිසිවක් ජනාධිපතිතුමාගෙන් ඉටු නොවූ බවත් පැවසීය. දැනටත් සහනාධාර ලබා දීමේදී අසාධාරණකම් සිදු වන බවත් තමන් මහා සභා රැස්වීමේ සිටින අතරතුරත් අසාධාරණ අයුරින් සහල් බෙදා හරින බව පවසා දුරකථන ඇමතුම් විශාල ප්‍රමාණයක් පැමිණි බව පැවසීය. මහජනතාව ඉතාමත් විනයානුකූල පසුබිමක් තුළ මේ රට ගොඩ නඟනු ඇතැයි බලාපොරොත්තුවෙන් ජනාධිපතිතුමා බලයට පත් කළ බව පැවසූ එතුමා වරෙක එක්තරා පුද්ගලයෙකු “ අප ඡන්දය ලබා දුන්නේ මහ පාරක කෙළ බිඳක් හෝ ගැසීමට අවකාශයක් නොලැබෙනු ඇතැයි යන බලාපොරොත්තුවෙන් බව තමන් සමඟ ප්‍රකාශ කළ බව සිහිපත් කළ එතුමා නිවැදි තීන්දු තීරණ ලබා නොගැනීමේ අවසාන මේ ආකාරයෙන් විසඳුනු බැවින් ඉදිරියේදී පළාත් පාලන ආයතනය ලෙස අප ගත යුතු තීරණ නිවැරදි ආකාරයෙන් ලබා ගෙන ජනතාවට සහයක් වීමට ක්‍රියා කරමු යැයි පවසා සිටියේය. කොළඹ දෙසට යෑමට ඇති එකම විකල්ප මාර්ගය වන සීතා විද්‍යාල මාවතේ ඊයේ දිනයේදීත් දෙමහල් ගොඩනැඟිල්ලක් සෑදීමේ කටයුතු සිදු කළ බවත් මාර්ගය දෙපස විශාල වශයෙන් අනවසර ඉදි කිරීම් රැසක් දක්නට ඇති බවත් පෙන්වා දෙන ලදී. පාසල අසල ඇති ගැටළුව සම්බන්ධයෙන් මීට පෙරත් සභාව දැනුවත් කළ බවත් ප්‍රදේශවාසීන් විසින්ද අවස්ථා කීපයකදී දුරකථන මාර්ගයෙන් සභාපතිතුමාට එම කරුණු පැවසුවද ඵලක් නොවූ බව පැවසීය. හැකියාවක් ඇත්නම් මාසයකට වතාවක් හෝ මේ වසම් 39 නියෝජනය වන ලෙස ස්ථාන පරීක්ෂණ සඳහා නිලධාරියෙකු යොමු කරන ලෙසත් මොන තරම් අසාධාරණ සිදු වන්නේද යන්න සම්බන්ධයෙන් එහිදී අවබෝධ කර ගත හැකි වනු ඇති බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා:**

ගරු මන්ත්‍රී පතිරණ මැතිතුමා ප්‍රකාශ කළ කරුණු වල සත්‍යතාවයක් ඇති බවත් සභාවේ සහය අවශ්‍ය කරුණු වලදී බලාපොරොත්තු වන ප්‍රතිචාර නොලැබී යාම මත මහජන නියෝජිතයන් වශයෙන් අප විශාල අපහසුතාවයකට ලක්වන බවත් පැවසීය. මීට දින කීපයකට පෙර මේ සභා ගොඩනැඟිල්ල අසල මාර්ගයේ තම පියාගේ වයසට සමාන වයසක පුද්ගලයෙකු ක්ලාන්ත වී වමනය ගොස් සිහිසුන්ව ඇද වැටී සිටි බව තමන් සභාවට පැමිණෙන අවස්ථාවේදී දුටු බවත් ඒ මොහොතේදී තමන් ගරු සභාපතිතුමා වෙත උදව්වක් ලබා දෙන ලෙස ඉල්ලා පැමිණි අතර එම පුද්ගලයා රෝහල් ගත කිරීමට කටයුතු කරමුයැයි පැවසූ අවස්ථාවේදී එම වගකීම සභාවට ගත නොහැකි බවට ප්‍රකාශ කළ බව පැවසීය. ඉන් පසු පොලීසියට කතා කර ඒ බව දැනුම් දිය හැකි බව පැවසූ බව සිහිපත් කළ එතුමා සභාව සතුව ගිලන් රථයක් තිබියදී එය මේ ස්ථානයේ නිරන්තරයෙන් නවතා තිබෙන බව අවට මිනිසුන්ද ඕනෑ තරම් දැක ඇති බවත් නමුත් පෙර සඳහන් කරන ලද අසරණ රෝගියා රෝහලට රැගෙන යාමට එය යොදා ගැනීමට නොහැකි වූ බව කණගාටුවෙන් වුවද ප්‍රකාශ කළ යුතු බව පැවසීය. තමන් ගරු සභාපතිතුමාට කතා කර තරප්පු පෙළ බැස පහතට යන විට පොලිස් යතුරුපැදියක් එම ස්ථානයට පැමිණි බවත් නමුත් බලාපොරොත්තු වූ ආකාරයේ සහයක් එයින් නොලැබුණු බවත් පැවසීය. පසුව තමන් විසින් 1990 ගිලන් රථ සේවයට කතා කළ බවත් පැය භාගයකට පමණ පසු එම ගිලන් රථය පැමිණ රෝගියා රෝහලට රැගෙන ගිය බවත් පැවසූ එතුමා පසු දින තමන් නගරයට පැමිණි අවස්ථාවේදී අදාල රෝගියා ප්‍රතිකාර ලබා ගෙන නැවත පැමිණි බව දැන ගත් බව පැවසීය. ඇත්ත වශයෙන්ම ඒ සිදුවීම සිදු වන මොහොතේ ඒ අවට සිටි පිරිසට සභාව පිලිබඳව විශාල කණගාටුවක් ඇති වූ බවත් තමන් සාවේ සහය ලබා ගැනීමට කටයුතු කරන්නම් යැයි පවසා ඉහල මහලට දිව එන අයුරු ඒ සියළුදෙනාම බලා සිටි බවත් පැවසීය. ඒ මොහොත වන විටත් රැකියා ලක්ෂයේ වැඩ සටහන යටතේ බඳවා ගත් සේවක පිරිස් කාර්යාලය පරිශ්‍රය අවට සිටි බවත් ඔවුන්ගෙන් හෝ සභාව සතු ගිලන් රථයෙන් ප්‍රයෝජනයක් ලබා ගැනීමට නොහැකි නම් මේ සභාවෙන් ඇති ප්‍රයෝජනය කුමක්ද යන්න සිතෙන බව අසාධාරණ නොවන බව පැවසීය. සියලුම කාර්යන් සංකල්ප වලට පමණක් සීමා වී ඇති බවත් ජනතාව ආරක්ෂා කිරීමට පැමිණි ජනාධිපතිවරයා මේ වන විට ආරක්ෂාව තකා පළා ගොස් ඇති රටක මීට වඩා යමක් බලාපොරොත්තු විය නොහැකි බව පැවසීය. මේ සභාවට තේරීපත් වීම සඳහා ගම් නියම්ගම් වල ඔබතුමන්ලා සමඟ ඇවිද ගිය ඡන්දය ලබාදුන් ජනතාව අසරණ වන අවස්ථාවේදී පිළිසරණක් වීමට නොහැකි නම් ඒ සම්බන්ධයෙන් කණගාටු විය යුතු බවත් පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව:11.30)

රාජපක්ෂවරු විසින් අද වන විට රටේ ආර්ථිකය පමණක් නොව සදාචාරය සභ්‍යත්වය, සංස්කෘතිය ආදී සියල්ලක්ම විනාශ කර ඇති බව පැවසූ එතුමා මේ පලාත්පාලන ආයතන වලට හිමි සීමිත කාලසීමාවේදීවත් බල ප්‍රදේශයේ ජනතාවට සහනයක් ගෙන දෙන අයුරින් ක්‍රියා කරමු යැයි ඉල්ලා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

රෝගි වූ පුද්ගලයෙකු සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා පැමිණ තමන් දැනුවත් කළ බවත් ඒ අවස්ථාවේදී තමන් විසින් දෙහිඕවිට පොලිස් ස්ථානාධිපති දැනුවත් කළ අවස්තාවේ ගිලන් රථයේ රෝගියා රැගෙනගියත් පුහුණු ප්‍රථමාධාර ලබා දීමේ හැකියාව ඇති කිසිවෙකු නොමැති බැවින් 1990 ගිලන් රථ සේවයට කතා කොට රෝගීයා පිටත් කිරීම වඩාත් යෝග්‍ය බව පැවසූ බවත් ඒ සඳහා අවශ්‍ය වැඩපිළිවෙල ඔහු විසින් සිදු කරන බව පැවසූ නිසා ඒ කාර්ය සිදු කිරීමට අවස්තාව සලසා දුන් බව පවසා සිටියේය. 1990 ගිලන් රථ සේවාව තුළ පුහුණු කාර්ය මණ්ඩලය සහ මූලික ප්‍රථමාධාර තිබෙන බැවින් අවස්ථාවෝචිතව වඩාත් සුදුසු කාර්ය එය බව පැහැදිලි වූ බවත් පොලිස් ස්ථානාධිපති එම වගකීම භාර ගත් බැවින් තමන් නැවත මැදිහත් නොවූ බව පවසා සිටියේය.

**ගරු ප්රාදේශීය සභා මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා:**

ඒ සඳහා පොලිස් ස්ථානාධිපතිතුමා සම්බන්ද නොවූ බව තමන් වගකීමෙන් ප්‍රකාශ කරන බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එය තමන් නොදන්නා බවත් 1990 ගිලන් රථයේ රෝගියා රැගෙන යාම වඩාත් සුදුසු බවට තමන්ට පැවසූ බැවින් ඒ ආකාරයට සිදු කිරීමට අවස්තාව සලසා දුන් බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

වර්තමාන රජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අද වන විට රටෙන් පිටව ගොස් ඇති බවත් 13 වෙනි දින වන විට ජනාධිපති ධූරයෙන් ඉවත් වීම ඒ ආකාරයෙන්ම සිදු වේද නොඑසේ නම් ඒ සඳහාත් යම් උපක්‍රමයක් අනුගමනය කරනු ඇතිද යන ගැටළුව පවතින බව ප්‍රකාශ කර සිටියේය. අද දින මන්ත්‍රීවරුන් පිරිසකගේ එකඟත්වයෙන් සර්ව පාක්ෂික රජයක් පිහිටුවන ලෙස යෝජනාවක් ගෙන ආවේ සද්භාවයෙන් බවත් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලයට පැමිණෙන විට හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට චෝදනා එල්ල කළත් අද වන විට ඔහු සමත් වී ගෝඨාභය ජනාධිපතිවරයා අසමත් වී ඇති බවත් එය මුළු රටම පිළිගන්නා කරුණක් බවට පත්ව ඇති බවත් ,එතුමාගේ කාලයේදී හඳුන්වා දුන් 1990 ගිලන් රථ සේවයේ ඇති කාලීන වටිනාකම මීට සුළු මොහොතකට පෙරත් සාකච්ඡා වූ බවත් පෙන්වා දෙන ලදී. ගරු මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා සෑම අවස්ථාවකම ඍජුව තම අදහස් ප්‍රකාශ කරනු ලබන මන්ත්‍රීවරයෙක් ලෙස තමන් මීට පෙරත් හඳුන්වා දී ඇති බවත් අද දිනයේ එතුමාගේ කතාවෙන් එය වඩාත් තහවුරු වූ බව පවසා සිටියේය. වර්තමාන රජය අසාර්ථකත්වයට පත් විමට ඉහළ තනතුරු සඳහා පත් කරන ලද නිලධාරීන්ද වගකිව යුතු බවත් සතොස ආයතනයේ අසරණ ජනතාවට අඩු මිලට ලබා ගැනීම සඳහා රජයෙන් ලබා දෙන භාණ්ඩ කළුකඩ ව්‍යාපාරිකයන් වෙත ලබා දීමේ වංචනික ක්‍රියා වලින්ම මේ කරුණු සනාථ වන බව පවසා සිටියේය. එවැනි ක්‍රියා සිදු වීමට හැර බලා සිටින්නේ නම් ජනාධිපතිවරයා, ආණ්ඩුව මෙන්ම නගරයේ ප්‍රධාන පුරවැසියාද අසමත් වී ඇති බව පවසා සිටියේය. එසේම එක්තරා සභාවක වසර 3 ක් තිස්සේ සේවයට බඳවා ගත් පුද්ගලයෙකු අද වන විට සේවයට වාර්තා නොකරද වැටුප් ලබා ගැනීමේ තත්වයක් උද්ගත වී ඇති බවත් මේ සභාවේ එවැනි දෑ සිදු නොවුන ඇති බවට තමන් විශ්වාස කරන බවත් පවසා සිටියේය. අදාල සේවකයාට සේවයට වාර්තා කරන ලෙස ලේකම්වරයා විසින් නිරන්තරයෙන් දැනුම් දුන්නද එය නිසි ලෙස සිදු නොවන බවත් තමන්ට අදාල රාජකාරිය සිදු නොකර වැටුප් ලබා ගන්නා මෙම සේවකයා වෙනත් කාර්යන් සඳහා රාජකාරි කාලය අතරතුර ගොස් එම වැඩකටයුතු සඳහා සහය ලබා දීමේ තත්වයක් ඇති වී තිබෙන බව පවසා සිටියේය.මේ හේතුව නිසා අපගේ සභාවේද මෙවැනි කාර්යන් සිදු වන්නේද යන්න සම්බන්ධයෙන් සොයා අනෙකුත් සභා වලින් ප්‍රකාශ කරන බැවින් මේ කාර්යාලය තුළද එවැනි කාර්යන් සිදු වී ඇත්නම් මීළඟ මහා සභා රැස්වීමේදී ඒ සම්බන්ධයෙන් සොයා බලා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත් එසේ සිදු වී නොතිබේවා යන්න තමන් ප්‍රාර්ථනා කරන බවත් පවසා සිටියේය. එසේම මේ සභාව තුළ සභාකවරු ප්‍රකාශ කරන කරුණු සභාව අවසන් වීමටත් පෙර සභා ගර්ඝයෙන් පිටතට ගොස් ඇති බව පැවසූ එතුමා අ දින පරිසර හා පොදු පහසුකම් කරක සභාව සම්බන්ධයෙන් කති කිරීමේදී අදාල නිලධාරීන් සම්බන්ධයෙන් ප්‍රකාශ කළේ පෞද්ගලිකව ඔවුන් අරමුණු කරගෙන නොවන බවත් ඇතැම් විට එම නිලධාරියාත් ඒ සම්බන්ධයෙන් නොදැන කවුරුන් හෝ මැදිහත්වී මධ්‍යම පරිසර අධිකාරියෙන් අදාල ලිපිය ලබා ගෙන තිබිය හැකි බව පැවසීය. මේවා මුදල් වියදම් කිරීමෙන් සිදු කර ගැනීමට ඕනෑතරම් අවස්ථා තිබෙන බවත් පෙන්වා දෙන ලදී. අටුළුම සිදුවීමේදීත් ප්‍රථමයෙන් වෙළඳ බලපත්‍රයක් ලබා දී එම වරද සිදු කර ඇත්තේ සභාවෙන්ම බවත් නැවත එය අලුත් කිරීමට පැමිණි පසු ගැටළුව ඉස්මතු වූ බව පැවසීය. තමන් සෑම විටම කතා කරන්නේ ප්‍රදේශයට බලපාන ගැටළු බැවින් මේ සිදුවන ව්‍යසනයන් පිළිබඳන නිරන්තරයෙන් දැනුවත් කළ බව පෙන්වා දෙන ලදී. බල ප්‍රදේශය තුළ සතොස ආයතන කීපයක් පවතින බවත් ඒවායේ මේ ආකාරයෙන් අකටයුතුකම් සිදු වන බව තමන් සභා රැස්වීම් ගණනාවකදී පෙන්වා දී ඇති බව පැවසීය.

1993 ට පෙර මේ රට කොරම් දියුණුව තිබුණාද යන්නත් ඒ යුගයේදී සමුපකාර මඟින් සාමාන්‍ය ජනතාවට අවශ්‍ය සියළුම ආහාරද්‍රව්‍ය පහසුවෙන් හිඟයකින් තොරව ලබා ගැනීමේ හැකියාව තිබූ බවත් සිහිපත් කර සිටියේය. නමුත් අද වනවිට ඒ සියල්ල නැති වී ගොස් ඇති බවත් අප අසාර්ථක වූයේ කෙතාතනින්ද යන්න වමසා බැලිය යුතු බවත් පෙන්වා දෙන ලදී. අද වන විට පක්ෂ දේශපාලනයෙන් ඔබ්බට ගොස් සිතන පිරිසක් බිහි වී තිබීම පිළිබඳව සතුටු වන බවත් ඒ ක්‍රමවේදය තුළ සිට සභාවක් ලෙස අද දිනයේ සම්මත කර ගත් යෝජනාව සම්බන්ධයෙන් සැබවින්ම සතුටු වන බවත් ඒ සඳහා විරුද්ධ වීමට කිසිදු මන්ත්‍රීවරයෙකු නොසිටීම මත මේ සභාව තුළ දේශද්‍රෝහීන් නොහැකි බවට නිහතමානීව සතුටු විය හැකි බව පවසා සිටියේය. අද වන විටත් සැබෑ අරගලය ඉස්මතු වී නොමැති බවත් එය පැමිණියේ හොත් 1970 ගණන් වල 80 ගණන් වල සිදු වූ ආකාරයේ මහා ව්‍යසනයක් සිදු විය හැකි බව පෙන්වා දෙන ලදී. මේ වන විට රණ විරුවන් මෙන්ම පොලිස් නිලධාරින්ද තම වාහන නවතා සක්‍රීයව අරගලයට එකතු වූ ආකාරය රූපවාහිනියෙන් දුටු බවත් අගමැති රනිල් වික්‍රමසිංහ සහ ජනාධිපති සිය ධූර වලින් ඉවත් නොවුනහොත් මේ රට ලේ විලක් බවට පත් වනු ඇති බවත් පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා සභාවට පැමිණෙන ලදි. පෙ:ව:11.44)

යම් ලෙසකින් ඔවුන් ධූරවලින් ඉවත් නොවුනහොත් මේ සභාවේ මන්ත්‍රීවරුන් 34 දෙනා ලෙස එකාවන්ව ඒ සඳහා විරුද්ධත්වය ප්‍රකාශ කර මෙකී ක්‍රමවේදය වෙනස් කිරීමට පුරෝගාමී වූ පළාත් පාලන ආයතනයක් ලෙස ඉතිහාස ගතවමු යැයි සියළු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරන බවත් යම් ලෙසකින් සර්ව පාක්ෂික රජයක් බිහිකළහොත් මේ පළාත් පාලන ආයතන ඉක්මණින් විසුරුවා හැරීමට ඉඩ ඇති බවත් එසේ වුවත් අප සියල්ලන්ගේම බලාපොරොත්තුව සර්ව පාක්ෂික රජයක් බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

ඇතැම්විට මේ මහා සභා රැස්වීම පළාත් පාලන මන්ත්‍රීවරයෙක් ලෙස තමන් සහභාගී වන අවසන් මහා රැස්වීම මෙය විය හැකි බවත් 2006 සිට මේ වන තෙක් තමන් දේශපාලනය සිදු කළ බවත් ඒ කාලය පුරාවටම ජනතාව සමඟ ඉතාමත් සහයෝගයෙන් කටයුතු කළ බවත් පැවසීය. තමන්ගේ මන්ත්‍රී ජීවිතය තුළ තමන් දුටු අව්‍යාජ අවංක සභාපතිවරයා ගරු සභාපති දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ. පියරත්න මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 11.48)

අනෙක් සභා වාර වලදී සිදු වූ අකටයුතුකම්, දූෂණ , ආදී දෑ පිළිබඳව අප අත්විඳ ඇති බවත් කාලයක් තමන්ට සහ ගරු මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමාට සැලසුම්සහගතව පහර දීමට ක්‍රියා කළ අවස්ථා තිබූ බවත් සභාව තුළ සම්මත කර ගන්නා යෝජනා පිළිබඳව විරුද්ධ වන අවස්ථා වල ඒ සඳහා ප්‍රමුත්වය ගැනීම මෙයට හේතු වන බවත් පෙන්වා දෙන ලදී. මේ කාල සීමාව තුළදී මහා පරිමාණයේ සංවර්ධන කටයුතු සිදු කිරීමට වර්තමාන සභාපතිවරයාට අවස්ථාව නොලැබුණු බවත් නමුත් වසම් වල ජනතාවගේ වීථි පහන් අලුත්වැඩියා කර දීම, ඔවුන් ගමන් ගන්නා මාර්ග වල කැඩී ඇති බෝක්කු සකස් කර දීම සේම ජේ.සී.බී.යන්ත්‍රය යොදාගෙන ඒවා සකස් කර දීම ආදී ගමේ මූලික අවශ්‍යතා බොහොමයක් සකස් කර දීමට ක්‍රියා කළ බව පවසා සිටියේය. එසේම පසුගිය කාලයේ කොරෝනා රෝගය ව්‍යාප්ත වූ කාලයේදී තමන්ගේ වසමේ එක්තරා පවුලක කොරෝනා ආසාධනය වූ පුද්ගලයෙකු තම දරුවන් විසින් පවා රෝහලට ගෙන යාමට බියක් දැක් වූ අවස්ථාවේදී ගරු සභාපතිතුමා විසින් සභාවේ ගිලන්රථය උපයෝගී කරගෙන රෝහල්ගත කිරීමට කටයුතු කළ බව සිහිපත් කර සිටියේය. එම නිසා ගරු සභාපතිතුමා කිසිදු පෞද්ගලික ලාභ අපේක්ෂාවකින් තොරව සිය සේවාව උපරිමයෙන් මේ බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සිදු කළ අවංක නිහතමානී නායකයෙකු බව ප්‍රකාශ කර සිටියේය. අද වන විට රාජපක්ෂවරු පැමිණි පසු ආර්ථිකය විනාශ වූ බවට බහුතරයක් පිරිස චෝදනා කරන බවත් නමුත් රටට නිදහස ලැබුණේ ඊට පෙර බවත් රටට විවෘත ආර්ථිකය හඳුන්වා දුන්නේ ඊටත් පෙර බවත් පැවසූ එතුමා වැඩිහිටියන් ලෙස අප මේ කර්කශක ජීවන රටාව සමඟ පොර බැදීමට තරම් ශක්තිමත් ලෙස ජීවිත කාලයේ අත්දැකීම් ලැබූ බවත් නමුත් අපගේ දරුවන්ට මේ අභියෝග විඳ දරා ගැනීමට තරම් මානසික මට්ටක් නොමැති පිරිසක් බවත් පවසා සිටියේය. ඒ තත්වයට වගකිව යුතු වන්නේ අවසානයට මේ රට පාලනය කළ පාලකයන්

බවත් අප එය පිළිගත යුතු කරුණක් බවත් පවසා සිටියේය. මහා ලොකු උගතුන් යැයි කියා ගන්නා පිරිසක් මේ තනතුරු වලට පත් කර ගැනීමට අපද මූලික වී ක්‍රියා කළ බවත් එය අප අතින් සිදු වූ බරපතල වරදක් බව පිලිගත යුතු බවත් පවසා සිටියේය. අප ඡන්දය දී පත් කර ගත් නායකයන්ට අපට අවශ්‍ය ආහාර ටික ලබා දීමට නොහැකි නම්, අවශ්‍ය ඉන්ධන සහ අනෙකුත් පහසුකම් මෙන්ම අපගේ ආරක්ෂාව ලබා දිය නොහැකි නම් එවැනි පිරිසක් තවදුරටත් බලයේ තබා ගැනීම අවශ්‍ය නොවන බව පවසා සිටියේය. සේනාධි නායකයෙකු ලෙස කටයුතු කරන පුද්ගලයෙකුට මේ අවශ්‍යතා සපුරාලිය නොහැකි නම් එවැනි අයගෙන් වැඩක් නැති බවත් අවංකවම රාජපක්ෂවරු සමඟ දේශපාලනයේ නිරත වීම සම්බන්ධයෙන් තමන් ඉතාමත් කණගාටු වන බව පවසා සිටියේය.මින් ඉදිරියට දේශපාලනය කළත් පුද්ගල දේශපාලනය සිදු නොකරන බවත් පැවසු එතුමා රනිල් වික්‍රමසිංහ මහතා අද අගමැති ධූරයෙන් ඉවත් විය යුතු බවත් එසේ නොවුනහොත් හෙට දිනයේ සිට ඔහු ජනාධිපතිවරයා ලෙස තෝරා පත් කර ගැනීමකින් තොරවම පත් වන බව පැවසීය. අරගලය සම්බන්ධයෙන් පසු ගිය කාලයේ විවිධ ප්‍රකාශ නිකුත් වූ බවත් ඒ කෙසේ වෙතත් මේ අරගලය සාමකාමී කැරැල්ලක් බවත් එය අප පොත් පත් වලින් කියවා ඇති ආකාරයේ කැරැල්ලක් නොව පුදුමාකාර සාමකාමී කැරැල්ලක් බව ප්‍රකාශ කර සිටියේය. ඔවුන් පියවරින් පියවර ජනාධිපති මන්දිරය , අරලිය ගහ මන්දිරය, ජනාධිපති ලේකම් කාර්යාලය ආදී සියළුම රජයේ ප්‍රධාන ආයතන මහජනතාව යටතට පත් කර ගත් බවත් අවසානයේ ජනාධිපතිවරයාට සිය නිළ නිවස හැර යාමට සිදු වූ බවත් පැවසීය. මේ අවස්ථාවේ ව්‍යවස්ථාදායකය අල්ලා ගනී යැයි බලාපොරොත්තුවක් සහිතව අප බලා සිටි බවත් එයත් සිදු විය යුතුව තිබූ බව තමන් විශ්වාස කරන බව පැවසීය. එය සිදු කළා නම් මේ 225ම ගෙදර යවා අලුතින් රජයක් පිහිටුවීමට අවස්ථාව උදා වන බව පෙන්වා දෙන ලදි. අද වන විට මේ පක්ෂ දේශපාලනය අවසන් විය යුතු බවත් ඒ කිසිදු නායකයෙකුට සාමාන්‍ය ජනතාව විදින දුක පිළිබඳව කිසිදු සානුකම්පිත බවක් නැති බවත් එසේ වන්නේ ඔවුන් කිසිවෙකු පෙට්‍රල්, ඩීසල් නොමැතිව හෝ එදිනෙදා පරිභෝජනයට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය නොමැතිව පීඩා විද නැති බැවින් බව පෙන්වා දෙන ලදී. අද වන විට තමන් යතුරුපැදියෙන් සිය දරුවන් පංති සඳහා රැගෙන යන්නේ පෙට්‍රල් වලට භූමිතෙල් කලවම් කර බවත් ඇතම් අවස්ථා වල මිනිසුන් තමන් මහජන නියෝජිතයෙක නිසා කුමන හෝ ක්‍රමවේදයකින් ඉන්ධන ලබා ගන්නා බවට සිතා ඒ සම්බන්ධයෙන් විමසීම් කරන අවස්ථාද තිබෙන බව පැවසීය. තමන් එලෙස දරුවන් රැගෙන යන විට ඇතැම් පියවරුන් පාපැදියෙන් සිය දරුවන් පංති සඳහා රැගෙන යන ආකාරය තමන් දකින බවත් ඒ දර්ශන දකින විට ඇති වන කණගාටුව වචනයෙන් විස්තර කළ නොහැකි බව පැවසීය. අප විසින් ඡන්දයෙන් පාලකයන් පත් කර ගෙන පසුව මේ ආකාරයට දරුවන්ට දුක් විදීමට සිදු වන්නේ නම් එය සිදු නොවිය යුතු කරුණක් බව පැවසීය. එම නිසා අප තවත් ප්‍රමාද නොමැති බවත් ජනතා දුක නොහඳුනන මේ ව්‍යවස්ථාදායකය පන්නා දමා රටට ආදරය ඇති බුද්ධිමත් උගත් සීමිත පිරිසක් යොදාගෙන මේ රටේ පාලනය ගෙන යාමට කටයුතු කිරීම අත්‍යාවශ්‍ය බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 11.57)

එසේම මන්ත්‍රීවරයා ගරු සේවයක් බවට පත් වීය යුතු බවට තමන් තරයේ විශ්වාස කරන බවත් පළාත් පාලන ආයතන විසුරු නොමැති වුවත් අපගේ ඉන්ධන හා දුරකථන දීමනා නවතා දමන ලෙසත් ඒවා ලබා නොගෙන මේ අර්බුදකාරී අවස්ථාවේ යම් සහයක් වීමට කටයුතු කරමු යැයි පවසා සිටියේය. දේශපාලනයට පැමිනිය යුත්තේ මුදල් ඇති පිරිස් බවත් මුදල් නොමැති පිරිසි පැමිණියහොත් මේ වරප්‍රසාද භාවිතා කරමින් දේශපාලනය ව්‍යාපාරයක් බවට පත් කර ගන්නා බව පැවසීය. මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කල කාල සීමාව තුළ තමන්ට ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් විශාල සහයක් ලැබුණු බවත් ඒ පිළිබඳව ස්තුති වන්ත වන අතර කුමන හෝ අවස්ථාවක යම් සිත් රිදීමක් තමන් අතින් සිදු වූවා නම් ඒ සම්බන්ධයෙන් සමාව ඉල්ලා සිටින බවත් පැවසු එතුමා සභාව තුළ විවිධාකාරයේ තර්ක විතර්ක සමඟ කටයුතු කළත් ඒ කිසිවක් ඉන් පිටතට රැගෙන නොගිය බවත් සියළු දේ සිදු කළේ ජනතාව වෙනුවෙන් යහපත් සේවයක් සැලසීමේ අරමුණින් බව පවසා සිටියේය. ජනාධිපති හා අගමැති ඉල්ලා අස් විය යුතු බවට අප සියළුදෙනා ප්‍රකාශ කරන බවත් ශ්‍රීලාංකික ජාතියක් ලෙස අප මෙම අවස්ථාවේදී සමස්ථ රටවැසියාගේ සුබසිද්ධිය පිළිබදව අවධානය යොමු කළ යුතු බවත් ඒ සඳහා අප විශ්වාසය තබා බලයට ගෙන ආ පුද්ගලයන් යම් යම් කාර්යන් වලදි අසාර්ථක වූ බවත් ඒ අතර එකඟ වි හැකි කාරණා තිබුණු අතර බහුතරයක් ක්‍රියා මාර්ග වලින් ජනතාවට අගතියක් සිදු වීම හේතුවෙන් ඒවාට විරුද්ධ වීමට සිදු වන

බව පැවසීය. යම් ලෙසකින් මේ සභා වාරයේ අවසාන දවස අද වීමට ඉඩ ඇති බවත් එසේ නොමැතිව දීමනා ලබා නොගෙන මන්ත්‍රී ධූරය ගරු සේවයක් ලෙස සලකා ඉදිරි කාලයේ කටයුතු කිරීමට සිදු වුවහොත් ඒ සඳහා දායකත්වය ලබා දී පළාත් පාලන ඉතිහාසයේ නව පරිච්ඡේදයක් සනිටුවහන් කිරීමට මූලික වී ක්‍රියා කරමුයැයි පවසා සිටියේය. එසේම ගෙවන මේ 06 වෙනි සභා වාරය මේ සභා ඉතිහාසයේ තිබූ විනිවිද භාවයෙන් කටයුතු සිදු කරන ලද එකම සභා වාරය ලෙස තමන් හඳුන්වා දෙන බවත් ඒ ගරු සභාපතිතුමා පෞද්ගලිකව තමන් සමග ඇති මිත්‍රත්වය හේතුවෙන් නොවන බවත් පුද්ගලයෙකු ලෙස එතුමා ක්‍රියා කළ ආකාරය හේතුවෙන් බවත් එතුමාගෙන් යම් වෙනසක් අපේක්ෂාවෙන් අප විසින් එතුමා සභාපති වරයා ලෙස පත් කිරිම සඳහා මූලික වී ක්‍රියා කළ බවත් එම කාර්ය 75%කටත් වඩා සාර්ථක ලෙස ගරු සභාපතිතුමා විසින් සිදු කර ඇති බවත් පවසා සිටියේය

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා:**

අද දින සභාවේ මන්ත්‍රීවරු බොහොමයක් මේ මහා සභා රැස්වීම අවසන් මහා සබා රැස්වීම විය හැකි බවට අනාවැකි පළ කරන බවත් නමුත් ව්‍යවස්ථාව අනුව පළාත් පාලන ආයතන වි◌ිසුරුවීමට අලුතින් පත් වන පළාත් පාලන ඇමතිවරයාට පමණක් හැකියාව ඇති බව පැවසීය.

(ගරු මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය , ගරු මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා, ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී.ප:ව: 12.02)

මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු ඇතැම් අවස්ථා වල සභාවට පැමිණ යම් යම් කාරණා සඳහා සභාවේ සහය බලාපොරොත්තු වන බවත් අද දින සුගත් මාධව මැතිතුමා තම කතාවේදී ඒ ආකාරයෙන් සභාවේ සහයෝගය ඉල්ලා සිටි යම් කාරණාවක් පිළිබඳව එක්තරා ආකාරයක කළකිරීමකින් කතා කළ බවත් සභාවෙන් එවැනි උදව්වක් ඉල්ලා සිටි අවස්ථාවක එයට හැකි පමණින් සහය ලබා දීම සභාවෙ වගකීම බව පැවසීය. එම අවස්ථාවේ ගරු සභාපතිතුමා යම් ආකාරයකින් 1990 ගිලන් රථ සේවය ඒ සඳහා යොමු කිරීමට පොලීසය හා සමඟ සම්බන්ධ වී කටයුතු කළා නම් එය අගය කරන බවත් එය සභාවේ වගකීමක් ලෙස සලකසා ක්‍රියා කිරීම සක්‍රීය ලෙස ඒ මොහොතේදීම සිදු වූවා නම් සුගත් මාධව මැතිතුමා ඒ ආකාරයට කළකිරීමකින් කතා නොකරනු ඇති බවත් පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රිනී එච්.අමරාවති මැතිණිය සහ ගරු මන්ත්‍රිනී දිස්නා කුමාරි මැතිණිය සභාවෙන් පිටතට යන ලදී.ප:ව: 12.03)

ගරු මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා සීතා විද්‍යාල මාවතේ මාර්ගයේ අබලන් වී ඇති ස්ථාන සම්බන්ධයෙන් පෙන්වා දුන් බවත් එම ස්ථානයේ යම් ආකාරයක ගැටළු සහගත තත්වයක් පවතින බවත් පැවසීය.කෙසේවෙතත් අප සෑම අවස්ථාවකදීම සභාපතිවරයා සමඟ හා පවතින රජය සමඟ සහයෝගයෙන් කටයුතු කල යුතු බවත් ඒ කාර්ය නිසි ආකාරයෙන් සිදු කර ගන්නා ආකාරය පිළිබඳවත් අවබෝධයෙන් ක්‍රියා කළ යුතු බව පෙන්වා දෙන ලදී. ගරු මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා සඳහන් කරන ලද කරුණු සත්‍ය බවත් අපගේ වසම් වලද අඩුපාඩු තිබෙන බවත් තල්දූව කැ◌ැළණිවැලි ක්‍රීඩාංගනය අසල සිට ඇපලපිටිය දක්වාම මේ ආකාරයට අනවසර ඉදිකිරීම් පවතින බවත් ඒවා සම්බන්ධයෙන්ද ක්‍රියා මාර්ග ගත යුතු බව පැවසීය. නමුත් ඒවා ඉවත් කිරීමට කටයුතු කළ විට කොට්ඨාසයේ මන්ත්‍රීවරුන් දෙදෙනා වන තමන් සහ පතිරණ මැතිතුමා මෙන්ම ගරු සභාපතිතුමාද ජනතාවගේ දෝෂ දර්ශනයට ලක් වන තත්වයක් උද්ගත වී ඇති බව පැවසීය. මේ වන විට තල්දූව ප්‍රදේශයේ මාර්ග සම්බන්ධයෙන් කිසිදු ගැටළුවක් නොමැති බවත් ඇති එකම ගැටළු ඇත්තේ සීතා විද්‍යාල මාවතේ පමණක් බවත් පවසා සිටියේය. සභා අරමුදලින් හෝ වෙනත් ක්‍රමවේදයකින් යම් දායකත්වයක් ලබාගෙන හෝ මේ ගැටළුවට යම් විසඳුමක් ලබා දිය හැකි නම් එය වඩාත් කාලෝචිත වන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

ලංකා දේශපාලන ඉතිහාසයේ සුවිශේෂී වාතාවරණයක් පවතින මොහොතක මේ මහා සභා රැස්වීම පැවැත්වෙන බවත් මානව ඉති◌ිහාසයේ සුවිශේෂී විජයග්‍රහනයක් අද වන විට ලාංකික දේශපාලනයට

ලැබී ඇති බවත් ප්‍රකාශ කර සිටියේය. බලය තිබෙන්නේ ආයුධ මත, බලය ඇත්තේ රජය මත යැයි පැවසූ ප්‍රකාශය අද වන විට ලාංකීය තරුණයින් වෙනස් කර ඇති බවත් බලය ඇත්තේ මහජනතාව මත බවද වන විට ඔප්පු කර තිබෙන බවත් පවසා සිටියේය. පාර්ලිමේන්තුවේ 2/3 ක බලයක් තිබූ රජයක් මේ මිනිසුන් විසින් වෙනස් කළ බවත් අද වන විට මේ සභාව නියෝජනය කරන මහජන නියෝජිතයන්ගෙන් බහුතරයක් දෙනාද අද වන විට මේ ක්‍රමවේදයට අනුගත වී ඇති බවත් නමුත් පවතින සමාජ , ආර්ථික ප්‍රශ්න හමුවේ මේ සියළුදෙනාත් පීඩාවට පත්ව සිටින බව පැවසීය. නමුත් තම දේශපාලන මතය හා නායකයින් හේතුවෙන් සක්‍රියව මේ සඳහා දායක නොවුණත් බහුතරයක් දෙනා මේ අරගලයට සිතින් හෝ සහය දුන් පිරිසක් බව අප විශ්වාස කරන බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රිනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය, ගරු මන්ත්‍රිනී අජන්තා සුමනදාස මැතිණිය සභාවෙන් පිටතට යන ලදී. , ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා සභාවට පැමිණෙන ලදී. ප:ව: 12.10)

අප විසින් මුහුණ දුන් මේ පීඩිත තත්වය අපගේ දරුවන්ට හෝ ඉපදීම ට සිටින දරුවන්ට මෙන්ම අපගේ දෙමාපියන්ට සහෝදර් සහෝදරියන්ට තව දුරටත් ලබා නොදිය යුතුය යන විශ්වාසයෙන් මේ අරගලය සඳහා මිනිසුන් එක් වූ බවත් ඒ අතර යම් දේශපාලන වාසි ලබා ගැනීමේ අරමුණින් මේ අරගලයට සම්බන්ධ වූ යම් යම් කණ්ඩායම්ද සිටි බව පැවසීය. එසේම දේශපාලනය වෙනස් වන බවත් එක් තැනක සියල්ල රැඳී නොපවතින බවත පැවසූ එතුමා රටකට අවශ්‍ය සමෘද්ධිමත් ජනතාවක් බවත් පවතින තත්වය තේරුම් ගෙන ඒ රාමුව තුළ තමන් ක්‍රියා කළ යුත්තේ කුමන ආකාරයකටද යන්න අවබෝධ කරගෙන ක්‍රියා කළ යුතු බව පවසා සිටියේය. අද වන විට මේ සභාවෙ ්මන්ත්‍රීතුමන්ලා අදහස් දක්වන ආකාරයත් ඒ මන්ත්‍රීවරුන්ම මීට මාස දෙකකට පෙර මේ සභාවේදී අදහස් දක්වන ලද ආකාරයත් දෙස බැලූ විට පුදුමසහගත තත්වයක් ඇති වන බවත් මැයි 09 වෙනි දින සිදුවීමෙන් අනතුරුව ස්මාර්ට් ජංගම දුරකථන භාවිතා කරන තරුණ තරුණියන් කිසිදු වගකීමකින් තොරව ක්‍රියා කරන පිරිසක් බවට ප්‍රකාශ වූ බවත් අද වන විට ඒ තරුණ තරුණියන් රටක් වෙනස් කර ඇති බවත් පෙන්වා දෙන ලදී. එසේම ඒ අවස්ථාවේදී තමන් නියෝජනය කළ දේශපාලන පක්ෂයට විවිධ චෝදනා සිදු කළ බවත් ජනතා විමුක්ති පෙරමුණ දේශපාලන ව්‍යාපාරයක් ලෙස අවංකව දේශපාලනයේ නියැලෙන බවත් මේ සමාජයේ පීඩාවට ලක් වූ ජනතාව වෙනුවෙන් පෙනී සිටි බවත් නමුත් අප කිසිදු විටෙක කිසිවෙකුට වෛර නොකරන බවත් පැවසීය. අද දින සභාවේදී දේශපාලනය ස්වේච්ඡා සේවයක් විය යුතු බවට ප්‍රකාශ වූ බවත් සැබවින්ම අද වන විට තමන් ඇතුළු තම පක්ෂයේ බොහොමයක පිරිස් තම රැකියාව පවා දේශපාලනය වෙනුවෙන් කැප කර ඇති බවත් තම දෙමාපියන් උගන්වා විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබා දුන් බවත් ඒ සියල්ල කැප කර දේශපාලනය සිදු කරන්නේ මේ සියළු ප්‍රශ්න සඳහා විසඳුම සොයාගත හැක්කේ එතනින් බව දන්නා නිසා යැයි පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. ප;ව: 12.14)

රාජ්‍ය නිලධාරීන්ට අද වන විට චෝදනා එල්ල වන බවත් නමුත් මේ රාජ්‍ය නිලධාරීන් පාලනය කරන්නේත් දේශපාලඥයා විසින් බව පෙන්වා දුන් එතුමා නිලධාරීන් ක්‍රියාත්මක වන යාන්ත්‍රණ සකස් කරන්නේ ඔවුන් විසින් බව පැවසිය. ගම් වල සිටින කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීනීට මේ රජයන් මඟින් සකස් කර ඇති වැඩපිළිවෙල වන්නේ නිවෙස් වලට ගොස් බීජ පැකට් බෙදා දීම බවත් ඒ ආකාරයෙන් රාජ්‍ය යාන්ත්‍රනයේ බොහෝ කාර්යන් විධිමත් සැලසුමකින් තොරව සකස් කිරීමේ වරද නිලධාරීන්ට පැවරීම සුදුසු නොවන බවත් එයට පවතින රජයන් වගකිව යුතු බව පෙන්වා දෙන ලදී. අන්තර් කාලීන රජයක් පත් වුවහොත් හෝ ඉදිරියේදී පත් වන කුමන රජයකට හෝ චේවා මින් පසු තම අභිමතය පරිදි ක්‍රියා කිරීමට නොහැකි වනු ඇති බවත් ලාංකීය ජනතාව මේ සියළු සිදුවීම් දෙස විමසිල්ලෙන් විචක්ෂනශීලීව බලා සිටින බවත් ඔවුන් තේරුම් ගත යුතු බව පවසා සිටියේය. අපට පෙර සිටි පරපුර මේ සම්බන්ධව අවබෝධ කරගෙන ක්‍රියා කළා නම් අද පරම්පරාවට මේ ආකාරයට ඉන්ධන පෝලිම් වල ගෑස් පෝලිම් වල සිටීමට සිදු නොවනු ඇති බවත් ප්‍රතිකාර ලබා දීම සඳහා ඖෂධ හිඟවීමෙන් අකාලයේ ජීවිත විනාශ නොවූ ඇති බවත් පැවසීය. එම නිසා ඒ පරම්පරාවට වඩා තීක්ෂන බුද්ධියක් ඇති පිරිසක් අද වන විට ජීවත් වන බැවින් ඉදිරියේදී පාලකයන්ට ඔවුන්ට එරෙහිව ක්‍රියා කිරීමට නොහැකි වනු ඇති බව පවසා සිටියේය. එම නිසා තවදුරටත් දේශපාලන කුහකකම් කිරීම හෝ මුග්ධ ආකාරයෙන් පළිගැනීම් සිදු කිරිමට

උත්සාහ නොගන්නා ලෙසත් ඉතිහාසය පෙන්වා වර්තමානය යටපත් කළා සේ ඉදිරියේදී කටයුතු කිරීමට උත්සාහ නොකරන ලෙසත් දේශපාලන නායකයන්ගෙන් ඉල්ලා සිටින බවත් පැවසීය. ජනාධිපති මන්දිරයට හා අරලියගහ මන්දිරයට ඇතුල් වූ අවස්ථාවේදී ඔවුන් ගත කරන ලද සුඛෝපභෝගී ජීවිත සියැසින් දැක ගැනීමට හැකියාවක් තමන්ටද ලැබුණු බවත් අහංසක ජනතාව මෙතරම් දුක් අගාධයක ඇද දමා ඔවුන් ජීවත් වී ඇති ආකාරය ඇත්තෙන්ම පිළිකුල් සහගත බව පවසා සිටියේය. එම නිසා දැන්වත් සියළුම භේද පසෙකලා එකතු වී මේ රට පත්ව ඇති ව්‍යසනයෙන් ගොඩගැනීමට ක්‍රියා කරමුයැයි පවසා සිටි එතුමා එසේ සිදි කළ හොත් අප මියැදෙන මොහොතේ හෝ මේ රට වෙනුවෙන් තම යුුතුකම සිදු කළාය යන ආත්ම තෘප්තිය අපට ඉතිරි වනු ඇති බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා:**

ඉන්ධන ගැටළුව නිසා තමන්ට අද දින රැස් වීමට සහභාගී වීමට යම් තරමක් ප්‍රමාද වූ බවත් පසු ගිය සභා වාර්තාවේ තමන් විසින් මැයි 09 වෙනි දින සිදු වූ සිදුවීම සම්බන්ධයෙන් ප්‍රකාශ කළ බවත් එමඟින් පළාත් පාලන ආයතන අපහසුතාවට පත් වූ බව ප්‍රකාශ කළ බවත් නමුත් රැකියා ලක්ෂයේ තරුණයන් නිසා එලෙස සිදු වූ බවට තමන් විසින් ප්‍රකාශ කළ බව සඳහන් වී තිබෙන බැවින් ්එය නිවැරදි විය යුතු බව පෙන්වි දෙන ලදී. මේ මහා රැස්වීම අවසන් රැස්වීම වෙයිද නොඑසේනම් මේ සභා වාරය තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යාවි දැයි අප නොදන්නා බවත් කෙසේ වෙතත් ගරු සභාපතිතුමා මේ සභා වාරය තුළ සිදු කරන ලද සියළුම සේවාවන් සම්බන්ධයෙන් අගය කරන බවත් විශේෂයෙන්ම කොරෝනා රෝග පාලනයට මෙන්ම වීථි පහන් අලුත්වැඩියා කටයුතු වලදී දුරකථ ඇමතුමක් ලබා දුන් සැනින් ඒ කාර්යන් තහන්ට හැකි උපරිමයෙන් ඉටු කරදිමට ක්‍රියා කළ බව පවසා සිටින ලදී. නාපාවල ප්‍රදේශයේ පසු ගිය කාලයේ සිදු කරන ලද ජල ව්‍යාපෘති වල ජලනළ එළීම සඳහා මාර්ග පළුදු කිරීම් සිදු කළ බවත් ඒ ආකාරයට යාලගම වැවල පාරේ සිට නාපාවල නගරය දක්වා ඇති මාර්ගයේ ජල නළ එළීම සඳහා ජල සම්පාදන මණ්ඩලය විසින් සිදු කළ මාර්ග පළුදු කිරීම් මේ වනතෙක් යථා තත්වයට පත් කර නොමැති බවත් ඒ හේතුවෙන් එම මාර්ගය භාවිතා කරනු ලබන ජනතාව විශාල අපහසුතාවයන්ට ලක්වන බැවින් මේවා යථා තත්වයට පත් කර මාර්ගය නැවත සකස් කර දිමට කටයුතු කරන ලෙස ජල සම්පාදන මණ්ඩලයට දන්වා යවන ලෙස ඉල්ලා සිටින ලදී. පසු ගිය ජූලි 09 වෙනි දින සිදු වූ සිදුවීම දේශපාල වශයෙන් කණගාටුදායක සිදුවීමක් බවත් නායකයන් තම දුර්වලතා අවබෝධ කර නොගැනීම මත මේ තත්වය උද්ගත වූ බවත් පැවසීය . එසේ වුවත් අද වන විට මේ සභාවේ මන්ත්‍රීවරු මේ කරුණ පිලිබඳව යම් අවබෝධයක් ලබාගෙන තිබීම සතුටට කරුණක් බවත් පැවසීය. එසේම ගරු මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා විසින් ධනවත් පුද්ගලයන් පමණක් දේශපාලනයට සම්බන්ධ විය යුතු බවට ප්‍රකාශ කළ බවත් තමන් වෘත්තියෙන් කුළී රථ රියදුරෙකු බවත් නමුත් පළාත් පාලන මැතිවරණයේදී තමන් මැතිවරණ කටයුතු සඳමා වියදම් කලේ රු.5000.00 ක මුදලක් පමණක් බවත් නමුත් දේශපාලන වශයෙන් කිසිදු මුදලක් ජනතාවගෙන් අය කරගෙන නොමැති බව පැවසූ එතුමා ඉදිරි මැතිවරණයකදී වුවත් ජනතා ඡන්දයෙන් නැවත බලයට ඒමේ හැකියාව තිබෙන් බව පවසා සිටියේය. මැතිවරණයක් පවතින කාල වලදී බිම් මට්ටමේ දේශපාලනයට සක්‍රිය දායකත්වය ලබා දුන්නේ කිසිදු ලාභ අපේක්ෂාවකින් නොවන බව පවසා සිටින ලදී. එසේම ගරු මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා සඳහන් කල සීතා විද්‍යාල මාවතේ මාර්ගයේ ඇති ගැටළුව කඩිනමින් විසඳා දීම වඩාත් සුදුසු බවත් තමන් දේශපාලන කටයුතු වෙනුවෙන් විකුණා දමන ලද වෑන් රථය ඊට පෙර පාසල් සේවාවක් සඳහා යොදා ගත් කාලයේදී තමන්ද මෙම ස්ථානයේදී අනතුරකට ලක් වන්නට ගිය බවත් ඒ මාර්ගය වැඩි වශයෙන් භාවිතා කරන්නේ පාසල් දරුවන් බැවින් ඔවුන්ගේ ආරක්ෂාව පිලිබඳව සිතා බලා යම් කඩිනම් විසඳුමක් ලබා දීමට කටයුතු කරන්නේ නම් වඩාත් සුදුසු බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

අද දින මේ සභාවේදී ඇති වූ කතා බහ සම්බන්ධයෙන් තමන්ගේ පෞද්ගලික අදහස ඉදිරිපත් කිරීම සුදුසු බවට තමන් අදහස් කරන බැවින් මේ අවස්ථාවේ නැඟී සිටි බව පැවසීය. අද දින සභාවේ අදහස් ප්‍රකාශ

කළ මන්ත්‍රීවරුන් මේ ජනාධිපතිවරයා සම්බන්ධයෙන් භාවිතා කළ ඇතැම් වචන අතර ඍජු තීරණයක් ගත නොහැකි දුර්වල ජනතා අප්‍රසාදයට පත් වූ නායක්යෙක් ලෙස හදුන්වා දුන් බවත් එවැනි නායකයන් සමඟ ඉදිරියේදී දේශපාලනය නොකරන බවට පැවසූ බවත් සිහිපත් කර සිටියේය. මේ රටේ ජනතාව 2005 ට පෙර සිට මේ ප්‍රකාශය සිදු කළ බවත් නමුත් දේශපාලනයේ නිරත වූ පිරිස් එය අවබෝධ කරගෙන නොසිටි බව පවසා සිටින ලදී. අය වැය කතා ඉදිරිපත් වන අවස්ථා වලදී ඇතැම් මන්ත්‍රීවරුන් අය වැය කතා විස්සකට වඩා සිදු කර ඇති බවට එක් අවස්ථාවක ප්‍රකාශ වූ බවත් ඒ ආකාරයෙන් වසර ගණනාවක් මේ තනතුරු වල එළඹගෙන අත් නොහැර ක්‍රියා කිරීම ලැජ්ජා විය යුතු බව පවසන ලදී. මෙලෙස තනතුරු බදාගෙන සිටිම තුළින් තවත් පිරිසක් සඳහා එම අවස්ථාව අහිමි කරනවා සේම අද වන විට ඒ ආකාරයට ජාතික දේශපාලනයේ සිටි නායකයින් ක්‍රියා කළ ඇති ආකාරයෙන් මොවුන්ට ලැජ්ජාවක් නැති බව පවසා සිටියේය. තමන් ප්‍රබල ශ්‍රී ලංකා නිදහස් පාක්ෂික පවුලකින් පැවත එන මැරයෙකු බවත් නමුත් එම පක්ෂ වල ක්‍රියාකාරික්වය සම්බන්ධයෙන් ඇති වූ කළ කිරීම මත සහ ඒ ප්‍රතිපත්ති වල ඇති කරුණු වලට එකඟ විය නොහැකි විම මත තමන් මේ දේශපාලන ව්‍යුහයට යොමු වූ බව පවසා සිටියේය. පසුගිය කාලය පුරාවටම මේ පාලනයට විරුද්ධව ජනතාව තුළ ඇති වූ විරෝධය වි◌ශාල වශයෙන් පුපුරා ගිය දවසක් ලෙස පසු ගිය ජූලි 09 වෙනි දින හැදින්විය හැකි බව පැවසූ එතුමා මේ කිසිවක් නොඇසෙන ලෙස ඒ ජනාධිපතිවරයා සිය තනතුර රැක ගැනීමට දැරූ උත්සාහයේ අවසන් ප්‍රතිඵලය ඔහු නීතිය තුළ හා ව්‍යවස්ථාව තුළ අසරණ වී බංකර ගත වීමට සිදු වීම බව පවසා සිටියේය. නමුත් මේ රටේ පොදු ජනතාව පොදු ප්‍රවාහනය කඩා වැටී ඇති අවස්ථාවක මෙතරම් ප්‍රශ්න තිබූ මෙහොතක ජනතාව ලක්ෂ සංඛාත ලෙසින් කොළඹට ඇදී ආ බවත් ඒ ඓතිහාසික වෙනස සිදු කිරීම සඳහා සිය දායකත්වයදුන් බවත් පවසා සිටින ලදී. මේ ලොක්යේ ඕනෑම රටක ජනතා මතයට හිස නොනැමූ පාලකයෙකුට අත් වන ඉරණම මේ හේතුවෙන් ගෝඨාභය ජනාධිපතිවරයාටත් අත්වූ බව පැවසීය. මේ රටේ සිටින සමාන්‍ය ජනතාවට මේ හේතුවෙන් අලුත් දේශපාලනික අත්දැකීමක් විදීමට අවස්ථාව ලැබුණු බව පවසා සිටි එතුමා අද දින සභාවේදී ප්‍රාදේශීය දේශපාලඥයන් ස්වේච්ඡා සේවයක් ලෙස සලකා මේ කාර්යේ නිරත වන බව පවසා සිටියේය. අද දින සභාවේදී ප්‍රකාශ වූ අදහස් අතර ධනවතුන්ට පමන්ක ක්‍රියාකාරී දේශපාලනයට ඒමට අවස්ථාව දිය යුතු බවට ප්‍රකාශ වූ බවත් එම මතවාදය ඒ ආණ්ඩු පක්ෂ දේශපාලන කඳවුරේ මතයක් පමණක් බවත් පැවසීය. එහි ප්‍රතාඵලයක් ලෙස අද වන විට එම දේශපාන පක්ෂය ජනතාවගෙන් ප්‍රතික්ෂේප වී ඇති බවත් දේශපාලනයේදී සියළුම මට්ටම් වල පුද්ගලයන් එයට සම්බන්ධ විය යුතු බවට තමන් විශ්වාස කරන බව පවසා සිටියේය. මේ සභාව නියෝජනය කරන ෆර්හාන් මැතිතුමා වෘත්තියෙන් කුලී රථ රියදුරෙක් ලෙස කටයුතු කළ බව එතුමාගේ කතාවේදී පැවසූ බව සිහිපත් කළ එතුමා නමුත් මැතිවරණයේදී මහජන ඡන්දයෙන් මේ සභාව නියෝජනය කිරීමට එතුමාට හැකියාව ලැබී තිබීමම මෙයට හොඳ උදාහරණයක් බව පවසා සිටියේය. ඒ ආකාරයට පොඩි මිනිසාගේ දුක හඳුනන පුද්ගලයන්ද මේ ආයතන වලට තේරී පත් විය යුතු බවත් නොඑසේනම් ධනපතීන් විසින් ඔවුන්ගේ සමාජ තලයේ මිනිසුන්ගේ අවශ්‍යතා සහ ඔවුන්ගේ ප්‍රශ්න විසඳා ගැනීම පිළිබඳව පමණක් අවධානය යොමු කරන බව පවසා සිටින ලදී. එසේම මේ සභාවේ සිටින සියළුම මන්ත්‍රීවරු සියළුදෙනාම මේ ස්ථානයට පැමිණීමේ පරමාර්ථය ජනතාවට සේවය කිරීම බවත් ආණ්ඩු පක්සයේ මන්ත්‍රීවරු පමණක් එසේ කරනවා යැයි සිතන්නේ නම් එය බලවත් වරදක් බවත් ආණ්ඩු බලය නොමැති විට විපක්ෂයේ සිට හෝ අදාල කර්තව්‍ය අප විසින් සිදු කරන බව පැවසීය. විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට බොහෝ අවස්ථා වලදී වීථි පහනක් දමා ගැනීමට හෝ හැකියාව නොමැති බවත් ජනතාව වෙනුවෙන් ගෙන එන යෝජනාවක් න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීමට හෝ අවස්ථා ලැබෙන්නේ ඉතාමත් අල්ප වශයෙන් බව පැවසීය. තමන් මේවා ප්‍රකාශ කරන්නේ කිසිවෙකුට චෝදනා කිරීමට නොවන බවත් නමුත් විපක්ෂයේ සිටින විට හිමි වන තත්වය එය බැවින් තම අවශ්‍යතා ඉටු කර ගැනීමට නම් අප ආණ්ඩු පක්ෂයට පත් කර තැබීම ජනතාව විසින් සිදු කල යුතු බවත් පෙන්වා දෙන ලදී. අප නියෝජනය කරන දේශපාලන ධාරාව එක්සත් ජාතක පක්ෂය බවත් එහි කොටසක් ලෙස සමඟි ජන බල වේගය හඳුන්වා දිය හැකි බව පැවසූ එතුමා ඉදිරියේදී මේ පක්ෂ දෙක එකතුව යම් වැඩපිළිවෙලකට යනු ඇතැයි අපේක්ෂා කරන බව පවසා සිටියේය. වර්තමානයේ මේ ආණ්ඩුවේ ක්‍රියා කලාපය විවේචනය වන සෑම මෙහොතකම බොහෝ අය පවසන්නේ මේ හුදෙක් මේ රජයේ වරද පමණක් නොව වසර 74ක සාපය මේ සඳහා හේතු වී ඇති බවත් එසේ නම් වසර 30 කට පමණ පසුව අනාගතයේදී ඉපදෙන දරුවෙක් එක්තරා කාලයක මේ රටේ ගෝඨාභය රාජපක්ෂ නමින් පාලකයෙකු සිටි බවත් ඔහුගේ සහෝදරයා මේ රටේ අගමැති ලෙස කටයුතු කළ බවත්

දේශීය ආර්ථිකයක් ගොඩනැංවීමේ අරමුණින් ඔහු විසින් විදේශීය භාණ්ඩ ආනයනය සීමා කරමින් මූලික වී කටයුතු කළ බවත් නමුත් ඒ කාලයේ සිට මිනිසුන් එතුමාට ඒ යහපත් ක්‍රියාවලිය සිදු කිරීම සඳහා ඉඩ ලබා නොදී අරගලයක් සිදු කර ඔහු බලයෙන් පහ කර දැමූ බවට ප්‍රකාශ කළහොත් වර්තමාන සිදුවීමේ සත්‍ය කතාව එයද යන්න විමසා සිටියේය. ඒ අනුව යම් සිදු වීමක සත්‍යතාව වඩාත් හොඳින් දන්නේ වර්තමානයේ එම සිදු වීමට මුහුණ දුන් පිරිස පමණක්ම බවත් එබැවින් 78 ට පෙර සමෘද්ධිමත් යුගයක් පැවති බවට  වර්තමානයේ සිටින පිරිස් ප්‍රකාශ කිරීම යෝග්‍ය නොවන බවත් ඒ කාලයේ සිදු වූ සිදු වීම් හේතුවෙන් ජනතාව තම පීඩනය පිට කරන ලද්දේ එම පාලිකාව බලයෙන් නෙරපා අඩු තරමින් විපක්ෂ නායකමත් දකුණට අහිමි වී ගිය බවත් අමිර්තලිංගම් මහතා විපක්ෂ නායක තනතුරට පත් වූ බවත් පෙන්වා දෙන ලදී. මේ රජය සැම විටම සිදු කළේ ලංකාවට නොගැලපෙන මහා පරිමාණ ව්‍යාපෘති බවත් එහි අවසන් ප්‍රතිඵලය ලෙස එම නායකයින් ජනතාව අතුරින් අද වන විට ප්‍රතික්ෂේප වී ඇති බව පෙන්වා දෙන ලදී. 1978 ජනතාවගෙන් ප්‍රතික්ෂේප වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියට නැවත වරක් කිසිදාක මහජන ඡන්දයෙන් බලයට පැමිණීමට නොහැකි වූ බවත් වර්තමානයේ රාජපක්ෂවරුන්ට සිදු වී ඇත්තේද මෙයමම බව පවසා සිටියේය. රනිල් වික්‍රමසිංහ මහතා සම්බන්ධයෙන් කතා කිරීමේදී එතුමා තමන් පෞද්ගලිකව ගරු කරන මේ රටට විශාල සේවයක් සිදු කළ දේශපාලඥයෙකු බව පැවසිය. නමුත් මෙවර මෙවර හිටපු අගමැති මහින්ද රාජපක්ෂ මහතාට මැයි 09 වෙනි දින ජනතාවගෙන් සිදු වූ බලපෑම හේතුවෙන් සිය තනතුරෙන් ඉවත් වීමට සිදු වූ අවස්ථාවේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාටත් ඒ තර්ජනය මහජනතාවගෙන් ඒ අයුරින්ම එන විට ඉන් බේරීම සඳහා  විකල්ප නොමැති අවස්ථාවේ පළිහක් ලෙස රනිල් වික්‍රමසිංහ මහතා යොදා ගත් බව පෙන්වා දුන්නේය . මෑත දිනයකදී තමන් මේ තනතුර භාර ගත්තේ ජනතාව විඳින දුක දෙස බලා ඔවුන්ට යම් සහනයක් වීමේ අරමුණින් බවට රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කළ බවත් ඇතැම් විට එය සත්‍ය විය හැකි බවත් නොඑසේ නම් තමන්ට තවත් කුමන හෝ වෙනත් අරමුණක් සාක්ෂාත් කර ගැනීමට තිබීම මත මේ තනතුර ඔහු විසින් භාර ගත්තා විය හැකි බවද පෙන්වා දුන් එතුමා නමුත් අගමැතිවරයා ලෙස එතුමාට කටයුතු කිරීමට හැකි වූයේ මාසය දෙකකටත් අඩු කාලයක් බව පැවසීය. එම කාලය තුළ ගෑස් අර්බුදය සඳහා යම් විසඳුමක් ලබා දීමට එතුමා උත්සාහ ගත් බවත් ලෝක බැංකුවෙන් ඩොලර් මිලියන 70ක් ලබාගෙන අප රටින් ඩොලර් මිලියන 30ක් යොදවා ඩොලර්  මිලියන 100 කින් ගෑස් මෙට්‍රික්ටොන් ලක්ෂයක් ගෙනවිත් ඇති බව පැවසීය. ඊට වඩා කාර්යන් සිදු කිරීම ප්‍රමාණවත් කාලයක් එතුමාට නොලැබුණා සේම එතුමා මේ සියල්ල සිදු කළ යුතු වන්නේ පොදු ජන පෙරමුණේ  මන්ත්‍රීවරුන් සමඟ බවත් තනි මන්ත්‍රී ආසනයක් පමණක් පාර්ලිමේන්තුවේ රදවාගෙන මේ සිදු කර ක්‍රියාවලිය සිදු කිරීමට රනිල් වික්‍රමසිංහ මහතාට සිදු වී ඇති බව පෙන්වා දෙන ලදී. එතුමා යමක් සිදු කරනු ඇති බවට ජනතාවට විශ්වාසයක් පවතින බවත් නමුත් එතුමා මේ අවස්ථාවේදී රාජපක්ෂවරු ආරක්ෂා කිරීමට ක්‍රියා කරනවාය යන මතය ජනතාව තුළ ගොඩනැඟුණු බවත් ඒ හේතුවෙන් ජනතා විරෝධයක් එතුමා වටා නිර්මාණය වූ බව පවසා සිටියේය. එසේම අරගලයේ හිමි කරුවෝ තමන් යැයි කියා ගන්නා පිරිසක් මේ වන විට නිර්මාණය වී ඇති බවත් අරගලය සම්බන්ධයෙන් ලෙනින් විසින් සිදු කර ඇති ප්‍රකාශයේ අරගලයකදී මිනී මැරෙන්නට හැකි බවත් ස්ත්‍රී දූෂණ සිදු විය හැකි බවටත් සොරකමු , මංකොල්ලකෑම් ආදී සිදුවීම්ද සිදු විය හැකි බවට පවසා තිබෙන බව පෙන්වා දෙන ලද. නමුත් අරගලයේ පරම අරමුණ ස්වාධීන බවට ලෙනින් විසින් සිදු කළ ප්‍රකාශය සත්‍ය බවත් මේ සඳහා සහභාගී වන සියළු දෙනාම විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබා ගත් උගත් බුද්ධිමත් පිරිසක් නොවන බවත් විවිධ අධ්‍යාපන පසුබිම් වල සිටින පුද්ගලයින් ඒ සඳහා සහභාගී වන බවත් පේනවා දෙන ලදී. තලෙයිබාන් වරු බලය අල්ලා ගැනීමේදී එම අරගලයේ නායකයා පැමිණ තමන් මෙහි නායකයා බව පැවසී පසු ත්‍රිවිධ හමුදාව සහ රාජ්‍ය නිධාරීන් පත් කර ගෙන ඉදිරි වැඩ කටයුතු සිදු කරගෙන ගිය බව සිහිපත් කළ එතුමා එම නිසා අරගලයේ හිමිකරුවන් ලෙස පවසමින් මේ ජයග්‍රහනය ලබා ගැනීමට යමෙකු උත්සාහ දරන්නේ නම් එය සිදු නොවිය යුතු බව පැවසීය.එම නිසා අරගලයේ නියම හිමිකරුවන් යැයි කියා ගන්නා පිරිසක් සිටිය යුතු නැති බවත් පැවසීය. මිනිසුන්ට පීඩනය දැනුන අවස්ථාවේදී අරගලය ආරම්භ වූ බවත් එයට බොහෝ පක්ෂ සහය ලබා දුන් බවත් පැවසීය. එම නිසා සියළු දේශපාලන පක්ෂ නියෝජනය වන ආකාරයට මිනිසුන් එදා අරගලයට සහභාගී වූ බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා:**

තමන් අසනීප තත්වයෙන් පසු වුවත් මේ අවස්ථාවේදී තමන්ද යම් කරුණක් ප්‍රකාශ කළ යුතු බවට අදහස් කරන බව පැවසීය. අද වන විටත් ඇතැම් පිරිස් 74 වසරක සාපයක් පිළිබඳව පවසන බවත් විවෘත ආර්ථිකය මේ රටට හඳුන්වා දී නොතිබුණි නම් අද මේ මහා සභා රැස්වීමට පැමිණ සිදු වන්නේ කරත්ත වලින් බව පැවසීය. රටක් ලෝකයන් සංවර්ධනය වී ඉවිරියට යන අවස්ථාවේදී විවෘත ආර්ථිකයට රටට හුදුන්වි දි නොතිබුණා අප රටට සිදුවන්නේ එකතැන පල් වීමට බවත් පවසා සිටියේය. එම නිසා මෙය 74 වසරක සාපයක් නොවන බවත් මෙය රාජපක්ෂ වරුන් විසින් ඇති කරන ලද ශාපයක් බවට තමන් පවසන බව ප්‍රකාශ කර සිටියේය. ගමක මරණාධාර සමිතියක හෝ වෙනත් ස්වේච්ඡා සංවිධානයක වුවත් එකම පවුලේ කීපදෙනෙකු එහි තනතුරු හෙබවීම සිදු නොකරව බවත් නමුත් අද වන විට අප රටේ ජනාධිපති, අගමැති , මුදල් ඇමති ආදී තනතුරු සියල්ලම එකම පවුලක් වටා කේන්ද්‍ර ගත වූ බවත් එක පවුලක් සිදු කරන ලද අපරාධයක් හේතුවෙන් අද වන විට මේ රටේ කෝටි දෙකකට වැඩි ජනතාවක් දුක් විඳින බව පෙන්වා දෙන ලදී. සර්ව පාක්ෂික රජයක් පිහිටුවීම සුදුසු බවට අද දින මේ සභාවේදීත් යෝජනාවක් සම්මත වූ බවත් ඉදිරියේදී කුමන රජයක් පත් වුවත් මේ රටේ ජනතාවගෙන් සොරාගත් ධනය නැවත මේ රටට ගෙවිත් ජනතාවට ලබා දිය හැකි නායකයෙකු ඉදිරියේදී පත් විය යුතු බවට තමන් විශ්වාස කරන බව පැවසූ එතුමා එවැනි ඍජු තීරණයක්ගත නොහැකි නායකයෙකුගෙන් මේ රටට වැඩක් නැති බව තමන්ගේ අදහස බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අදහස් දැක්වූ සියළුම මන්ත්‍රීවරුන්ට ස්තුවන්ත වන බවත් අද දින මේ සභාවේදී යෝජනාවක් ලෙස ඉදිරිපත් වූ සර්ව පාක්ෂික ආණ්ඩුව ඉදිරියේදී බිහි වී මේ රටේ ජනතාවට සහනයක් ලබා ගෙන ජීවත් විය හැකි පරිසරයක් මේ රට තුළ ගොඩනැඟිය යුතු බවට තමන්ද විශ්වාස කරන බව පවසා සිටියේය. 06 වෙනි සභා වාරය ආරම්භ වී තමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලය මේ සභාවට තේරී පත් වූ මුල් කාලයේදී යහපාලන රජයක් මේ රට තුළ පැවති බවත් එම රජය යටතේ වසර දෙකක කාලයක් කටයුතු කිරීමට සිදුවූ බවත් පැවසීය. සභාවක් ලෙස අප උපයා ගන්නා ආදායම් ඒවන විට වියදම් කිරීමට සිදු වූ බවත් ඇතැම් අවස්ථා වල වීථි ලාම්පු ගෙන ඒමට හියුම් පයිප්පයක් මිලදී ගැනීම වැනි කාරණා වලදී ඒවා සිදු කිරීමට හැකියාවක් නොවූ බවත් ඉන් පසු කොරෝනා රෝග ව්‍යාප්තිය සිදු බැවින් සභාව බලාපොරොත්තු වූ බොහෝ කරුණු සිදු කර ගැනීමට නොහැකි වූ බවත් පවතින මුදල් කළමනාකරණය කර ගනිමින් එය සිදු කිරීමම අප ලද ජයග්‍රහනයක් බව පවසා සිටින ලදී. එසේම කොරෝනා ව්යාප්තිය සමඟ නැවත සියළු කටයුතු ඇණ හිටීමට ලක් වූ බවත් පැවසූ එතුමා නමුත් කොරෝනා වසංගත තත්වය අවස්ථාවේ බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍යාරක්ෂාව වෙනුවෙන් අපරිම සේවාවක් සැලසීමට සභාවට හැකි වූ බව පැවසීය. මන්ත්‍රීවරුන් දුකථන මාර්ගයෙන් හෝ කොරෝනා ආසාධිත රෝගීන් පිළිබඳව දන්වූ විට ඔවුන් රෝහල් කරා රැගෙන යාමට පමණක් නොව වසම් මට්ටමින් බඩු බෙදාදීම් ආදී කාර්යන් සඳහාද උපරිස දායකත්වය ලබා දුන් බව පවසා සිටියේය.සාර්ථක ලෙස එන්නත්කරණය අවසන් කළ අතර මහා පරිමාණයේ ව්‍යාපෘති සඳහා රජයෙන් ප්‍රතාපදෙන ලැබිම අවම මට්ටමක පැවති කාල සීමාවේදී ලැබුණු ප්‍රතිපාදන වලින් හැකි උපරිම සේවාවක් ලබා දීමට කැප වී ක්‍රියා කළ බව පෙන්වා දෙන ලදී. අද දින මන්ත්‍රීවරයෙකු විසින් වාමාංශික දේශපාලනය දැඩි ලෙස විවේචනය කළ බවත් ඒ සඳහා තමන් විසින්ද පිළිතුරක් ලබා දිය යුතු බව පැවසූ එතුමා තමන් වාමාංශික උරුමයෙන් එන පවුලකින් පැවත එන අයෙකු වශයෙන් ලාභ අපේක්ෂාවකින් තොරව රට වෙනුවෙන් යුතුකම් ඉටු කිරීම සඳහා සුදානමින් සිටින බව පවසා සිටියේය. තමන් දේශපාලනයෙන් කිසිවක් උපයා නොගත් බවත් සභාපතිවරයා ලෙස පත් වන විට තමන් සතුව තිබූ පෞද්ගලික කැබ් රථය විකුණා සියනිවස සාදා ගත් බවත් හොට මේ සභාව විසුරුවහොත් තම නිල රථය සභාවට භාර දී යතුරුපැදියෙන් හෝ නිවසට යාමට තමන් සූදානම් බවත් පැවසීය. එම නිසා තම පෞද්ගලික ගිණුම් වල ශේෂය තිබුණිටත් වඩා අඩු වී ඇති බවත් කිසි විටෙක රාජ්‍ය මුදල් දේශපාලන බලය උපයෝගී කරගෙ අවභාවිතා කර නැති බව වගකීමෙන් ප්‍රකාශ කළ හැකි බව පවසා සිටින ලදී. මේ කාලසීමාව තුළ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය මෙන්ම කාරක සභා නියෝජනය කරමින් සියළුම මහජන නියෝජිතයන්ද සිය උපරිම සහයෝගය තමන් වෙත ලබා දුන් බව පැවසූ එතුමා විවේචන තර්ක

විතර්ක මැදින් යහපත් තීන්දු තීරණ ගැනීමට හැකියාව උදා වන බව පවසා සිටියේය. අද දින පරසර හා පොදු පහසුකම් කාරක සභාවේදී පරීක්ෂා කළ බවට සඳහන් කරන ගද ස්ථානය පිළිබඳ සිදුවීම එදින කාරක සභාව එම ස්ථානයට නොගියා නම් අද වන විටත් කිසිවෙකු නොදන්නා බවත් උපරිම විනිවිද භාවයෙන් ඒ කාර්යන් සිදු කිරීමට අවස්ථාව ලබා දී තිබීම හේතුවෙන් මේ තොරතුරු අනාවරණය කර ගැනීමට ලැබුණු බව පැවසීය. වාමාංශික දේශපාලන කඳවුරක් ලෙස අද වන විට රජයේ යම් යම් අඩු පාඩු අපද දකින බවත් අගය කළ යුතු දෑ අගය කරනවා සේම විවේචනය කළ යුතු දෑ විවේචනය කිරීමටද අප පසුබට නොවන බව පැවසූ එතුමා කොරෝනා කාල සීමාව තුලදී  මුළු රටම ඉතාම අපහසුවෙන් ගත කළ බවත් ඒ කාලයේදී  ජීවිත දහස් ගණනක් රැක ගැනීම සඳහා මේ රාජය කැපවී ක්‍රියා කළ ආකාරයත් අමතක නොකළ යුතු බව පෙන්වා දෙන ලදී. එම නිසා යම් යම් දුර්වලකම් දකින විට ඒවා විවේචනය කළත් වාමාංශික කඳවුරේ දේශපාලනයෙන් ඉවත් වීමක් සිදු නොවන බවත් නමුත් අනාගතයේ හොඳ නායකයෙක් පැමිණියහොත් ඒ අවස්ථාවේදී වාමාංශිකද දක්ෂිණාංශිකද කියා නොබලා උපරිම සහය ලබා දෙන බවත් ඉදිරි දින වලදී සර්ව පාක්ෂික රජයක් බිහි වූවහොත් ඒ සඳහාද දහාපතිවරයා ලෙස තමන්ද ආණ්ඩු පක්ෂයද ඒ රජයට ඉදිරි වැඩකටයුතු සිදු කරගෙන යාමට උපරිම සහය ලබා දෙන බව පවසා සිටින ලදී. මේ කාල සීමාව තුළ නොයෙකුත් අභියෝග මැද මේ ගමන ගිය බැවින් සභාවක් ලෙස විශාල ව්‍යාපෘති සිදු කිරීමට නොහැකි වූ බවත් මන්ත්‍රී මණ්ඩලයේ 34 දෙනෙකුට සහ සේවා ගිවිසුම් මත සේවය කරන කාර්ය මණ්ඩලයේ 28 දෙනෙකුට සභා අරමුදලින් වැටුප්  හා දීමනා ලබා දෙමින් මේ කාර්ය පවත්වාගෙන ආ බවත් සභා අරමුදල සතුව ඇත්තේ ජනතා බදු මුදල් බවත් පැවසූ එතුමා මේ වන විට ඇති ආර්ථික ගැටළු හමුවේ ජනතාවගෙන් බදු අය කර ගැනීමේ දුෂ්කරතාද තිබෙන බවත් ඒ සියල්ල කළමනාකරණය කර ගනිමින් මේ කාර්ය සිදු කරගෙන යන බවත් පවසා සිටියේය. ඒ නිසා තමා ධුරයෙන් ඉවත් වුවද අනාගතයේ දිනක සභාපති තනතුරට පත් වන්නේ මේ පිරිස අතුරින් අයෙකු බැවින් මේ කාර්යන් සම්බන්ධයෙන් අධ්‍යානයෙන් සිටින ලෙසත් මේ අභියෝග ඉදිරියේදී පත්වන නායකයන්ටද යම් තාක් කාල සීමාවකට මුහුණ දීමට සිදුවන ඒවා බව පවසා සිටින ලදී.

දිනයට නියමිත කරුණු සාකච්ඡා කර අවසන් බැවින් අද දින මහා සභා රැස්වීම අවසන් කරන බවත් මී ළඟ මහා සභා රැස්වීම 2022 අගෝස්තු මස 09 වෙනි දින පෙ:ව: 09.30 ට ප්‍රාදේශීය ෂභා කාර්යාලයේදී පැවැත්වෙන බව ප්‍රකාශ කරමින් එදින ප:ව: 01.01 ට මහා සභා රැස්වීමේ කටයුතු අවසන් කරන බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද,
සභාපති,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.